
පෙම් කැදැල් සීතලයි
මනෝරි සිලිකා වික්‍රමආරච්චි

පෙම් කඳුළු සීතලයි
සුනේත්‍රා තුෂාරි ඩයස්

ප්‍රථම මුද්‍රණය 2000 නොවැම්බර්
දෙවන මුද්‍රණය 2005 දෙසැම්බර්
තෙවන මුද්‍රණය 2010 නොවැම්බර්
**ISBN** 955 97224 1 7

පරිගණක අකුරු සංයෝජනය පැහැසර පබ්ලිකේෂන්ස්
280/ **A** / 1,
බටදොඹතුඩුව පාර,
අළුබෝමුල්ල, පානදුර.

මුද්‍රණය සහ ප්‍රකාශනය පැහැසර පබ්ලිකේෂන්ස්
280/ **A** / 1,
බටදොඹතුඩුව පාර,
අළුබෝමුල්ල, පානදුර.

# පෙම් කඳුළු සීතලයි

සුනේත්‍රා තුෂාරි ඩයස්

කර්තෘගේ වෙනත් කෘති

| | | |
|---|---|---|
| නවකතා : | පෙම් කඳුළු සීතලයි | (2000) |
| | පූජනීයයි ආදරේ | (2006) |
| | සඳ ඔබ මගේ | (2010) |
| | කුංකුම තිලක | (2010) |
| | අහසින් තරුවක් | (2011) |
| | රෝස සුවඳයි ආදරේ | (2013) |
| | සිනාසෙන් සරාසඳ | (2013) |
| | එකවගෙයි අහසයි ඔබයි | (2013) |
| | වසුන්දරා 01 | (2014) |
| | මතක සිතුවම් | (2014) |
| | අමන්දා | (2015) |
| | තරුනෙතු සිත්තම් | (2016) |
| | සඳ තරු මල් | (2016) |
| | වසුන්දරා 02 | (2018) |
| | ආදරණීය 89 | (2018) |
| | පුන්සිසි | |

(2018)

| | | |
|---|---|---|
| කාව්‍ය : | සකුණ නිම්නය | (2002) |
| ළමා : | රචනා අත්වැල | |

(2003)

## තුති පුද...

**පෙම් කඳුළු සීතලයි** නවකතාව හිමරෝස පුවත් පතේ කොටස් වශයෙන් පළවූ නවකතාවකි. මට ඕනෑ හැටියට ලියන්නට නිදහස දුන් එදවස එහි ප්‍රධාන කර්තෘ ආසිරි වනිගරත්න ට මගේ පළමු ස්තුතිය හිමිවේ. එසේම කර්තෘ ප්‍රකාශනයක් ලෙස එළිදුටු මෙහි ප්‍රථම මුද්‍රණය එකහිතින් බාරගෙන පිටපත් දහසකටත් වැඩි ප්‍රමාණයක් මුද්‍රණය කරදුන් අනුර ග්‍රේරෝ මහතා හා ඔහුගේ බිරිඳ පුෂ්පා ග්‍රේරෝ මහත්මියත් ආදරෙන් සිහි කරමි.

එසේම, මෙහි දෙවෙනි මුද්‍රණය සහ තෙවෙනි මුද්‍රණය ප්‍රකාශයට පත් කළ නිශාන්ත ප්‍රකාශන අධිපති නිශාන්ත වික්‍රමතිලක සොහොයුරාටද මගේ හදපිරි ස්තුතිය හිමිවේ.

ලියන්නට හරි හැටි නොදත් දා ලියන්නට අත හුරු කළ ප්‍රදීප් කුමාර බාලසූරිය සොහොයුරාටත්, උපාලි බණ්ඩාර වීරසේකර සොහොයුරාටත් මගේ ගෞරවය පුද කළ යුතුමය.

ඉතිං... අද මේ ලියන වෙලාවේ ස්තුති කරන්නට බොහෝ දෙනා සිටී. නම් වශයෙන් ලියන්නට ගියොත් පිටු දහයක්වත් ලියැවෙනු ඇත. එහෙම නොලියා මම මෙහෙම කියමි. වචනයකින් හෝ මට උදව් කළ ඔබ... මගේ යහළු යෙහෙළියන්... මගේ ගුරුවරුන්... මගේ දෙමව්පියන් සහෝදරයන්... මගේ ආදරණීය ධනූ... පැහැසර පුතු... රන්සලා මගෙ දෝණි.... ඔබටයි මේ තුති පිදුම... මට දිරි දුන්නාට...

සුනේත්‍රා තුෂාරි ඩයස්
280/ **A** / 1, බටදොඹතුඩුව පාර,
අළුබෝමුල්ල,
පානදුර.
0770 695710

## මේ ඔබ වෙනුවෙනි...

වෙන කව්රු වෙනුවෙන් ලියන්නෙම්ද...
මෙහි තෙවෙනි මුද්‍රණය තෙක්
මා රැගෙන ගිය පාඨක ඔබට හැර...

හීන් හිරිපොද වැටෙන
හැන්දෑව හීතලයි
ඒත්...
කඳුළු උණුහුමයි...
ඒදා කම්මුල් පුරා දඟපාපු
නුඹෙ දෙතොල් පෙති වගේ
මගෙ සුසුම් ගිනියමයි...
හිතේ කොහේවත් තිබුණෙ නැති
ආදරේ අවදිකළ
ඔබේ ඇස්වලට තව ආදරෙයි...
අනේ, මේ බොරු නෙවෙයි
සුදු පිච්ච මල් වලට
තාම මං මහ හුඟක් ආදරෙයි...
මගෙ හිතේ පෙම් කඳුළු සීතලයි...

# 01

**මම** පුදුමාකාර වේගයකින් වැට කඩුල්ලෙන් පැන වත්තට ඇතුළු වුණෙමි. සීරුවට මැද්ද සුදු ගවොමේ රැළි එහෙ මෙහෙ වෙන්නට ඇත්තේ ද සුළඟේ තාලයට නොව මගේ ගමනේ වේගයටය. මඳ දුරක් ගිය මම උඩ පැන පාත් වී තිබූ කොට්ටම්බා කොළයක් කඩා ගත්තෙමි. තවත් ටික දුරක් ගොස් පාර මැද්දේ නිදා උන් 'කිටී' ට හෙමීට පා පහරක් ගැසුවෙමි.

"දෝ...ණී..."

මා හිස ඔසවා නිවෙස දෙස බැලුවේ එවිටය. උස්ව නැඟුණු හඬ අප්පච්චිගෙ ය. මට ලැජ්ජා සිතිණි. ඒ පුංචි එකියක සේ දඟවැඩ කළාට නොවේ. ඒවා අප්පච්චී දුටු නිසාය.

"පුංචි දරුවෙක් කියල හිතාගෙනද උඩ පනින්නෙ... දඟලන්නෙ... දැං කීයක් වෙනවද වයස..."

"අප්පච්චිට වැඩිය තිස් පහයිනෙ අඩු... දහ නවයයිනෙ..."

මම කියෙව්වෙමි. අප්පච්චි ඇස්බැමි ඉස්සුවේ තරහින් නම් නොවේ. ඒත්, මගේ පණ්ඩිත කතාවට නැගෙන්න ආ සිනාව නම් ඔහු ආයාසයෙන් හංගා ගත්තේය. මම පොත් ටික පුටුවක් උඩින් තබා අප්පච්චි පිටුපසින් ගොස් ඔහුගේ ගෙල බදා ගත්තෙමි.

"අප්පච්චි..."

"මොකෝ මේ... නාකි හුරතලේ..."

"මං විභාගෙ පාස්..."

"අර කිව්වත් වාගෙ මට ඒක අමතක වුණාම නෙව... කොහොමද මගෙ පුතේ... මොනවය ප්‍රතිඵල..."

"ඒ එකයි... බී දෙකයි... සී එකයි... සිංහල වලට ඒ... නැටුම් වලටයි ඉකෝන් වලටයි බී... ලොජික් වලට සී..."

"කැම්පස් තේරෙයිද?"

"ලකුණු වැඩිත් වෙයි මයෙ අප්පච්චි..."

"හරි... දැං ගිහිං අම්මටත් කියල එන්න... අපි හවස යං කළුතර බෝධි... මයෙ පුතාගෙ විභාගෙට වෙච්චි බාරෙ ඔප්පු කරල එන්න..."

මම එක පිම්මට කුස්සියට දිව්වෙමි. මගේ අඩි හඬටදෝ ලිප ළඟට වී හොද්දක් හැඳිගාමින් උන් අම්මා ආපිට හැරුණාය. මම ඈ අතේ එල්ලී ගෙන විභාග ප්‍රතිඵල කීවෙමි. අම්මා දෑසට උනා ආ කඳුළු ගවුම් අතින් පිසදා ගත්තී හිනැහී ම'හිස පිරිමැද දාය.

"අම්මා... අප්පච්චි කිව්ව හවස කළුතර බෝධි යං කියල..."

"ඇති යන්තං එයාට එහෙම එකක්වත් මතක් වුණා..."

අම්මා කියන්නී මවාගත් අමනාපයකිනි. විදුහල්පතිවරයෙකු වූ මගේ අප්පච්චී පාසල් යන කාලයම කැප කළේ පාසලත්, සිසු දරුවනුත් වෙනුවෙනි. දැන් විශ්‍රාමිකව කල් ගෙවුණද ඔහු සතියේ දින පහක් ගමේ දුප්පත් ළමුන්ට අමතර පංති පවත්වයි. ඒ ද සත පහකුදු අය කරගෙන නොවේ. නොමිලේය. විටෙක මට අප්පච්චී ගැන පුදුම හිතේ. ඔහු මට පමණක් නොවේ. අම්මාට ද සලකන්නේ ඔහු යටතේ ඉගෙන ගන්නා දරුවන්ට සේය. ඒ වගේම ආදරෙනි.

"දෝණි... මල් ටිකක් කඩාගෙන ආවනං..."

අප්පච්චී කීවේ බට පතුරු මල් වට්ටිය මා අතට දෙන අතරේය. මම ගැටය බුරුල් කළ ටයි පටිය හිසෙන් පන්නා එය පුටුවක් උඩට වීසි කළෙමි. මට එය එතරම් ගණනක් නොවීද අප්පච්චිට නම් එය මහා වරදකි.

"මේ දරුවනං... ජීවිතේට ඉගෙන ගන්නෑ පිළිවෙලකට වැඩක් කරන්න..."

අප්පච්චි කියවයි. මම සපත්තු ගලවා දමා සුදු ගවුම පිටින්ම වත්තට දුවමි. නිරුවත් දෙපයට තණකොළ පෑගෙද්දී දැනෙනුයේ පුදුමාකාර තරම සුවයකි. මම මද වේලාවක් තණ බිස්සේ එහා මෙහා ඇවිද්දෙමි. ඒත්, තවත් පමා විය යුතු නොවේ. හනික බෝධි යන්න මල් කැඩිය යුතුය. මම වට පිට බලා ලොකු අරලිය ගහට නැග්ගෙමි. අප්පච්චි කීවේ කෝටුවකින් මල් කඩන්නටය. මා ගස් නගිනවාට ඔහු එතරම් කැමති නැත. ඒත්, මගේ හිත තවම දඟය. ඒ දඟ හිත තවත් මට කරන්නට කියන්නේ දඟකාරකම්ය.

"ෂ්... ෂ්..."

මල් කිනිති කිහිපයක් කඩාගෙන ගසෙන් බසින්නට හැදුවා පමණි. මොකක්දෝ හුහුරු හඬක් ඇසිණි. මම හාත්පස බැලීමි.

"ෂ්... ෂ්..."

ආයෙමත් ඒ හඬමය. මගේ දෙපා වෙව්ලන්නට ගත්තේ බියටය. මම කැඩූ මල් කිනිති කීපය අතැර දමා ගසින් බිමට පැන ගේ ළඟටම දිව්වෙමි.

"මොකෝ... මයෙ පුතේ..."

අප්පච්චිට හිඳ උන් පුටුවෙන් නැගිටුණේ ඉබේටමය. මම තවත් වරක් අරලිය ගස ඇති ඉසව්ව දෙස බැලුවෙමි.

"මොකද වුණේ..."

"හරි වැඩේනෙ අප්පච්චි... මං මල් කඩ කඩා ඉන්නකොට මොකෙක්ද එකෙක් හූස් හූස් ගෑවා... මං හිතුවෙ නයෙක්වත්ද කියලා... කඩපු මල් ටිකත් දාල මං දිව්වෙ ඒකයි... තව පොඩ්ඩෙන් ගහෙනුත් වැටෙනව..."

"හොඳ වැඩේ ගස් නගින්න ගියාට... නයෙක් නෙවෙයි පිඹින්න ඇත්තෙ... එහා පාරෙ ගියපු නොසංඩාල කොල්ලෙක් වෙන්නැති..."

අප්පච්චි මල් වට්ටිය ගේන්නට ගියේය. මම ඉස්තෝප්පුවේ පඩිය උඩින් වාඩි වී සිදු වූ දේ ගැන හිතන්නට වුණෙමි. ඇත්තටම ඒ කොල්ලෙක් නම්, අනේ මට ඌට හොඳ පාඩමක් උගන්වන්නට තිබුණා නොවේද?

"ෂි...ට්..."

මට කියැවිණි. බෝධි යන්නට සූදානම් වෙද්දී වුවද මට මතක් වුණේ අරලියා ගහ ළඟදී ඇසුණු ඒ හඬය. ගෙදරින් මඟට බැස එද්දී ද ඒ හඬ මගේ හිතට දැනිණි. කෙසේ හෝ අම්මාගෙනුත්, අප්පච්චිගෙනුත් මගේ හිතේ පෙරළි කරන ඒ අකීකරු තිගැස්ම හංගන්නට නම් මට හැකිවිණි. එය එසේ වුණේ බෝධිය ළඟට යන තුරුම මා ගිරවියක සේ අප්පච්චී හා දෙඩූ නිසා වෙන්නට ඇත. විටෙක හිනා වෙවී විටෙක බොරුවට තරහ වෙවී... රණ්ඩු වෙවී... හැන්දෑ වෙන්නට ඉස්සරින් අපි කළුතර බෝධිය ළඟට ගියෙමු. අම්මා බෝමළුව අතුගාද්දී අප්පච්චි මල් මාලා කීපය බෝ අත්තක එල්ලුවේය. මම පැන් කල හතකින් බෝධිය නැව්වෙමි.

"එන්න දෝණි මල් පහන් පූජා කරන්න..."

අම්මා මල් බෑගය මා අතට දී ඉස්සර වුණාය. මල් පහන් පුදා අහවර අම්මාත් අප්පච්චීත් පැයක් පමණ පසෙකට වී ගාථා කියයි. මා එසේ නොවේ. මා කරන්නේ හනිකට ගාථා කියා අහවර වී පන්සලේ තාප්පය ළඟ හිඳ කළු ගඟ දෙස බලා හිඳීමය. පෝය දවසක් නොවූ නිසාදෝ අද පන්සලේ සෙනඟ අඩුය. එය එසේ වීම හොඳ යැයි විටෙක මට සිතේ. එවට අපිට රිසිසේ මල් පහන් පුදන්නට ඉඩ තිබේ.

"සෝවාන් වෙලා ද කොහෙද..."

මම තිගැස්සී ඒ හඬ ආ දෙස බැලීමි. මා ළඟින්ම තාප්පයට හේත්තු වී උන්නේ කවුදෝ කොල්ලන් හතර දෙනෙකි. එයින් එක් අයෙකු කන්නට සේ මා දෙස බලා සිටී. මම නැවතත් සැලෙන ගංදිය දෙසට ඇස් හැරවීමි.

"දැං ඔහොම හිටියට මෙයා හරි චණ්ඩියා... ගස් නගින්න එහෙම පුළුවන් අපිටත් වැඩිය හොඳට..."

කොළු රැළේ එකෙකු කීවේය. ඒ මටය. ඒත්.. ඒ ඇස් කොනකින් හෝ එදෙස බැලුවේ නම් මා නොවේ.

"දෝණී..."

අප්පච්චි ඈත හිඳම කෑ ගසයි. මම වහා ඒ දෙසට දිව්වෙමි.

"යං..."

මා කීවෙ අම්මා අත තිබූ බෑගය මා අතට ගන්නා අතරේය. අපි ආපසු එන්නට හැරුණෙමු. ඒත්, එවිටම අප ළඟට ආ අර කොළු නඩයම අප්පච්චිට දණ ගසා වැන්දෝය. නිසැකවම, මේ අප්පච්චී සේවය කළ පාසලක උන් සිසුන් විය හැකිය.

"කොහොමද විශ්ව... මොනවද දැන් කරන්නෙ...?"

අප්පච්චී ඇසුවේ කාගෙන්දැයි දැනගන්නට සේ මම ඔවුන් දෙස බැලුවෙමි.

"ටෙක්නිකල් කොලේජ් එකේ කොම්පියුටර් කෝස් එකක් කරනව සර්... අපි හතර දෙනාම..."

උත්තර දුන්නේ අර කලින් මා දෙස කන්නට සේ බලා හිඳි කොල්ලාය. එහෙම නම් විශ්ව ඔහු වෙන්නට ඇත. මම ඒ ඇස් දෙස බැලුවේ උවමනාවකට නොවේ. නිකමටය. ඒත්, අප සිව් නෙත් ගැටිණි. විශ්ව එක් ඇසක් පුංචි කළේය. 'නොසංඩාලයා...' මට සිතිණි. හිත ගැස්සුණේ ඇයිදැයි නොදනිමි. මම බිම බලාගෙන ම පන්සලේ ගේට්ටුව තෙක් පැමිණ නතර වුණෙමි. අම්මාත් අප්පච්චිත් ආවේ ඊට විනාඩි පහකට පමණ පසුය.

අපි බස් නැවතුම ළඟට එනතුරුමත් එකදු වචනයක් හෝ නොදෙඩුවෙමු. මට මා ගැනම පුදුමය. වෙනදාට ගිරව්යක සේ දොඩමළු වෙන්නේ මාය.

"දෝණි... මොකෝ අද කතා පෙට්ටිය වහල..."

පානදුර බසයකට නැඟ හිඳගනිද්දී අප්පච්චි ඇහුවේය. මම කිසිත් නැතැයි හඟවන්නට සේ හිස දෙපසට සලා සිනාසීමි. අප්පච්චී එය පිළිගන්නට ඇත. අම්මාත්, අප්පච්චීත් ඉදිරිපස අසුණේ හිඳගත් අතර මම ඔවුන්ට පිටුපස අසුනේ හිඳගෙන ජනේල් වීදුරුවට හිස තියා ගතිමි. අම්මාත්, අප්පච්චීත් සිනාසෙමින් මොනවාදෝ කියවයි. මට ඒ දෙදෙනා ගැන පුදුම තරම් ආදරයක් හිතේ. ඔවුන් වචනයකින් හෝ නොහොඳ නෝක්කාඩු වූ දිනක් ගැන මගේ මතකයේ නොවේ. සත්තකින්ම, අප්පච්චී දෙවියකු වන් මිනිසෙකැයි අම්මා කීප වරක්ම මා හා කියා තිබේ.

"දෝණි... බහින්නැතෙයි..."

මම ගැස්සී නැගිට්ටෙමි. මට හොඳටෝම නින්ද යන්නට ඇත.

"තව ඩිංගෙන් දෝණි පානදුරේටම යනව..."

නල්ලූරුවෙන් බැස 'ඩ්‍රැගන්' හෝටලය ළඟින් පාර පනිද්දී මට ඇහෙන සේ

අප්පච්චී අම්මාට කිව්වේය. මම බොරුවට බුම්මා ගත්තෙමි.

"මගෙ මෝඩ දෝණි..."

අප්පච්චී කියන්නේ තවත් මා අවුස්සන්නටය.

"ඔව්... මං මෝඩි... ඒකනේ විභාගෙත් පාස් වුණේ..."

"ඕක මොකක්ද... ඔහොමයැ ළමයි විභාග පාස් කරන්නෙ..."

"අප්පච්චි... මං තරහම තරහයි..."

මම ඔවුන්ට වඩා ඉස්සර වීමි. අප්පච්චි අම්මා හා මොනවාදෝ කියවනු ඇසේ. සමහර විට ඒ මා ගැන විය යුතුය. මගේ අනාගතය ගැන විය යුතුය. මගේ අනාගතය ගැන සිතෙන විට නම් මා හිතටද දැනෙන්නේ මහා උදාසීන කමකි. සරසවියට යන්නට තව අවුරුදු දෙකක්වත් බලා හිඳින්නට සිදුවේ. සරසවියේත් අවුරුදු හතරක්... ස්ට්‍රයික් එකක් ආවොත් එය තවත් කල් ගතවේ. දැන්ම රැකියාවක් සොයා ගත්තා නම් හොඳයැයි මට සිතේ. අප්පච්චිගේ තනි විශ්‍රාම වැටුපෙන් මගේ වියදම දරන්නට හැකිවේද?

ගෙදර ආ සැණින් මම අප්පච්චිගෙන් එකී ප්‍රශ්නය ඇසීමි.

"මයෙ පුතා බය නැතුව විශ්ව විද්‍යාලෙ යන්න... මේ කළා වගේ ඉතුරු ටිකත් කරන්න පුතාගෙ අප්පච්චිට පුළුවන්..."

අප්පච්චී මා තුරුළු කොට ගෙන මගේ හිස පිරිමැද්දේය. මම අම්මා දෙස බැලීමි. ඇගේ දෙකොපුල් සැලිණි. ඈ බලා උන්නේ හඬන්නට සේ මුහුණ හදාගෙනය. මගේ දුක බිඳිණි. වේගයෙන් මගේ ඇස් පිය එකිනෙක හා ගැටිණි.

"අප්පච්චි දුක් විඳියි... මට බෑ අප්පච්චිට දුක් දෙන්න..."

මම අප්පච්චිගේ අත් ගොබයේ එල්ලී ඉකිගසා හැඬුවෙමි.

"අනේ මයෙ පුතේ... මේ සන්තෝස වෙන්න තියෙන දවසෙ බොරුවට නාඬා ඉන්න... කෝ... ඔලුව උස්සන්න..."

මම හිස ඔසවා බලා ගවුම් අතින් කඳුළු පිස දමා ගත්තෙමි. අම්මා අපිට බොන්නට කෝපි හදන්නටයි කියා කුස්සියට ගියාය. අප්පච්චී ඉස්තෝප්පුවේ දිග හාන්සි පුටුවේ හිඳ ගත්තේය. මම ඒ අවසරයෙන් කාමරයට පැන ගත්තෙමි.

සීත රැයට රහස් කියන
පුරා සඳේ සඳ කැල්මක
තුරුළේ වෙලා හිතට වඩින
සොඳුරු කිඳුරු කවිය ඔබය...

සුදු පාටට දම් පාටට
මල් පිපෙනා හැන්දෑවක
සීතට මල් පෙති සිඹිනා
කීකරු නැති වැස්ස ඔබය...

බිංදු ඉහුණු දිග ගවුමේ
රැලි පොඩිකළ ඇඟිලි තුඩග
අල්ලාගෙන දුරක යන්න
ආසයි මුළු ලොවම ඔබය...

කඳුළු රැඳුණු මගෙ දෑසට
සතුට රැගෙන ළඟට වැඩිය
අහස නොවේ පොළොව නොවේ

# 02

**ඉස්තෝප්පුවේ** කොට තාප්පයට එපිටින් දම්පාට හෙන්දිරික්කා මල් යායම පිදී තිබිණ. මම මල් පීරිසි දෙකක් පිරෙන්නට සුදු ඉද්ද හා හෙන්දිරික්කා මල් කඩා ඒවා බුදු ගෙයින් තැබුවෙමි. සිරිතක් ලෙස අම්මා බුදුන් වඳිද්දී මල් පීරිසි දෙකක් තබයි. එකක් බුදුන් වහන්සේ වෙනුවෙනි. අනෙක ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වෙනුවෙනි. හැන්දෑවේ හතට පමණ බුදුගෙට යන අම්මා පැයක් පමණ ගාථා කියයි. ඒ ඇගේ විශ්වාසයය.

මම බුදුගෙයින් එළියට විත් පරණ සඟරාවක් ද ගෙන වත්තට ගියෙමි. වෙනදාට නම් මා හැන්දෑව ගෙවන්නේ අප්පච්චි හා මොනවා හෝ දොඩවමිනි. ඒත්, අද අප්පච්චිගේ දේශපාලන මිතුරා ජයවර්ධන අංකල් පැමිණ අප්පච්චි හා කියවයි. ජයවර්ධන අංකල් කට ඇරියොත් කියවන්නේ එක්කෝ ලංකාවේ ඇති ප්‍රජාතන්ත්‍රවාදය ගැනය. නැතිනම, හිට්ලර්ගේ පාලනය ගැනය. ඔහු කියනා ලෙසට පවතින ආණ්ඩුවට විරුද්ධ වෙන ඕනෑම අයෙකු මැරිය යුතුය. මට නම් මේ කතා තිත්තම තිත්තය. බො හෝ විට ජයවර්ධන අංකල් එන දනවලදී මා කරන්නේ පොතක් හෝ පත්තරයක් රැගෙන වත්තට යාමය.

අපේ නිවෙස පිහිටි ඉඩම අක්කර තුනකින් පමණ යුතු වූවකි. ගේ හැර අනෙක් හරියේ සිටුවා තිබුණේ පොල්ය. ලොකු අරලිය ගස් දෙකක්ද ඒ අතර තිබිණි. පළතුරු ගස් තිබුණේ ගේ ඉස්සරහට වෙන්නටය. අපේ ගෙට එන්නට පාරේ හිඳ මීටර් පනහක් පමණ ආ යුතුය. හරියටම ගෙයි ඉදිරිපස දොරටුවේ හිඳ කෙලින්ම තාර පාරට යන තෙක් සුදු වැලි පාරකි. එය දෙපස අන්දර වැටකි. පාර දෙපැත්තට වෙන්නට පලින් පල පිහිඹියා, කොට්ටම්බා, රඹුටන් ආදිය සිටුවා තිබේ. ඒවා අප්පච්චිගේ වැඩය.

"ෂ්... ෂ්..."

මම තිගැස්සීමි. ඒ අර එදා ඇහුණු හඬමය. මම හිඳ උන් ගල් බැම්ම උඩින් නැගිට හතර අතට ඇස් දිවෙව්වෙමි. කවුරුත් නැත. මම නැවතත් ගල් බැම්ම උඩ

හිඳගෙන පිටු පෙරලන්නට වීමි.

"ෂ්... ෂ්..."

මම පොතෙන් ඇස් නොඉස්සීමි. කවුරුන් හෝ මේ කරන්නේ මහා විහිළුවකි.

"ක...විතා..."

එවර නම් බලා හිඳින්නට බැරි තරමට විහිළුව සැරය. මම හිස උස්සා ඇස් ඔබමොබ යැවීමි. පේන තෙක් මානයක කවුරුවත් නොවේ. මම නැඟිට්ටෙමි. එසැණින්ම, කොහේදෝ සිට ආ කඩදාසි ගුලියක් මගේ ඇඟේ වැදී බිම වැටිණි.

"අ...ප්පච්චී..."

මට කෑ ගැසිණි. මට ගේ දෙස බැලිණි. අප්පච්චි දුවගෙන එයි. ඇත්තටම මේ කඩදාසි ගුලිය කුමක් විය හැකිද? මම අප්පච්චි එන්නට පෙර එය අහුලා අත්ලට ගුලි කර ගත්තෙමි.

"මොකෝ දරුවෝ...?"

"මං බය වුණා අප්පච්චි..."

"බය වෙන්නෙ මොකටද?"

"මොකෙක්ද කෑ ගහනව ඇහුණා..."

"ඔයා හැමදාම මොකෙකුට හරි බය වෙනව... මීට පස්සෙ මෙතෙන්ට එන්න එපා පොත් කියවන්නවත්..."

අප්පච්චී මා අතින් අල්වා ගත්තේය. මා ඔහු හා ගේ දෙසට ගියේ අර කඩදාසි ගුලිය අත්ලට ගුලි කරගත් ගමන්මය. ගෙට ගිය ගමන්ම මා කළේ කාමරයට ගොස් අර කඩදාසි ගුලිය දිග හැර බැලීමය.

"කවිතා... හෙටත් මේ වෙලාවට මෙතනටම එන්න... මං බලන් ඉන්නවා... ඔයා නාවොත් මං තව ලියුමක් ලියලා අර අරලිය ගහේ පහළ අත්තක ගැට ගහලා යනවා....

මේ... මම..."

මම එය සීරුවට නමා ඇඳේ මෙට්ටය යටින් තැබීමි. මට මේ කිසිවක් අදහාගත නොහේ. මේ ලියුම් එවන්නේ කවුද? කවුරු නමුත් ඔහු අප්පච්චිට බය කෙනෙකි. නැතිනම් මටත් හොරෙන් මා දෙස බලා සිටින්නේ ඇයි? ඔහු අප්පච්චී ඉගැන්වූ පාසලක සිසුවෙක්ද? එසේ නැතිනම් ඔහු අපේ ගමේ කෙනෙක්මද? මම බොහෝ දුර සිතුවෙමි. අවසන... හෙට එතැනට නොයා හොරෙන් බලා හිඳිමියි මම තීරණය කළෙමි.

රෑ... ඒ රෑ... මට දිගු එකක් විණි. මම ජනේලය හැර අහස දෙස බැලුවෙමි. සඳ වළා අතරින් මෝදු වෙනු මම යකඩ කූරු වලට කම්මුලක් තියාගෙන බලා උන්නෙමි. පිපීගෙන එන පිච්චමල් සුවඳ හිත කිති කවයි. සුළඟ සීතලය. ඈතින් මුහුදේ හෝ හඬ

ඇසේ. අහේතුකවම මට විශ්ව සිහිවිණි. හිත තිගැස්සිණි. අර ලියුම් කැල්ල එවූවේ ඔහු විය නොහැකිද? මම ඇස් පියාගෙන ඒ මුහුණ මතක් කරගන්නට අපමණ වෙහෙසක් දැරුවෙමි. මට ඒ ඇස් සිහිවේ. ඒවා ලස්සනය. මා දුටු ලස්සනම ඇස් දෙක හිමි ඔහුටය. මම ඇස් ඇර බැලීමි. හඳ වළාකුලකට වැසී ගොසිනි. මම ජනේලය වසා දැමීමි. ඇඳට වැටුණු සැණින් නැවතත් මට පෙර සිද්ධි හැමෙකක්ම සිහිවේ. නින්ද නම් අහලකවත් නොවේ.

"මට මොනව වෙලාද මන්දා..."

ගෙවෙන හැම තත්පරේකම මට සිතිණි. හයියෙන් හූ කියාගෙන යන කෝච්චියක හඬ ළාවට ඇහිණි. මම තිගැස්සීමි. මේ දැන් මෙතැන ඉන්නේ ඉස්සර උන් කවිතා නොවේ. දැන් මම කුරුළු පිහාටුවක් බිම වැටුණත් තිගැස්සෙමි. සත්තකින්ම මේ වෙනස කුමක්ද? මම හිතන්නට වුණෙමි. ඒත්...

මට කිසිත් හිතන්නට තරම් හිතේ නිස්කාංසුවක් නොවේ. තත්පරෙන් තත්පරය ගෙවිණි. ජීවිතේ අම්මාට අප්පච්චිට හැර වෙන කිසිවෙකුට ආදරය නොකළ මට ලියුම් එවන... හැංගී හිඳ කතා කරන... විකාර කාරයාගේ හැසිරීම් නිසා මහා වෙනසක් දැනී තිබිණි. මම උදේ හිඳ හැන්දෑ වෙනතුරුම කල්පනා කළෙමි. විසඳුමක් නොවේ. හිත තැවේ. සිතුවිලි පැටලේ. උදෑසනද දහවලද ගෙවුණේත් ඒ විදිහටමය.

"කවිතා..."

මිදුලෙන් ඇසුණු හඬ ශිරෝමිගේය. මම වහා ඉස්තෝප්පුවට ගියෙමි.

"යන්නැද්ද ලයිබ්‍රරි...?"

මට එය සිහිවුණේ එවේලේය. අප පුස්තකාලයට යන්නේ හැම බ්‍රහස්පතින්දාමය. ශිරෝමිට ගෙට එන්නැයි කියා මම හනිකට ඇඳ ගත්තෙමි. පොත් දෙකත් ගෙන ශිරෝමි හා මඟට බසිද්දීත් මගේ සිහියේ තිබුණේ අර විකාරකාරයාය. පුස්තකාලයට ගොස් ආපසු එද්දීත් මා පය ඉක්මන් කළේ හොරෙන් හෝ හිඳ ඔහු අල්වාගැනීමට හිතේ තිබුණු ඕනෑකම නිසාය. බඩු වගයක් ගන්නට ඇතැයි කියා ශිරෝමි නල්ලූරුව හන්දියේ නතර වුණාය. මම තනිවම ආවෙමි. පාර පාළුය. එක් පසෙක පුංචි කැලෑවකි. අනෙක් පස පුරන් වූ කුඹුරු යායකි. කළුවර වැටෙන්නට පෙර යන්නට හිතාගෙන මම පය ඉක්මන් කළා පමණකි. මගේ ළඟටම පැමිණි මවුන්ටන් බයිසිකලයක් ශබ්ද නැගෙන්නට තිරිංග තද කළේය. මම ගැස්සී පසෙකට වීමි. එය පැදගෙන ආ කොල්ලා බැස නැවතී මා දෙස බලා සිනාවිණි. සිනාසෙන්නටත් අමතකව ගිය මා හිස ඔසවා ඔහු දෙස බැලුවේ බනින්නට සිතාගෙනය. ඒත්...

"විශ්ව..."

මට කියැවිණි. ඔහුට සිනා නැගිණි. මට දැනුණේ කියාගන්නට බැරි තරමේ ලැජ්ජාවකි.

"එහෙනං මාව මතකයිනේ..."

මම යටිතොල සපාගෙන බිම බලාගත්තෙමි. කතාකරන්නට වචන මගේ

මුවගට නොඑයි. නික්මී යන්නට මගේ දෙපා නොනැගෙයි.

"කවිතා..."

ඔහු මගේ මුහුණට එබෙයි. මම තවත් වතාවකට තිගැස්සීමි.

"ඊ වෙයි ගෙදර යද්දි... මං ගිහිං දාන්නද?"

"එපා... මගෙ කකුල් තාම හයියයි..."

"ඒ වුණාට කළුවරට බයයිනෙ..."

"විකාර..."

මම පියවර කීපයක් ඉදිරියට තැබීමි.

"ෂ්... ෂ්..."

මට මොකක්දෝ හුරු කමක් දැනිණි. ඒත්, ඒ කුමක්දැයි හරි හැටි මතකයට නොඑයි. මම නොහැරී තව ටිකක් දුර ගියෙමි.

"ෂ්... ෂ්..."

මට මතක් විණි. මේ නම් ඔහුමය. මම හැරී මොහොතක් බලා උන්නෙමි. විශ්ව බයිසිකලය තල්ලු කරගෙන මා ළඟට ආවේය. ඒ ඇස්... හීන් දෙතොල්... සුදු කම්මුල්... රැළි කොණ්ඩය... එකින් එක මගේ ඇස් මායිමට හසුවිණි.

"ඔයා... ඔයා..."

"ඔව්... මං තමයි... මොකක්ද ඔයාට තියෙන ප්‍රශ්නෙ...?"

"න්... නෑ..."

"මං දන්නව... ඔය අහන්න හදන්නෙ... හැන්දෑවට හැන්දෑවට... වත්ත පල්ලෙහා ඉඳන් ඔයාට කතා කරන්නෙ මම මද කියලනෙ... ඔව්... ඒ මං තමයි..."

"ඒත්... ඔයා ඇයි?"

"ඔයා ගැන හෙව්වෙ ඇයි කියලද අහන්නෙ... හේතුව මේකයි... මං ඔයාට කැමතියි... මං ඔයාව හැමදාටම මං ගාව තියාගන්න කැමතියි..."

මට තවත් ඒ ඇස් දෙස බලන්නට හැකිකමක් නොවේ. මම අතේ තිබූ පොත් දෙක පපුවට තුරුළු කරගෙන වෙනතක් බැලුවෙමි.

"මං ඔයාව මුලින්ම දැක්කෙ සුමංගලේ එක්සිබිෂන් එක දවසෙ... මගෙ යාළුවෙක් තමයි කිව්වෙ ඔයා අපේ ප්‍රින්සිපල්ගෙ දුව කියලා... මං එදා ඉඳන් ඔයා පස්සෙන් ඔයාට නොදැනෙන්න ආව... ඔයා ගැන හෙව්ව... එදා ඔයාල කළුතර යද්දි අපිත් පස්සෙන්ම වගේ ආව... ඔයා හරි ෂෝක් ගෑනු ළමයෙක්... හරි සංසුන්... පිළිවෙලයි... ඇවිදින්නෙ හෙමීට... හරියට පොළොවට රිදෙයි කියල වගේ..."

මට සිනා නැගිණි. අප්පච්චි කියන්නේ මට විසේ වැඩි වගය. අම්මා ද කියන්නේ මගේ දාංගලේ මට්ටු කරන්නට කසාද බඳින කෙනාටවත් පුළුවන් වේද කියා

සැක බවය. ඒත්, දැන් විශ්ව කියන්නේ මා සංසුන් ගති ඇත්තියක බවය.

"කවිතා..."

ඔහු මෘදුව හෙමීට... මුමුණයි. මම හිස නොඉස්සුවෙමි.

"මේ... මං ඔයාට ලියාගෙන ආපු දෙවෙනි ලියුම... අර අරලිය අත්තෙ ගැට ගහන්න කියල ගෙනාවෙ... දැං ඉතිං ඔයා මාව දන්නවනෙ... ඒ හින්දා... මේක අරලිය අත්තට කරදරයක් කරන්නෝනෙ නෑ... ඔයා අරං යන්න..."

"මට එපා..."

මම නැගෙන්නට එන ප්‍රේමණීය සිතුවිලි හංගා ගත්තෙමි. විශ්ව මා අත වූ පොත් දෙක අතරට ලිපිය දැම්මේය. මගේ අතැඟිල්ලක ඔහුගේ අත වැදිණි. අහම්බෙ බන් වදින්නට ඇතැයි සිතා එය අමතක කරන්නට සිතීද මට එසේ කරන්නට ඉඩ නොදුන්නේ විශ්වගේ අකීකරු ඇස් දෙකය.

"මට පුළුවන් ඔයාට ආදරේ වෙන්න..."

"අප්පච්චි කැමති වෙනේකක් නෑ..."

"ප්‍රින්සිපල් සර් මං ගැන දන්නව... මට පුළුවන් එයාව කැමති කරවගන්න..."

මම ආපසු එන්නට සිතාගෙන හැරුණෙමි. යාන්තමට කළුවර වැටී තිබූ හෙයින්දෝ විශ්ව ගේ කිට්ටුවටම මා හා ආවේය.

"ලබන සතියෙ ලයිබ්‍රරි ගිහිං එද්දි මුණගැහෙමු..."

මම එය නෑසුණා සේ දුවගෙන ආවෙමි. අප්පච්චි කඩුල්ල ළඟ උන්නේය. මගේ හිත තිගැස්සිණි. ඔහු විශ්ව දුටුවාවත්ද?

හිත මඳක් ගැස්සිණිද මම ආයාසයෙන් මවා ගත් සිනාවක් දෙතොල් පෙති අතරේ රන්දා ගත්තෙමි. අප්පච්චි කඩුල්ලේ වූ උණ බම්බු දෙකක් පහලට දැම්මේය. ඒ ඇතුලට යන්නැයි නොකියා කියන්නකි.

"කවුද දෝණිත්තෙක්ක ආපු ඉලංදාරියා..."

මම ගැස්සී පිටුපසින් එන අප්පච්චි දෙස බැලුවෙමි. ඔහු මගෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරක් බලාපොරොත්තුවෙන් හිඳී. කුමක් කියන්නදැයි මට සිතාගත නොහේ.

"ඇහුන්නැද්ද මං අහපු දේ..."

"ඒ මං අඳුරන ළමයෙක්..."

"මං අඳුරන කෙනෙක් නෙවෙයිද?"

"දන්නෑ..."

මම හෙමීට මිමිණුවෙමි. අප්පච්චි ඒවා විශ්වාස කළාදැයි නොදනිමි. ඒත්, ඊට පසු ඔහු ඒ ගැන මොනවත්ම මගෙන් ඇසුවේ නැත.

"මොකෝ රෑ වුණේ..."

ගෙට ගොඩ වෙද්දීම අම්මා ඇසුවාය. මට අප්පච්චී දෙස බැලිණි. ඔහු කතාවක් නැත.

"අප්පච්චියි දූයි ගොළු බේත් බීලද?"

අම්මා ඇහුවේ මඳක් සැරෙනි. මම යාන්තමට හිනැහී කාමරයට පැන ගත්තෙමි. අප්පච්චී අම්මා හා මොනවදෝ කියවනු ඇසේ. හිත ගැහෙන්නේ ඇයි දැයි නොදනිමි.

"දෝණී..."

අම්මා කෑ ගසාගෙන කාමරය දෙසට එයි. ඊළඟට කුමක් වේද?

"එන්නෙපා... මං ඇඳුම් මාරු කරනවා..."

මම කෑ ගැසුවෙමි. අම්මා එය නොතකාම කාමරයට එබුණාය. මම ගවුම උරහිසෙන් පන්නා එය රෙදි රාක්කයට දැම්මෙමි.

"මෙහෙමත් ලැජ්ජ නැති කෙල්ලෙක්..."

අම්මා කීවේ මා යට ඇඳුම් පිටින්ම හිඳ අඳින්නට ඇඳුමක් සොයද්දීය. මම හිනාව හංගාගෙනම සැහැල්ලු ගවුමක් සොයාගෙන එය ඇඳගත්තෙමි.

"ඇත්තද අප්පච්චි කියන්නෙ..."

"මොනවද?"

"ඔයා කොල්ලෙක් එක්ක කතා කර කර ආවයි කියල..."

"අප්පෝ... මේ ඩිංගට ඒකත් කනේ තිබ්බද? මං එන එක්කම කවුදෝ කොල්ලෙක් ආව තමා... ඌ ඒව මේව කියල මාව කතාවට අල්ල ගන්න ට්‍රයි කළා තමා... හැබැයි... මං ඌව ගනන් ගත්තෙ නෑ... අම්ම දන්නවනෙ මගෙ හැටි..."

මම කියවාගෙන කියවාගෙන ගොස් අම්මා දෙස බැලුවෙමි. ඈ දෙතොල් සැරසුණේ ආඩම්බර සිනාවකිනි. ම හිත ඇවිලිණි. ඈ මා ගැන මහා විශ්වාසයක් තබාගෙන හිඳී. අනේ, මා  එය බින්දා නොවේද?

"මූණ සෝදගෙන ඇවිත් පාන තියන්න ලෑස්ති කරන්න දෝණි... අප්පච්චි මල් කඩල ඇත්තෙ..."

අම්මා කාමරයෙන් එළියට ගියේ එහෙම කියාගෙනය. මා තුවායක් කරේ දමාගෙන සාලයට ආවේ මූණ සෝදන්නට යන්නටය.

"දෝණි මොනවද ගෙනාපු පොත්..."

"ඇට මැස්සායි... ගොළු හදවතයි..."

" ඇටමැස්සා හොඳ ඇති..."

අප්පච්චී නැගිට්ටේ කාමරයට යන්න විය හැකිය.

"ඉන්න අප්පච්චි මං ගෙනැල්ල දෙන්නං..."

මම වහා කාමරයට විත් ගෙනා පොත් දෙක පෙරලා බැලුවෙමි. විශ්ව දුන් ලියුම තිබුණේ ඇට මැස්සා පොත ඇතුළේය. මම එය කොට්ටය යටට දමා පොත ගෙන ගොස් අප්පච්චිට දුන්නෙමි. හනිකට මූණ සෝදාගෙන විත්, මල් පහන් පුදා මම කාමරයට වැදුණෙමි. මට අවැසි වුණේ හැකි ඉක්මණින් තනිවෙන්නටය. මම ඇඳ උඩ හාන්සි වී ලිපිය පත්තරයක් තුළ දමාගෙන කියවන්නට පටන් ගත්තෙමි.

**දයාබර කවිතා,**

**මම කවුද කියල නොකියා ඔයාව බය කළාට සමාවෙන්න. එහෙම කළේ ඔයාව රවට්ටන්න හිතාගෙන නෙමෙයි. ඔයා මාව දැකල ගිහින් ප්‍රින්සිපල් සර්ට කියයි කියල මගේ හිතේ පුංචි බයක් තිබ්බ නිසා. ඒත්, අද මං ඔයාට මං කවුද කියලා ලියනවා. මං විශ්ව...**

**ඔයාට මතකද එදා කළුතරදි මුණ ගැහුණෙ. මං ඔයාව දකින්න හිතාගෙ නමයි එදා ආවෙ. විශ්වාස කරන්න කවිතා... මීට ඉස්සර කිසිම කෙල්ලෙක් ගැන මට මේ වගේ හැඟීමක් දැනිල නෑ. ඔයා ගැන හුඟක් දුරට දැනෙන මතකයක් මට නෑ. මං මුලින්ම ඔයාව දැක්කෙ සුමංගලේ එක්සිබිෂන් එකේදි. ලස්සන ඇස්, තදකරල පියාගත්තු තොල්, ලස්සන නිකට... අනේ කවිතා... ඔයා හරි ෂෝක් කෙල්ලෙක්.... පස්සෙ මං ඔයා ගැන හෙව්වා... ප්‍රින්සිපල් සර්ගෙ දුව කියල දැනගත්තට පස්සෙ බයත් හිතුණා... ඒත්, ආදරේ කරනෙක වැරැද්දක් නෙවේනෙ... නේද?**

**ඉතිං කවි... ඔයා දැන් ඔයාගෙ කැමැත්ත හරි අකමැත්ත හරි මට දන්වන්න.... ඔයාට තරහ ගිහිං මේ ගැන ප්‍රින්සිපල් සර්ට කියයිද දන්නෙත් නෑ. එහෙම කරලා මට රිද්දන එක හොඳයි කියලා හිතෙනව නං ඔයා එහෙම කරන්න. මගෙ හිතේ තරහක් ඇති වෙන එකක් නෑ. එහෙම කළා කියල ඔයා ගැන මගෙ හිතේ තියෙන ආදරේ නං බිංදුවක්වත් අඩුවෙන එකක් නෑ. මගෙ ආදරේ හුඟක් පූජනීයයි.**

**මං ආදරණීය විශ්ව.**

එක හුස්මටම ලිපිය කියවාගෙන ගිය මම එය කොට්ටය යටට දමා ඇස් වසාගත්තෙමි. විශ්ව... ඔහුට මේ සා අහිංසක හිතක් ඇතැයි මීට කලින් මම නොසිතුවෙමි. මට නැවතත් අර රැළි කොණ්ඩය... සුන්දර හිනාව... සුදු මූණ... සිහිවේ.

"දෝණී..."

මම ගැස්සී ඇස් ඇරියෙමි. අම්මා මා ළඟමය. අනේ, තවත් මා ඇට බොරු කරන්නේ කොහොමද? අම්මාගේ උකුලේ හිස හොවාගෙන ඇස්වලට පිරුණු කඳුළු මම ඇගෙන් හැංගුවෙමි.

පෙම් හීන තනි රකින
නිල්පාට හැන්දෑවෙ
සුදු දෑත් වලට මා හිරකරන්
ඔබ ඉන්න මං ගාව...

පින්සාර ඔය දෑස
සෙනෙහසක තතු කීව
ඒ සොඳුරු තත්පරේ සිහිවෙන්න
මම හිඳිමි ඔබ ගාව...

වස්සාන රාත්‍රියක
ඔය දෙපා සිඹින විට
මකා නළලේ කොකුම් දෙතොලගින්
ඔබ ඉන්න මං ගාව...

හීතලට හීතලට
වැහි බිංදු වැටෙනකොට
සෙනෙහසක් සොයා ඔබ උණුහුමින්
මම හිඳිමි ඔබ ගාව...

පෙම් හිතට තනිවෙන්න
නොදී මොහොතකටවත්
සෙවනැල්ල ලෙසින් හෝ සිහිනයෙන්
ඔබ ඉන්න මං ගාව...

සංසාර කතාවට
ආදරේ මුහුවෙලා
ජීවිතේ කවියක්ව ගැයෙද්දෙන්
අපි හිඳිමු අපි ගාව...

# 03

**ගෙවුණු** ඒ රය පුරාම මම විශ්ව ගැන සිතුවෙමි. ඔහු එවූ ලිපිය ගැන සිතුවෙමි. කරන්නේ කුමක් ද කියා මට හරිහැටි පැහැදිලි නොවේ. ගෙවෙන තත්පරෙන් තත්පරේ මගේ සිතිවිලි අවුල් වෙන්නේ එහෙයිනි. මට අම්මාට අප්පච්චීට බොරු කරන්නට නොසිතේ. හිතට එබෙන ආදරයට පිටුපාන්නටද නොසිතේ. එසේ නම්, හිත කියන්නේ මට විශ්ව හා හාදවෙන්නටද?

කෙසේ නමුදු, මට එක් කරුණක් පැහැදිලිය. ඒ... මා විශ්වට අකමැති නැති වගය. අකමැති වුණා නම් කෙලින්ම අකැමැති වග පවසා අයින් වෙන්නට තිබිණි. මට එසේ කරන්නට නොසිතේ. ඒ, මා ඔහුට ආදරය කරන නිසාද?

"ක...විතා..."

මම ගැස්සී ඇස් ඉස්සුවෙමි. ශිරෝමි ඉඟට දෑත තබාගෙන මා දෙස බලා සිටී.

"ගේ පුරාම හෙව්වා.... හිටියෙ නෑ... පස්සෙ අම්මා කිව්වා අරලිය ගහ උඩ බලන්න කියල... පුදුමයි... අද මොකෝ මේ ගහෙන් බිමට බැහැල..."

මම කිසිත් නොකියා නැගෙන්නට එන සිනාව දෙතොල් අතරේම තෙරපවා ගත්තෙමි. ශිරෝමිගේ දෙතොල් නෝක්කාඩු හැඟීමකින් සේ එකට ගැටිණි.

"උඹ... අද නං මොකක් හරි හොර වැඩක් කරල තියෙනව..."

"පිස්සු..."

"මං නං නෙවේ.... කවිතා ධනංජනී රත්නසේකරට..."

"අනේ පලයං ශිරෝමි..."

මම හිස ගැස්සුවෙමි. ශිරෝමි මගේ උරහිසකින් ඇල්ලුවාය. පාත්වී මගේ මුහුණට එබුණාය.

"පොඩි ආරංචියක් තියෙනව..."

"මොකක්ද?"

"උඹේ පස්සෙන් කොල්ලෙක් එනවයි කියල..."

"ම්... මගේ..."

මට කියැවිණි. ශිරෝමිට සිනා නැඟුණේ නිරායාසයෙන්මය. මම එක්වරක් රවා බලා ඉවත බලා ගත්තෙමි.

"කොහොම හරි කමක් නෑ... ලබන සතියෙ ලයිබ්‍රරි යද්දි උත්තරයක් ලියාගෙ නම පලයං... නැත්තං පව්නෙ එයා..."

"කවුද... කවුද ඔය කියන එයා..."

"අපොයි දන්නෙම නැතුව ඇති..."

"ඇත්තමයි දන්නෑ..."

"බෝයි ස්කූල් එකේ ක්‍රිකට් ටීම් එකේ කැප්ටන්.... අර සුදු කොල්ලා... ප්‍රදීප විශ්වනාත් ජයසුන්දර... ගම කඩුගන්නාවෙලු... මෙහෙ ඉන්නෙ මාමලයි ගෙදරලු..."

"මං... මං දන්නෑ ඕවා..."

මම කම්පිතව හිස එසැවීමි. ජීවිතේ කිසිදාක මෙවන් පරාජයක් මා අත්විඳ නැත්තේමය.

"දැං ගස් නගින්නැත්තෙ විශ්ව කිව්වද මීට පස්සෙ ගස් නගින්න එපා කියල..."

"උඹට මම..."

මම නැඟිට්ටෙමි. ශිරෝමි ගේ දෙසට දිව්වාය. කවුරු හෝ ඇට විශ්වත් මාත් ගැන කියන්නට ඇතැයි මට සිතේ. විශ්වම කිව්වාවත්ද? මා හෙමීට ගේ දෙසට ඇවිදගෙන යද්දී ශිරෝමි අම්මා හා මොනවාදෝ කියවමින් උන්නාය. මම එතැන නොනැවතී කෙලින්ම කාමරයට ගියෙමි. මට අවැසි වූයේ තනිවෙන්නටය. තනිවී විශ්වගේ දඟ හිනාව මවාගන්නටය. ඒ විසේකාර ඇස් හිත් මායිමේ රඳවාගන්නටය. ඒත්...

"ඔය මූඩ් ගැහිල්ලනං එච්චර හොඳ නෑ රජෝ..."

ශිරෝමි කාමරයට පැමිණ ඇඳ උඩින් හිඳ ගත්තාය. මම බොරු අමනාපයක් මවාගෙන ඇට රැව්වෙමි.

"මෙහාටත් ආවද වදකාරී..."

"ආ... දැන් මං වදකාරී... ආ..."

"එදා ඉඳන්ම උඹ වදකාරියක් වගේ තමයි මං නොකිව්වට..."

මා එය කී ආකාරයටදෝ ශිරෝමිට සිනා නැගිණි. ඈ දෙඋරහිස් ගස්ස ගස්සා

හිනැහුණාය. මම නෝක්කාඩු බැල්මක් හෙලුවෙමි. ශිරෝමි ළඟට විත් මා උරහිසින් ඇල්ලුවාය.

"මට විශ්ව හම්බුණා... එයාව මං ටිකක් අඳුරනවා..."

"හරි... මට හිතාගත්තැකි ඉතුරු ටික..."

"ඉතිං... උඹ විශ්වට කැමතිද?"

"තාම ඒ ගැන හිතුවෙ නෑ..."

"ඒ බව නං පේනව මූණ දිහා බැලුවම..."

මම රතුවී ගිය දෙකොපුල් දෝතින්ම තදකොට ගත්තෙමි. මගේ හැසිරීම් වෙනදා නොතිබි ඒවා බැවින්දෝ ශිරෝමි මහ හඬින් සිනාසුණාය. මම නිහඬ වුණෙමි.

"හෙට මට ලයිබ්‍රරි යන්න වෙන්නෑ කවිතා... උඹට තනියෙන් යන්න පුළුවන්නෙ..."

ආපසු යන්නට සූදානම්ව ශිරෝමි කීවාය. මම හිස සැලුවෙමි. ඈ බොහෝවිට එසේය. පුස්තකාලයට යන්නේ දෙසතියකට පමණ වරකි.

"කොහොමටත්... මං නාවත් විශ්ව එයිනෙ..."

මම තිගැස්සීමි. ඒත්, මා යමක් කියන්නටත් පෙර ශිරෝමි ආපසු දිව්වාය. කෙසේවීද මගේ හිත නම් අවුල් විණි. හෙට ශිරෝමි නොඑන්නේ විශ්ව එන නිසාද? හෙට විශ්ව මූණ ගැසුණොත්... ආපසු එනවිට හිත හැදෙන විදියේ පිළිතුරක් රැගෙන එන්නැයි එදා ඔහු කීවේය. අනේ, මා ඔහුට කුමක් කියන්නද? මට හෙට පුස්තකාලයට යන්නට නොසිතේ. මොකක්දෝ බියකින් මගේ හිත ගැහෙයි. පසුදා මා පුස්තකාලයට යන්නට මඟට බැස්සේද හිත හරිහැටි නිරවුල් නොවීමය. ඔය අතරේ හිත අවුල් කරවන තවත් දෙයක් සිදුවිණි. ඒ...

මා බසයෙන් ගොස් ගුණානන්ද ප්‍රතිමාව ළඟ බසින විටම විශ්ව එතැන හිඳීමය. හිත තිගැස්සුණේ අප සිව්නෙත් ගැටුණු විටදීය. සිනාසෙන්නට තරම්වත් දිරියක් මා ළඟ නොවිණි. මම පොත් දෙක ළමැදට තබාගෙන බිමටම මූණ හරවාගත්තෙමි.

"තාමත් බයද කතා කරන්න..."

ඔහු පැදගෙන ආ මවුන්ටන් බයිසිකලය මා ළඟ නවත්වා මඟ හරස් කළේය. මම හිස පාත්ම කොට ගත්තෙමි.

"කවිතා..."

මම හිස ඔසවමි. විශ්ව ඇස්පිය නොගසා බලා හිඳී. හිත තිගැස්සේ. සිතුවිලි අවුල් වේ. කම්මුල් වෙව්ලන්නේ, ඇස්පිය වේගයෙන් එකිනෙක හා ගැටෙන්නේ ඇය දැයි මම හිතෙන් අසමි.

"මං කරන්නෙ වැරැද්දක් කියල හිතනවද?"

මම හිස දෙපසට සලා නැතැයි කියා හැඟවීමි.

"එහෙනං ඔහොම ඉන්නෙ... තරහවෙලා වගේ... බුම්මගෙන..."

මම යාන්තමට සිනාවීමි.

"බුම්මගෙන ඉන්නෙ නැතුව හිනාවෙනකොට ගෑනු ළමයි කොච්චර ලස්සනද?"

හදිසියේම හැමූ සීතල සුළඟකින් මම තිගැස්සී ගියෙමි. මගේ කම්මුල් පුපුරු ගැසුවේය. ඒවා රතුවෙනු විශ්ව දකින්නට ඇත.

"කවිතා..."

විශ්ව... ඔහු පොත් දෙක පපුවට තබා තදකරගෙන උන් මගේ අතකින් අල්වාගත්තේය. ගින්නකින් නොවේ... නුහුරු සීතලකින් මම පිච්චුණෙමි. විශ්ව මා දෙස බලාගෙනම උන්නේය. හුස්ම ගන්නටත් අමතක වූවා සේ මම ඒ දෑසට එබුණෙමි. විශ්වගේ ඇස් ලස්සනය. හිනාව අකීකරුය. කම්මුල් සුදුම සුදුය.

"භාවනා කරනවද මං දිහාවෙ බලාගෙන..."

මම තිගැස්සී බිම බලාගත්තෙමි. විශ්ව මගේ අතැඟිලි තුඩු අල්වාගෙන හෙමීට ඒවා මිරිකීය. ප්‍රේමයදැයි හරිහැටි නොවැටහේ. ඒත්... මොකක්දෝ අපූර්ව හැඟීමකින් මගේ හිත පිරිණි.

"මෙතන ඉන්නෙක හොඳ නෑ... යං ලයිබ්‍රරි එක දිහාවට..."

මම ඉස්සර වෙන්නට හැදුවෙමි. විශ්ව මා උරහිසෙන් අල්වා ඔහු දෙසට ඇදගත්තේය.

"නගින්න..."

ඔහු කීවේ මට බයිසිකලයට නඟින්නටය. මම බියෙන් විසල් වූ ඇස් උඩට හැරවීමි.

"මං මරාගෙන කන්නෑ ළමයො... නගින්න..."

"අ...නේ... බෑ..."

"කවිතා..."

විශ්ව මා දෑසට එබිණි. ඔහු කියූවක් ප්‍රතික්ෂේප කරන්නට හිතට ඉඩ නොදුන්නේ ඒ දඟකාර ඇස් දෙකය. මම බයිසිකලයට නැගුණෙමි. විශ්ව මා ද නංවාගෙන බයිසිකලය පදින්නට පටන් ගත්තේය. මුදු සුළඟ මුහුණේ වදිද්දී මම මුහුණ පසෙකට හැරවීමි. මට විශ්ව ළඟ ඇති සුවඳ දැනිණි. මම ඇස් පියා ගත්තෙමි.

**"ඔබ දන්නවනම්... එක කඳුළු බිඳක්...**
**හිත යටට වෙලා දුක් විඳින තරම්...**
**ඒ කඳුළ වුණත් නෙතු අගට ඇවිත්**
**යළි ඔබේ පයට පෑගෙනවානම්..."**

විශ්ව ආයෙත් මිමිණුවේය. ඔහු සිංදු කියද්දී අහන් ඉන්න ආසා හිතෙයි.

"කවිතා..."

"ම්..."

"බහින්නැද්ද?"

මම ඇස් ඇර බැලුවෙමි. පුස්තකාලයේ ගේට්ටුව ළඟම විශ්ව බයිසිකලය නතර කොට තිබිණි.

"ඉක්මන්ට ගිහිං එන්න... මං මෙතන ඉන්නම්..."

විශ්ව කීවේය. මම ආපසු හැරී නොබලාම ගොස් පුස්තකාලයට ඇතුළු වීමි. පොත් තෝරද්දීද මා උන්නේ ඒ සිතිවිල්ලේමය. විශ්ව ගැන හිතද්දී ද මට පුදුම සිතේ. ඔහු මට හමුවුණේ අහම්බෙනි. ඒත්... එකී හමුවීම මේ සා සෙනෙහසකට පෙරලෙතැයි හීනෙන් හෝ මා සිතුවේ නැත.

පොත් දෙකක් තෝරාගෙන මා ආපසු එද්දී විශ්ව ගේට්ටුව ළඟ නොවිණි. මම හාත්පස බැලුවෙමි. විශ්ව මූද අයිනේ පොල් රුප්පාව මැද්දට වී මා දෙස බලා උන්නේය. යම්ද නොයම්දැයි සිතා ගත නොහී මම ළතැවීමි. විශ්ව මට එන්නැයි කියා හිසින් සන් කළේය. මම හෙමීට එතැනට ඇවිදගෙන ගියෙමි.

"ලස්සනයි කවිතා..."

ඔහු මගේ නළලට වැටී දඟකළ කෙස් කැරැල්ලක් කන අයිනේ හැංගුවේය. එක් ඇසක් අඩවන් කළේය. මොකක්දෝ සීතලකින් මගේ හිත හිරිවැටී ගියේය. මම ඔහු අත් ගොබයේ එල්ලී ගෙනම ඒ උරිස්සට හිස තියා ගතිමි. විශ්ව හෙමීට මා හිස පිරිමැද්දේය.

"කවිතා..."

"ම්..."

"ඔළුව උස්සන්නකො..."

"මොනවටද?"

"බඩුවක් කියන්න..."

මම හිස ඔසවා ඔහු දෙස බලමි. ඔහු බලා උන්නේය. මා හිත ගැස්සිණි. විශ්ව එය දකින්නට ඇත. ඔහු පාත්වී මගේ නළල සිම්බේය. මම තිගැස්සී වටපිට බැලුවෙමි. පේනතෙක් මානයක කවුරුවත් නොවේ.

"ඩිංගක් ඇත්තම් ඔයා බයවෙනවනෙ..."

විශ්ව කොඳුරයි.

රන් පාට අහස් ගඟ පුරාවට
තරු කැකුළු පිපෙන විට සීරුවට
හැන්දෑවෙ සීතලට ඔබෙ අතින් අල්ලගෙන
පා තබමි හෙමි හෙමින් ඔබ එක්ක...

සුදු රෝස මියැදෙන්න අර අඩියි
හිරු ගිලෙයි ආකහේ කෙළවරින්
පාළු හිත පුරාවට ඔබෙ සෙනේ තවරගෙන
ළඟින් ඉමි විඳගන්න ඔබෙ සුවඳ...

මහ හඬින් හඬන වැහි වළාවක
දිය බිඳක් අගිස්සේ හැංගිලා
ඔබෙ ලොවට එන්න මග අසාගෙන සොයාගෙන
ළඟින් ඉමි සීත සුළඟක් එක්ක...

පෙම් හිතට තනිවෙන්න ඉඩ නොදුන්
කවිකාර ඔය හිතට තුරුළු වී
හුදෙකලා තනිකමට ඈත යන්නැයි කියා
රැඳී ඉමි ඉඩ දෙන්න හිනැහෙන්න...

# 04

**පොද වැස්ස** මහ වැස්සක්ව කඩන් වැටිණි. හීතල හිරිකඩ අඳුරකින් ජනේලය ළඟ උන් මා තෙත බරිත විණි. ඒත්, මට ඒ ගැන හිතන්නට දෙයක් නොවිණි. මම සීතලට ගැහෙන කම්මුල් අතැඟිලි තුඩු අගින් තෙරපා ගත්තෙමි. කම්මුල් වේගයෙන් ගැහේ. ඇස්පිය එකිනෙක හා ගැටේ. හැඬුම් එන්නට තරම් දුකකින් පපුව රිදේ.

"දෝණි... පිණි බානව නේද ඔතන..."

මම ඇස්පිය නොඋස්සාම ඒ අම්මායැයි තීරණය කළෙමි. මට ඈ සෙදස බලන්නට හිතක් නොවේ. තරහකට අමනාපයකට නොවේ, කවදාවත් බොරු නොකළ මගේ ඇස් අම්මාට විශ්ව ගැන ගතු කියාවි'යි බියෙනි.

"ඇයි මයෙ දෝණි..."

මම අම්මා ළඟට වීමි. අසනීපයක් යැ'යි සිතා ඈ මා නළලතටත්, ගෙළටත්, පිටි අත්ල තබා බැලුවාය. දුක බිඳෙන්නට ඔන්න මෙන්නය. ඒත්, මම නොහැඬීමි.

"පැනඩෝල් දෙකක් දෙන්නද?"

මම හිස සලා හා කියා කීවෙමි. මෙතෙක් හිතේ පැවති ප්‍රේමණීය හැඟීම් යටපත් කොටගෙන අම්මාත්, අප්පච්චීත් ගැන ලොකු දුකක් හිතේ තෙරපේ. දැන්... මේ දැන්... විශ්ව ළඟ උන්නානම්... මට මෙවන් ගින්දරකින් දැවෙන්නට බැරිවග කියා කෑ ගසා හඬන්නට ඔහු දැන් මා ළඟ උන්නානම්...

අම්මා ගෙනත් දුන් පැනඩෝල් පෙති දෙක බී මම ඇඳට වැටී ඇස් තදකොට පියා ගත්තෙමි. අම්මා ළඟටම වී බොහෝ වේලා මගේ හිස පිරිමැද්දාය. මට නින්ද යන්නට ඇත.

* * * * * * *

එදා... හීනෙන් මම විශ්ව දුටිමි. වෙනදා දකින ලස්සන මුහුණ නොවේ. නපුරුම නපුරු මුහුණක් දුටිමි. ඔහු අතේ උල් පිහියක් තිබිණි. විශ්ව ඒ පිහියෙන් ඇන්නේ මගේ අප්පච්චිටය. මයෙ අප්පච්චි... කෑ ගසාගෙන පපුව බදාගත්තේය.

"අප්පච්චී..."

මම මහ හයියෙන් කෑ ගැසීමි. මා නැගිට්ටා නොව ඉබේටම නැඟිටුණා සේය. මගේ ඉහින් කනින් දාඩිය බේරෙයි. හාත්පස කළුවර මඳකට ඈත් කොට අම්මලාගේ කාමරයේ විදුලි පහන් දල්වනු පෙනේ. මම හයියෙන් හුස්ම ගත්තෙමි.

"මොකෝ මයෙ දෝණි..."

අප්පච්චී ඇහුවේ මගේ කාමරයේ විදුලි පහන දල්වන අතරේය. මම පුංචි එකියක වගේ ඉකිබිඳ හැඬුවෙමි.

"නරක හීනයක් දැක්කද?"

මම හිස ඉහළටත් පහළටත් සලා ඔව් යි කීවෙමි. අම්මා පිරිත් තෙල් බෝතලයෙන් තෙල් බිඳක් ගෙන මගේ හිසට දමා හිස පිරිමැද්දාය. මම ඈ උරහිසට හිස තියාගත්තෙමි.

"මට බයයි  අම්මා... ඔයා මං ගාව නිදාගන්නවද?"

"අපොයි බයගුල්ලි..."

අප්පච්චි විදුලි පහනද නිවාගෙනම කාමරෙන් එළියට ගියේ එසේ කියාගෙනය. මම අම්මාට තුරුළුව ඇස් පියාගතිමි.

"දෝණි වැඩිය වත්ත පල්ලෙහාට යන්නෙපා... ඔයා මීට ඉස්සරිනුත් බය වුණා නේද ඔය වගේ..."

පහුවදා මා ඉදලත් අරන් මිදුලට බහිද්දී අප්පච්චි කීවේය. මම එය පිළිගන්නා සිනාවක් පා මිදුල අතුගාන්නට වීමි. මට අම්මා ගැන පමණක් නොවේ, අප්පච්චී ගැනද දුක හිතේ. විශ්වට කැමති නොවී හිටියානම් මීට වඩා හොඳ යැයි මට හිතෙන්නේ දැන්ය. පහදා කිව නොහැකි තරම් පසුතැවිමකින් මම පීඩා විඳිමි.

"අන්න හොඳයි නංගී... දැම්ම ඉඳන් ගෙදර දොරේ වැඩ පුරුදු වෙන එක කාගෙ කාගෙත් ශරීර සෞඛ්‍යයට හොඳයි..."

ශිරෝමි කොහේදෝ සිට කඩා පාත්වී කියවාගෙන ගියාය. මම ඉදල පසෙකින් තබා ඉස්තෝප්පුවේ පඩියක් උඩින් හිඳගත්තෙමි. ශිරෝමිද මට ටිකක් ඈතට වෙන්නට හිඳගත්තී උවමනාවෙන් මා දෙස බැලුවාය.

"මොකෝ කන්න වගේ බලාගෙන..."

"විශ්වට හිතුණු එක පුදුමයක්ය... මටත් උඹව දැක්කම ඒව මේව හිතෙනෙක..."

"ෂ්... කෑ ගහන්නෙපා යෝදියෙ..."

මගේ බියපත් ඇස් දුටු නිසාදෝ ශිරෝමිට හයියෙන් සිනා නැඟිණි. අම්මා සාලයේ හිඳ ඉස්තෝප්පුවට ආවේ ඒ වෙලාවේමය.

"යසයි... ගෑනු දරුවො හිනාවෙන හැටි..."

"ගණන් ගන්නෙපා වස්තුව... දැං කාලෙ කොල්ලො... හිනාවෙන්නෑ... උන් හරි ආඩම්බරයි... ඒ වෙනුවට දැං අපිට සිද්ධ වෙලා තියෙනව උන්ගෙ කොටසටත්තෙක්ක හිනාවෙන්න... අන්න ඒ හින්දයි අපි මේ තරං හිනාවෙන්නෙ... නැතුව මෙ අපේ තියෙන නැහැදිච්චකමට එහෙම නෙවේ... හොඳේ..."

ශිරෝමි කියවාගෙන ගියාය. මම දෙතොල් තෙරපාගෙන හිනාව හිරකරගෙ නම අම්මා දෙස බැලීමි. ඈ හිනාව හංගාගෙනම ගෙතුළට ගියාය. කොහොමටත් ඈ මට මෙන්ම ශිරෝමිටද ආදරේය.

"කවිතා..."

මම ශිරෝමි දෙස බැලීමි. ඈ මොකක්දෝ කියන්නට අර අඳී. මොකක් හෝ ඇය කියන්නට හදන දේ මගේ හිත රිද්දන දෙයක් නොවේවා'යි මම පැතුවෙමි.

"මං විශ්ව ගැන හොයල බැලුවා..."

හිත ගැහෙන්නේ මක් නිසාදැයි නොවැටහේ. මම විසල් සුසුමක් හෙලීමි.

"විශ්වනං හොඳ ෆැමිලි එහෙකලු... එයාලා උඩරට කට්ටියනෙ... ඒත්... එයා දැං ඉන්න ගෙදර උන්නං මහ කමකට නැති එවුන්ලු... පිංවත්තෙ එවුන්නෙ... මහ මැරයොලු... තාම ආදරේ කරන්න පටන් ගත්තෙ නැත්තං... ෂේප් එකේ අමතක කරල දාපං කෙල්ලෙ..."

මගේ ඇසින් කඳුළක් කඩා වැටිණි. කා නිසාදැයි නොදනිමි. දුකහිතී හිත කීරි ගැසිණි. ඊයේ දුටු හීනය... මගේ හිත ගැස්සුණේ එය සිහිවය. ඒ හීනෙනුත් කියැවුණේ ශිරෝමි කී දේවල්ද? මගේ හීන ඇත්තටම හීනයක් වෙයිද? මගේ හීන නිසා මගේ අප්පච්චිගේ හීන විනාශ වෙයිද? හිතට ආ දුක කඳුළක්ව ඇසින් ගලා යද්දී මම දෙතොල් පට සපාගෙන ඉකිය වලක්වා ගත්තෙමි.

"පිස්සු නටන්නෙපා කවිතා..."

ශිරෝමි මා දෑතින් අල්වා ගත්තාය. මම ඇස් තදකොට පියාගෙන කඳුළු මිරිකා හැරියෙමි. මගේ සිතිවිලිවලට ගිනි ඇවිලුණේ එවේලේය.

හිත හදාගන්නෙමැයි කොතෙක් සිතීද, කොයිවෙලාවෙත් ඇස් පිච්චුණේ කඳුළුවල උණුහුමෙනි. ශිරෝමි මොනවා කීවත් මා විශ්ව අමතක කරන්නේ කෙසේද? තත්පරයක් දෙකක් නොවේ... දින පහක්ම මම ඒ ගැන සිතුවෙමි. හිත රැඳෙන මානයක, ඇස ගැටෙන මානයක පිළිතුරක් නොවෙ. පපුව රිදුම් දුන්නේ දරාගත නොහැකි පසුතැවිල්ලකින්. මට දුක හිතුනේ මා ගැන නොවේ. අම්මා ගැනය. මගේ අප්පච්චී ගැනය. අනේ, අර අහිංසකයා... විශ්ව.. ඔහු ගැනද මට දුක නොහිතුණා නොවේ. ඒත්...

ඒ බ්‍රහස්පතින්දා මා පුස්තකාලයට නොගියේ විශ්ව මඟහරින්නට හිතාගෙනය. හිතට දුක නැතිවාම නොවේ. නෙතට කඳුළු නොපිරුණා නොවේ. ඒත්, මම දරාගත්තෙමි. තවත් දුර දිග ගියොත් අපිට අපි නැතුවම බැරිවුණොත්, වියෝගය මීට වඩා දරුණු විය හැකි නොවේද? මා පුස්තකාලයට යන මග බලා ඉන්නා විශ්ව රස්තියාදු වී යන්නට ඇත. මුළු රෑම ගෙවුණේ නින්දත් නොනින්දත් අතරේය. ජීවිතේ ඉස්සරින්ම ආදරේ කළ පවට මම ඇති තරම් දඬුවම් වින්දෙමි.

පහුවදා... නොවේ... ඊටත් පහුවදා මම අම්මා සමඟ පානදුරේ ගියෙමි. අපි ගියේ සාරියක් ගන්නටය. ශිරෝමිගේ අක්කාගේ දෙවැනි මනාලියන් මාත් ශිරෝමිත් නිසා අළුත් සාරියක් ගන්නට උවමනා වී තිබිණි. අපි සාරි සෙන්ටර් එකට ගොස් සාරි තෝරමින් සිටියෙමු. ශිරෝමි කීවේ තද දම්පාට සාරි දෙකක් ගේන්නැයි කියාය. ඇයට එන්නට වෙලාවක් නැති නිසා ඇය අපට සාරි ගන්නට මුදල් දුන්නාය. අම්මාත්, මමත්, තද දම්පාට ෂිෆෝන් සාරියක් ගෙන එය බලමින් හිඳියෙමු. ඒ පාට ශිරෝමිටත් මටත් හොඳට ගැළපෙනැයි මට සිතිණි.

"ෂ්... ෂ්..."

මම ගැස්සී දොරටුව දෙස බැලුවෙමි. විශ්ව... තවත් යහළුවෙක් හා දොරකොඩ අවුරා උන්නේය. මම යටැසින් අම්මා දෙස බැලීමි. ඈට මගේ වෙනස වැටහී නැත.

"මේකෙන් දෙකක් ගම්මුද දෝණි..."

"ම්..."

අමමා සාරි දෙකට මුදල් ගෙවා මා ළඟට එනතුරුත් මා උන්නේ බිම බලාගෙනමය. විශ්වගේ ඇස් දෙස බලන්නට මට බය හිතේ. ඒවා මට ආදරය කියා දොයි. ඉතිං... කෙසේ පිටුපාන්නෙම්ද?

දොරකොඩ උන් ඔහු පසුකොට යන්නට මත්තෙන් මම හිස පාත්ම කොට ගත්තෙමි. ඔහු ළඟින් යද්දී මට ප්‍රේමයේ උණුසුම නොදැනුණා නොවේ. විශ්ව ළඟ විතරක්ම ඇති, මා ආසා කරන රෝසමල් සුවඳ නොදැනුණාද නොවෙ. අනේ, වෙන මොනවා කරන්නද විශ්ව...

"ෂ්... ෂ්..."

මම හැරී නොබැලුවෙමි. අම්මා නැවතුණාය. නැවතී හැරී බැලුවාය. මගේ පපුව ගැහෙන්නට විණි.

"ආ...න්... දෝණිගෙ ලේන්සුව..."

මා විශ්ව දෙස බැලුවේ අම්මා එසේ කියද්දීය. ඇත්තටම ඔහු අතේ තිබුණේ මගේ රෝස පාට මල් මල් ලේන්සුවය. එය මාතින් බිම වැටෙන්නට ඇත.

"ගන්න දෝණි..."

"නෑ අම්මා... ඒක මයෙ නෙවේ..."

කොහෙන් ආ ශක්තියක්දෝ හිතට ගෙන මම කීවෙමි. ලේන්සුව අරන් අප ළඟට ආ විශ්වගේ මුහුණ හැකිලිණි. කළේ වරදක් වග සැබැවි. ඒත්, තවත් වචනයකින් හෝ ඔහුට බලාපොරොත්තු නොදිය යුතුය. මම අම්මාත් ඇදගෙන ආපසු හැරුණෙමි. විශ්ව බලා හිඳින්නට ඇත. රිදුණේ ඔහුට පමණක් නොවේ. මටත් මහ හුඟක් රිදිණි.

ගෙදරට ආ සැණින් මම වෙනස්ම වෙනස් එකියක වුණෙමි. වෙනදාට වඩා උනන්දුවෙන් ගෙදර දොරේ වැඩපල කරන්නට වුණෙමි. මිදුල සුද්ධ කොට ගෙදරට එන පුංචි වැලි පාර දෙපස හෙන්දරික්කා පැල සිටුවීමි. කඩුල්ල දෙපස සුදු ඉද්ද මල් ගස් දෙකක් සිටුවීමි. හැන්දෑවේ මුළු මිදුලම අතු ගා කුණු රොඩු පුළුස්සා දැම්මෙමි.

"දෝණී... අප්පච්චියි මායි බණ ගෙදරක යනව... කළුවර වැටුණම දොර වහගෙන ගෙට වෙලා ඉන්න හොඳේ..."

අම්මා කීවේ මා නාන ළිඳ ළඟට වී ඇඟ හෝදද්දීය. මම හිනැහී හිස සැලුවෙමි. ගෙට ආ විගස මා කළේ ගෙට වැදී දොර වසාගැනීම නොවේ. ඉස්තෝප්පුවට විත් පත්තරය කියවන එකය.

"කවි..."

මම තිගැස්සුණෙමි. විශ්ව... ඔහු බයිසිකලය නවත්වා එයින් නොබැසම මා දෙස බලා හිඳී. මම නැගිට හනිකට ගෙට වැදී දොර වසා ගත්තෙමි.

"කවිතා..."

විශ්ව දොරට ගසනු ඇසිණි. මම නෑසුණා සේ කාමරයට ගියෙමි. ජනේලය ළඟට වී එහි යකඩ කූරු වලට හිස ඔබා හැඬුවෙමි.

"කවිතා..."

විශ්ව... මා හිස ඔසවද්දීම ඔහු මගේ දෑත් තරයේ අල්වාගත්තේය.

"අතාරින්න... ඔයා යන්න..."

"මෙහෙම කරන්න... මං කරපු වැරැද්ද මොකක්ද කියන්න..."

"අනේ මට වද නොදී යන්න විශ්ව..."

මගේ අත් අල්වාගත් ගමන්ම විශ්ව බොහෝ වේලා මදෙස බලා උන්නේය. මගේ ඇස්වල කඳුළු... ඒවා ඔහු දකින්නට ඇත.

"මටත් ගින්දර දීල... ඔයත් අඬනව... මොකක්ද රත්තරනෙ මේකෙ තේරුම...?"

මම කිසිත් නොකීවෙමි. කළේ ඔහු දෙස බලා හිඳීම පමණකි.

"කවිතා... මං මැරෙනව... නිකං නෙවෙ... ඔයා හින්ද මැරුණෙ කියල ලියල තියල..."

ඔහු මගේ අත් මිරිකා ගත්තේය. රිදුණේ දෑතට නොවේ. හිතටය.

"මං... මං... යනව කවිතා... ඔයා හොඳින් ඉන්න..."

එක්වරක් ජනේල් කූරු අල්වාගෙන උන් මා දෑත සිඹගත් විශ්ව ආපසු හැරුණේය. මා ආදරේ කළ තරු ඇස්... හිතුවක්කාර සිනාව, සුන්දර ආදරේ මේවා මා හැර යන්නේය. ඉතිං... මා තනි වෙන්නේමය. මට දුක දැනිණි. දුක මහා වේදනාවක්ව හිතට එබිණි. එදා සිට.. ඒ තත්පරයේ සිට...

මම පිස්සියක තරම්ම මුරණ්ඩු එකියක වීමි. ගෙවෙන හැම තත්පරයකම මාතින් සිදුවුණේ කාගේ හෝ හිත රිදෙන දෙයකි. මම අම්මා කියන දේ නෑසුවෙමි. අප්පච්චි කියන දේ නෑසුවෙමි. වෙනදා ඒ දෙදෙනා හිනස්සා හිනැහෙන මගේ මේ හැසිරීම ඔවුන්ට  ගැටළුවක් වෙන්නට ඇත. මා බලාගත් අත බලාගෙන කල්පනා කිරීම, කෑමක් බීමක් ගැන උනන්දුවක් නොගැනීම, වෙනදා සේ සිනාසී නොසිටීම, අම්මාට දුකක්ව තිබිණි.

"මොකක් හරි ප්‍රශ්නයක් තියේනං කියන් මයෙ පුතේ.. ඔහොම හිතේ තියාගෙන විඳවන්නෙ නැතුව..."

අම්මා බොහෝ විට කියයි. මම වියලි සිනාවක් පාමි. හතේ තියෙන්නේ මෙහෙව් ගැටළුවක් යයි මා කියන්නේ කෙසේද? විශ්වත් මාත් අතර තිබූ බැඳීම අම්මා දන්නේ නැත.

කාලය ගෙවුණේ කාංසියේන සේය. කිසිදු දිනක් මට වෙනසක් නැතුවම දුක බෙදා ගෙවිණි. යාන්තමට හෝ වෙනසක් දුටුවානම් ඒ ශිරෝමිගේ අක්කාගේ මංගල්‍යය දාය. මම උදෙන්ම එහි ගියෙමි. අක්කාව හැඩගැන්වූ රසිකා අක්කා ඊළඟට මා හා ශිරෝමිව හැඩගැන්වූවාය.

"කවිතගෙ ලස්සන..."

රසිකා අක්කා කීවේ මගේ කොණ්ඩයට පබලු ඇල්ලූ මල් කිනිත්තක් ගසන අතරේය. මම රතුවී ගියෙමි.

"විශ්ව දැක්කොත් අදම කැන්දන් යයි..."

"ශි...රෝමි..."

"ආ... මොකෝ පත්තු වුණේ..."

මම කිසිත් නොකීවෙමි. එසැණින්ම මනාලයා රැගත් රිය මිදුලේ නවත්වනු ඇසිණි. සුදු මල් කළඹ රැගත් දෙවෙනි මනාලයාද කැමරාකරුද කාමරයට ඇතුළුවුණේ එක්වරමය. මම බිම බලාගත්තෙමි. ඊළඟට තවත් කවුදෝ අයෙක් මා ළඟට විත් දම්පාට මල් කළඹ මා දෙසට පෑවේය. මමහස නොඋස්සාම එය අතට ගන්නට හැදුවා පමනි. ඒ ඇඟිලි තුඩු මගේ අතැඟිලි හා පටලැවිණි. මම ගැස්සී හිස එසැවීමි. අනේ, මා විශ්වාස කරන්නේ කෙසේද ඒ දුටුවේ සිහිනයක් නොවන වග...?

"විශ්ව..."

ඔහු මල් කළඹ මා අතේ තබා හෙමීට මා අතැඟිලි තුඩු මිරිකා ගත්තේය. මට දුක සිතිණි. ඔහු මා හා හිනැහුණේ වත් නැත.

"පිං සිද්ධ වෙයි අඬන්නනං එපා..."

ඔහු කීවේ එපමණකි. මම දරාගත්තෙමි. හිත ගලක් නොවේ. එය සැබෑවකි. ඒත්... මේ හඬා හෙම්බත් විය යුතු අවස්ථාවක් නොවේ. මම අසීරුවෙන් සිනාවක් මවාගෙන මිනිසුන් ඉදිරියේ රඟපෑවෙමි.

"නියම ජෝඩුව..."

සමූහ ඡායාරූප ගනිද්දී කවුදෝ කොල්ලෙක් කෑ ගසා කීවේ මට හා විශ්වටය. මම සසල ඇස්පිය බිමට හැරවීමි.

"අනේ නංගි මූණ රතුකරගන්නැතුව ඔලුව උඩට උස්සන්න..."

කැමරාකරු කීවේය. මට දැනුණේ වචනයෙන් කිව නොහැකි තරමේ අපහ සුවකි. මා අවුල් වී උන්නායි කීවොත් එය නිවැරදිය.

"කවි..."

හැන්දෑවේ ශිරෝමිගේ කාමරයට වී ගලවා දැමූ සාරිය නවමින් උන් මා ගැස්සුණේ විශ්වගේ හඬිනි. මම හනිකට ගවුමේ නොපියවා තිබූ උඩ බොත්තම දමා ගත්තෙමි. විශ්ව ඇවිත් ඇඳ උඩින් හිඳගත්තේය. මම නැවූ සාරිය බෑගයට දමා ගත්තේ ඔහු දෙස නොබලාමය.

"ගෙදර යන්නද?"

මම හිස සලා ඔව් යි හැඟවීමි.

"දැම්ම යන්නෙපා... මට චුට්ටක් කතා කරන්නෝනා..."

"මට බෑ..."

"කවිතා..."

විශ්ව මගේ අතකින් අල්වාගත්තේය. මම ඒ අත ගසා දැම්මෙමි.

"යන්න විශ්ව කවුරුවත් ආවොත්..."

"කවුරුත් දන්නව අපි දෙන්න යාළුයි කියල..."

"පිස්සු..."

"මට නෙවේ ඔයාට..."

"හරි මට පිස්සු... ඒ හින්දවත් මාව අමතක කරල දාන්න..."

මම කියවාගෙන ගියෙමි. ඒ සුදු මූණ රතුවිණි. ඔහු මා දෙස බැලුවේ දුකෙනි. මා හිත බිඳිණි. ඒත්, නොහඬා සිටින්නට තරම් මගේ හිත හයිය විණි.

"මං ඇවිත් ප්‍රින්සිපල් සර්ව හම්බුවෙනව..."

"මොකටද?"

"මට ඔයාව ඕනෙයි කියන්න..."

"මට ඔයාව ඕන්නෑනෙ..."

විශ්ව නැගිට මා ළඟට විණි. ඔහු මගේ කම්මුල් දෝතින්ම අල්වා හිර කරගත්තේය. රිදෙනවා'යි හඟවන්නට මම ඇස් පුංචි කළෙමි. ඔහු මා නළල සිඹ ගත්තේය. මම සීතලව ගියෙමි. ඔහු මගේ දෙතොල් සිම්බේය. මම පිච්චී ගියෙමි.

"යන්න... විශ්ව... යන්න..."

"ආදරෙයි කියන්න එකපාරක්..."

"බෑ... බෑ... මාව අමතක කරන්න..."

මම ඔහුගෙන් මිදී වෙනතකට පැන්නෙමි. විශ්ව මේසය උඩ තිබූ උල් කතුරක් අතට ගත්තේය. හෙමීට මා ළඟට ආවේය. බියෙන් මගේ ඇස් උඩ යන්නට ඇත. විශ්වගේ දෙතොලේ සිනා පොදක් නැත. ඒ ඇස්වල කිසිම තෙතමනයක් නැත. මා එදා දුටු ආදරය... එය නම් එහි තිබෙනු මම දුටුවෙමි.

"කවිතා... එකපාරක් කියන්න..."

මම ඇස් පියා ගත්තෙමි. විශ්ව හෙලන හුස්ම පවා මගේ මුහුණේ වැදිණි. මම සීතලව ගියෙමි. දැන් දැන් ඔහු එයින් ඇන මගේ පපුව සිදුරු කරතැයි මට සිතිණි. හිතට දැනුණේ බයක් නොවේ. දුකකි. මට මැරෙන්නට හැකිය. ඒත්... අම්මාගේ අප්පච්චිගේ අහිංසක බලාපොරොත්තු... විශ්වට තිබුණු ආදරේ මා ඒවා දමා යන්නේ කෙසේද?

මම ඇස් ඇරියෙමි. නොඑසේ නම් එය එසේ විණි. එවේලේම... ඒ තත්පරයේම... මට පෙනි පෙනීම... මගේ ඇස් ඉස්සරහම... විශ්ව ඔහුගේ ම අතට කතුරෙන් ඇන ගත්තේය. අත තුවාල වී ලේ විසි විණි. මට කෑ නොගැසුණා පුදුමය. මම කුස්සියට දිව ගොස් ලේන්සුව තෙමා ගෙනැවිත් ලේ ගලන තුවාලය මත තැබීමි. විශ්ව ඇස් පියාගත්තේය. ඇස් පියන් හයියෙන් තද කොට ගත්තේ වේදනාව නිසා විය යුතුය.

"අ...නේ... විශ්ව..."

මම ඔහු අත බදාගෙන හැඬුවෙමි. විශ්ව කිසිත් නොකියා මා අතැර ගොස් ඇඳේ හාන්සි විණි. මම ඇඳ ළඟ බිමින් හිඳගෙන විශ්වගේ හිස පිරිමැද්දෙමි. ඔහු නෙත් කොනකින් හෝ මදෙස බැලුවේ නම් නැත.

"ක..වි..තා.."

ශිරෝමි කාමරයට ආවේ මා සොයාගෙනය. මම තිගැස්සී හැරී බැලීමි.

"මොකෝ..."

"විශ්වගෙ අත..."

"උඹ උෟව තුවාල කළාද?"

"අ...නේ... නෑ......"

මා එය කියූ ආකාරයට වෙන්නට ඇත. විශ්වටත් ශිරෝමිටත් එක්වරම සිනා නැගිණි. මම හිඳි ඉරියව්වෙන්ම හිඳ ඇඳේ මුහුණ ඔබාගෙන ඉකිගසා හැඬුවෙමි. ටිකකින්... තත්පර කීපයකින්... කාගේදෝ මුදු අත්ලක පහස මහිසට දැනිණි. ඒත්... මම හිස උස්සා නොබැලුවෙමි.

"කවි..."

විශ්ව හෙමීට... ආදරෙන් කතා කළේය. මට තවත් හයියෙන් ඉකිගැසී හැඬිණි. රිදුණේ ඇස් පමණක් නොවේ. හිතද රිදුණි. මමහිස ඔසවා විශ්ව දෙස බැලවෙම. ඔහු ඇස් පියන් නොගහා බලාගෙන උන්නේය. ම දෙස බලාගගෙනම උන්නේය. මගේ රතු වූ කම්මුල්, කඳුලිල් පෙඟුණු ඇස්, තාමත් සැලෙන දෙතොල් ඒවා ඔහු දකින්නට ඇත.

"මට සමාවෙන්න..."

මම හෙමීට කෙඳිරුවෙමි. විශ්ව හිනැහුණේය.

"මොන වරදක් කළාටද?"

"ඔයාව මඟ ඇරියට... ඔයාට ආදරේ කරන්න බෑ කිව්වට..."

"එහෙම කළේ ඔයා නෙවෙයි කවිතා... අම්මල ගාවදි තනි තීරණයක් ගන්න බැරිකම තමයි ඔයාව ඒ දේට පෙළඹෙව්වෙ... මං දන්නව හොඳටම... ඔයා මට ආද රෙයි... මේ ලෝකෙ වෙන කාටවත් නැති තරං ඔයා මට ආදරෙයි... එහෙම නේද මයෙ මැණික..."

විශ්ව මගේ දෙකම්මුල් මිරිකාගෙනම කියවාගෙන ගියේය. මම යාන්තමට සිනාසීමි. මේ සෙනෙහස මට ගින්දරකි. ගෙවෙන තත්පරෙන් තත්පරේ මා දවා අළු කරන්නේ විශ්වගේ ආදරය නොවේද? මේ කප්පරක් දුක් මා දරන්නේ ඔහුට ආදරය කළ නිසා නොවේද?

"කවිතා..."

මම කඳුළින් බොඳවී රිදෙන ඇස් ඔහු දෙසට හැරෙව්වෙමි.

"මේ ඉරිදා මං එනවා ඔයාලයි දිහාවෙ..."

"එපා.."

"කෙලින්ම එපා කියපු හැටි... ඔයා කොච්චර එපා කිව්වත්... මං එනවා එනවාමයි..."

විශ්ව කියවාගෙන කියවාගෙන ගියේය. මට සිනා නැගිණි. මම හෙමීට විශ්වගේ අතට පහරක් ගැසුවෙමි.

"උෟයි..."

ඔහුට කෑ ගැස්සිණි. මට සිදු වූ වරද වැටහුණේ එවේලේය. ඔහුගේ තුවාලය පෑරෙන්නට ඇත.

"සමාවෙන්න..."

මම ඔහුගේ අත හෙමීට පිරිමැද්දෙමි. විශ්ව වේදනාව දරාගෙන උන්නේ බො හෝ අසීරුවෙන් වග මට වැටහේ.

"විශ්ව..."

"ම්..."

"යං බේත් ටිකක් දාගෙන එන්න..."

"බෑ..."

"කිව්වම අහන්න... නැගිටින්න... "

මම ඔහු බලෙන් නැගිටුවා ශිරෝමිත් කැටුව ළඟ ඇති ඩිස්පෙන්සරියකට ගොස් ඔහුගේ අතේ තුවාලයට බෙහෙත් දම්මවා ගත්තෙමි. කතුරක් ඇනුණු බව කී විට වෛද්‍යවරයා ඔහුට පිටගැස්මට එන්නතක්ද වින්දේය.

"රි...දෙනව... කව්..."

එද්දී ඔහු කීවේය. මගේ දෙනෙතට කඳුළු පිරිණි. විශ්වට මේ හැමෙකක්ම සිදවුනේ පව්කාර මා නිසා නොවේද? ඇස්වලට දැනුණු ඒ තිගැස්ම හිතට පමණක් නොවේ, දසැඟිලි තුඩු අගිස්සටද දැනුණු තරම්ය. මගේ කම්මුල් සැලෙන්නට ගත්තේ කෑ ගසා හඬන්නට බැරි කමටය.

ශිරෝමිගේ ගෙදර ආ අපි ශිරෝමිගේ අයියා කෙනෙකු ලවා විශ්ව ඔහුගේ ගෙදරට ඇරලුවෙමු.

"මං ඉරිදට එනව නංගි..."

මම මොකුත්ම නොකියා බලා උන්නෙමි. විශ්ව ඇසි පිය නොගහා ම මා දෙස බලා හිඳී.

"එපා කියලවත් කියන්නකො ඉතිං....."

ඔහු කියවයි. සිනා නැගෙන්නට එන දෙතොල තර කොට පියාගෙන මම බිම බලා ගත්තෙමි

"මට ඔයා නැතුව ඉන්න බැරි වෙයි...."

විශ්ව ආයෙත් කීවේය.

"ඔන්න එහෙනං මං ඉරිද එනවාමයි හොඳේ...."

එන්න එපා යි කියා ආයිත් කියන්නට නොසිතුණේ මන්දැයි නොදනිමි. මම දුකින්, බොහෝ දුකින් ඔහුට යන්නට දුන්නෙමි. ඊට පසු ශිරෝමිගේ කාමරයට වී හොඳටෝම හැඬුවෙමි.

"දෝණි මොකෝ තෙහෙට්ටුවෙන් වගේ..."

හැන්දෑවේ මා ආපසු ගෙදරට ගොඩ වෙද්දීම අප්පච්චි ඇසුවේය. හිත තිගැස්සිණිද මම ඒ වගක් නොඅඟවා සිනාවීමි.

"මල් බොකේ එක උස්සගෙන ඉඳල මහන්සිද දෙවෙනි මනමාලිට..."

අප්පච්චි කීවේ මා අවුස්සන්නට විය යුතුය. මම බොරු අමනාපයක් මවාගෙන ගෙතුළට වැදුණෙමි.

හීන් කඳුලක් පිපී
දෙකොපුලේ දඟපාන
විරහවේ තනිකමට
මං බයයි හොඳටෝම...

ඉතිං ඒ පාළුවට
මගෙ ළඟට වී ඉන්න
ආදරෙන් පොඩි බැඳුන්
ආයෙමත් ඔබ එන්න...

කම්මුලට ළංවෙලා
සිනිඳුවට සිපගත්තු
දෙතොල්පෙති දුක් සුසුම්
හෙලනවා රහසේම...

ඉතිං මේ පෙම් හිතට
බිම්බරක් දුක් නොදී
ආයෙමත් නොයන්නට
ඔබ එන්න ඔබ එන්න...

# 05

**විශ්ව...** මට ඔහු ගැන හිතන්නට බොහෝ දේ තිබිණි. ඊළඟට මොනවා වේදැයි කියා නම් මට නොතේරේ. ඔහු ඉරිදාට අප නිවෙසට පැමිණි විට... අප්පච්චි මොනවා කියයිද? මා මෙතෙක් කල් බොරු කළා යි හිතේද්දී අප්පච්චිට මොන තරම් නං දුකක් දැනෙයිද?

"දෝණි ඇදිල ගිහිං..."

දිනක් අම්මා කීවාය. මම පිච්චී ගියෙමි. අම්මා ඉස්තෝප්පුවේ පඩියක් උඩින් හිඳගෙන මා දෙස බලා යාන්තමට හිනාවුණාය. මම ඈ හිඳ උන් පඩියට පහළ පඩියෙන් හිඳගෙන අම්මාගේ උකුලෙන් හිස තියා ගත්තෙමි. අම්මා හෙමීට... හෙමීට... මා හිස පිරිමැද්දාය. මගේ ඇස් කඳුළින් පිරිණි.

"දෝණි අඬනව..."

"ඔළුව රිදෙනව අම්මා..."

"යං... ගෙට... තෙල් ටිකක් ඔලුවට දාල අත ගෑවම හරි යයි..."

අම්මා මා නැගිටුවා කාමරයට කැටුව ගියාය. මම ඇඳට වැටී ඇස් පියා ගත්තෙමි. අම්මා බේත් තෙල් දමා හිස පිරිමැද්දාය. ඒ සුවයට සනීපයට.... මට නින්ද යන්නට ඇත.

ඊළඟ ඉරිදාව... එය එළැඹුණේ මගේ හිත බියෙන් ගිනිවද්දමිනි. තත්පරෙන් තත්පරය ගෙවුණේද හෙමින් නොවේ. මහ හයියෙනි. හැන්දෑවේ... විශ්ව ආවේය. ඒ ඔහුගේ මාමාගේ පුතා සුදීප සමගිනි. ජනේලයෙන් ඔහු එනු දුටු මම ගැහෙන පපුවට සුරත තබාගෙන ඇඳ උඩින් වාඩිවුණෙමි. විශ්ව අප්පච්චි හා කතා කරනු මා අසා හිඳියේ එසේ හිඳගෙනය. ටිකකින්... අප්පච්චි කුස්සියට වත් තේ හදන්නැයි කියා අම්මාට කියනු මට ඇසිණි. මම කුස්සියට ගියෙමි. ඒ වෙද්දීත් අප්පච්චි නැවත සාලයට ගොසිනි.

"දෝණි... මේ කෝප්ප ටික හෝදල ට්‍රේ එක උඩින් තියන්න..."

"කාටද මේ...?"

"අප්පච්චිගෙ හොඳම ගෝලයෙක් ඇවිත්නෙ... අර... විශ්ව..."

"ම්..."

මම වැඩියමක් නොකීවෙමි. අම්මා තේ හදාගෙන සාලයට ගියාය. මම කුස්සියේ දොරකඩට වී වත්ත පහළ දෙස බලා උන්නෙමි. එදා මා පන්සල් යන්නට අරලියා මල් කඩන්නට එතැනට නොගියා නම්... ඊට පසු විශ්ව මා සොයා නොආවා නම්... මේවා මෙසේ වන්නේ නැත. විශ්ව මගේ මුළු ජීවිතයම වග සැබෑවි. ඒත්... මගේ අප්පච්චිගේ බලාපොරොත්තු...

සාලය දෙසින් මගේ නම කියැවෙනු ඇසිණි. මම, සාලයත් පටු කොරිඩෝරයත් වෙන්වෙන තැන දැමූ තිර රෙද්දට මුවාවී විශ්ව දෙස බැලුවෙමි. ඔහුගේ සුදු මූණ පුරාම පශ්චාත්තාපයක සලකුණුය. අකීකරු රැළි කොණ්ඩයෙන් කැරලි කීපයක් නළලට වැටී දඟකරයි.

"මං... දැන් ටික දවසක ඉඳන්... කවිතා ගැන කැමැත්තකින් ඉන්නෙ..."

විශ්ව අසීරුවෙන් වචන ගැට ගසා ගත්තේය. මම දුකින්... බොහෝ දුකින් හිත පුරවා ගත්තෙමි.

"කවිතා එක්ක ඔය දරුවගෙ සම්බන්ධයක් තියෙනවද?"

හිටිහැටියේම අම්මා ඇසුවාය. විශ්ව බිම බලාගත්තේය. මම එතැනම හිඳ පපුවට අත තබා ගත්තෙමි. බයක් නොවේ... මොකක්දෝ අවිනිශ්චිත හැඟීමකින් පපුව දැවිල්ල ගති. පෙර ඇසූ ප්‍රශ්නයම අම්මා නැවතත් විශ්වගෙන් ඇසුවාය. මම විශ්ව දෙස බැලීමි. ඔහු මුහුණ උඩට එසෙව්වේය. පසුව... ඉතා අසීරුවෙන්...

"ඔව්..."

කියා කීවේය. මම තිගැස්සී අප්පච්චී දෙස බැලීමි. ඔහු එක්වරක් අම්මා දෙස බලා දෑතින් දෙකම්මුල් මිරිකාගෙන බිම බලාගත්තේය. අප්පච්චිට දුක සිතී ඇතැයි මට දැනුණේ එවේලේය.

"මගෙ දරුවා පුංචි කාලෙ ඉඳලම අම්මටත් වඩා ළං වෙලා හිටියෙ මට.... ජීවිතේ කිසි දවසක... අත්‍යවශ්‍යම කාරනේකදි ඇරුණහම එයා මට මොනවත් හංගල නෑ... ඒත්... ටික දවසක ඉඳන් මට තේරුණා... මයෙ දූ ටිකක් වෙනස් වෙලා කියල... මං ඇහුවෙ නෑ... මං ටිකක් සෙවිල්ලෙන් හිටියා... විශ්ව දූත් එක්ක කතා කර කර එනවා දවස් කීපයක්ම මං දැක්කා... එත්, අද වෙනකල් දූලයි අම්මාවත් මේ ගැන දැනගෙන හිටියෙ නෑ..."

අප්පච්චි දෙඩුවේ සෙමිනි. නැවතිල්ලේය.

"කොහොමවුණත්... මේ සම්බන්දෙට කැමතිවෙන්න නං බෑ පුතා..."

විශ්ව උන් තැනින් නැගිට්ටේ මා නොසිතූ තරම් වේගයකිනි. මම තිගැස්සී ඒ

ඇස් දෙස බැලීමි. ඔහු මා දැක්කේ එවේලේය. අප සිව්නෙත් ගැටුණු සැනින් ඔහුගේ ඇස් දුකින් සේ පුංචි විණි. මටත් රිදිණි. ඊළඟ තත්පරයේ ඔහුගේ ඇස් හැරුණේ අප්පච්චි දෙසටය.

"සර්... මට කවිතා ඕන..."

"මගෙ ජීවිතේ මගෙන් ඉල්ලන්නෙපා පුතා..."

විශ්ව මා ළඟට ආවේය. මට හැඬිණි. ඔහු මගේ අත තදකොට අල්වා ගත්තේය.

"යං මං එක්ක..."

විශ්ව මා ඇදගෙන සාලයටම ගියේය. මම බියෙන් මුසපත් ඇස් ඔබ මොබ යවා පිළිසරණක් හෙව්වෙමි.

"මං දැං අරන් යනව කවිතාව..."

විශ්ව කෑ ගැසුවේය. මම හෙමීට... හෙමීට... වචන එකතු කළෙමි.

"දැං යන්න විශ්ව... මං වෙන කාගෙවත් වෙන්නෑ... හොඳ දරුව වගේ යන්න මගෙ රත්තරං... මං කවද හරි ඔයා ගාවටම එනව..."

මම නැවතිල්ලේ කීවෙමි. මගේ අත හයියෙන් මිරිකාගත් ඔහු ආපසු හැරිණි. සුදීපත්, විශ්වත්, අපේ කඩුල්ලෙන් පැන යනකල්ම බලා හිඳී මා කාමරයට යන්නට හැරුණා පමණි. අප්පච්චි පපුව අල්ලාගෙන ළඟ තිබූ පුටුවකට ඇලවිණි. මට කෑ ගැසිණි. මගේ කෑ ගැසීමටදෝ විශ්වලා ආපසු දුවගෙන ආහ. එවේලේම ඔහු වෛද්‍යවරයෙකු ළඟට අරන් ගියේ විශ්වත් සුදීපත්ය. බෙහෙත් අරන් ආවාට අප්පච්චිට හරිහැටි සනීපයක් නොවිණි.

එන්න එන්නම ඔහුගේ සෞඛ්‍ය තත්වය පිරිහිණි. විටෙක බලාගත් අත බලාගෙන කල්පනා කරන අප්පච්චි, විටෙක තනිවම සිනාවෙයි.

"මට සමාවෙන්න මයෙ අප්පච්චි..."

මම අප්පච්චි ඉන්න තැන බිම දණ ඔබා ඔහු දෙදණහිස් මත හිස හොවා ඉකිගසා හැඬීමි. වෙනාද මා හඬද්දී මා හිස පිරිමැද නාඬා ඉන්නැයි කියනා අප්පච්චි නිහඬවම හිඳී. මම හිස ඔසවා බලමි. ඔහු නිනව් නැතිවා සේ ඈතක් බලාගෙනය.

"අප්පච්චි ලෙඩ වුණා විශ්ව..."

ඊට පසුව විශ්ව හමුවූ දා මම කීවෙමි. ඔහු උවමනාවෙන් මා දෙස බලා උන්නේය. මම සුදු වෙරලේ වූ සිහින් තණකොළ ගසක් පයේ ඇඟිලිතුඩු අගින් පොඩි කර දැමීමි.

"කවි..."

මම බිමට බරකොට ගෙන උන් දෑස හරවා විශ්ව දෙස බැලීමි. ඔහු මොනවා දෝ කියන්න හදයි.

"මයෙ අප්පච්චිව හොඳ කරලා දෙන්න විශ්ව..."

විශ්ව වෙරළේ වූ පොල් ගසකට පිටදී දෑත් පපුවේ බැඳ මා දෙස බැලුවේය. මම ඒ දෑත් මත හිස ගසාගෙන හැඬුවෙමි. විශ්ව එකාතකින් මා තුරුළුකොට ගෙන, අනෙක් අතින් මගේ හිස හෙමිට පිරිමැද්දේය.

"මට කරන්න පුළුවන් දෙයක් තියේනං කියන්න කවි..."

"මට තේරෙන්නෑ... අප්පච්චි බලාගත්තු අත බලාගෙන කල්පනා කරනව..."

"මේ හැම දෙයක්ම මං හින්දා..."

"නෑ විශ්ව... මයෙ පච්කාරකම හින්දා..."

විශ්ව මගේ මුහුණ සිය ළමැදට තෙරපවා ගත්තේය. මම ඇස් පියා ගතිමි. කළුවර වැටෙනතෙක්ම උන්නේ ඒ විදිහටය.

"රෑ වුණා..."

විශ්ව කියයි. මම කිසිත් නොකීවෙමි. මට ඇසෙන්නේ විශ්ව කියනා දේ නොවේ. මූදේ රළ බිඳෙන හඬය.

"යං කවි..."

විශ්ව මා අතින් අල්වාගෙනම ඉස්සර විණි.

"මට තේරෙන්නෑ කවිතා... මං හිතුව මං ගැන හොඳට දන්න ඔයාගෙ අප්පච්චි, මට කැමති වෙයි කියල..."

"අප්පච්චි අකමැති ඔයාට නෙවේ..."

"එහෙනං...?"

"පිංවත්තෙ ඉන්න ඔයාගෙ මාමලට... ඒ ගොල්ලො ටිකක් චණ්ඩිලු... අපේ අප්පච්චි අහිංසකයිනෙ... එයා ඔය මැරකම් වලට බයයි..."

"කෙල්ලෙ... ඔය කියන තරම් අපේ මාමල නරක නෑ... අනික... මං මෙහෙ ඉන්නෙ ඉගෙන ගෙන ඉවර වෙනකල්... රස්සාවක් හම්බුණු ගමන් අපි බැඳල කඩුග න්නාවෙ අපේ ගෙදර යමු..."

විශ්ව මගේ අතැඟිලි තුඩු හයියෙන් මිරිකා ගත්තේය. ඔහු ආදරේ කී මුල්ම දා සේ මම සීතලව ගියෙමි.

"කවිතා..."

"ම්..."

"අපි අප්පච්චිව ඩොක්ටර් කෙනෙකුට පෙන්නමු..."

"ඔයා උදව් කරනවද?"

"සත්තයි..."

ඔහු මගේ මුහුණට ළං වී කීවේය. මම සැනසුණෙමි.

"මං ගෙදරටම එන එක හරි නෑනෙ කවි... ඔයා යන්න මං බලාගෙන ඉන්නං..."

ගේ කිට්ටුවට ආ විශ්ව කීවේය. මම ඔහු දෙස බලා හිනැහී ආපසු හැරුණෙමි. වෙනදාට වසා තිබෙන කඩුල්ලේ උණ ලී පන්නා දමා තිබිණි. මා වත්තට ඇතුළු වී ගේ දෙස බැලුවේ අප්පච්චීවත් දෙරකොඩ වෙත්දැයි බලන්නටය. අප්පච්චි කෙසේ වෙතත්, ඉස්තෝප්පුවේ කීප දෙනෙකුම ඉන්නවග මට පෙනිණි. හිත තිගැස්සුණේ මන්දැයි නොදනිමි. මම හනිකට ගෙදරට දිව්වෙමි.

මා නිවෙසට ගොඩ වෙද්දී සියල්ල සිදුවී හමාරව තිබිණි. මම කෑ ගැසීමි. අම්මා දෑත් පපුවට ගසාගෙන හැඬුවාය. සාලයේ උන් සියල්ලෝම මා දෙස බලනු මම දුටුවෙමි. ඒ හැමෙකකම නොවේ... මගේ ඇස් ළඟ නතර වුණේ එකම එක දෙයකි. මයෙ අප්පච්චි... මයෙ රත්තරං අප්පච්චි හැමදාම ඉඳගන්නා දිග හාන්සි පුටුව හිස්ව තිබිණි. සාලයේ බිත්තියේ ගසා තිබූ අම්මාගේත් අප්පච්චිගේත්, මගුල් පිංතූරය නොපිට හරවා තිබිණි.

"අනේ පුතේ අප්පච්චි..."

මා දුටුවනම අම්මාට කෑ ගැසිණි. මම අම්මා ළඟට වීමි. කෑ ගසා ඉකි ගසා හඬන්නට සිතුණත්... ඇස්වලට කඳුළු නොඑන්නේ මන්දැයි නොවැටහේ. අම්මා කියව කියවා හඬයි. මම ඈට තුරුළු වී ඇස් පියා ගත්තෙමි.

අප්පච්චිගේ මිනිය ගෙනාවේ පසුදා උදේය. හඬා හෙම්බත්ව උන් අම්මා එතැනටම වී පුටුවක් තබාගෙන හිඳ ඇස්පිය නොහෙලා අප්පච්චිගේ නිසොල්මන් මුහුණ දෙස බලා හිඳී. මට එදෙස බලා හිඳිය නොහේ. මම මගේ කාමරයට වී ඊළඟට කරන්නේ මොනවාදැයි සිතුවෙමි.

"කවිතා..."

හිටිහැටියේම කාමරයට එබුණේ ශිරෝමිය. ඈ පසුපසින් විශ්වත් ඔහුගේ මිතුරන් කිහිප දෙනෙකුත් විණි.

"මොනාද කෙල්ලෙ වුණේ..."

ශිරෝමි අහද්දී මම දන්නෑ කියන්නට වගේ හිස දෙපසට සැලුවෙමි. විශ්ව ළඟට විත් හෙමීට මා හිස අතගෑවේය.

"මං ගාව ඉන්න... මේ වෙලාවෙ මාව තනි කරන්නෙපා..."

මම බිම බලාගෙනම මිමිණුවෙමි.

"මට තේරෙන්නෑ මේ වගේ ගින්දරක් කොහොම උහුලන්නද කියල... මං ගෙදරින් යද්දි හොඳට ඉඳපු මයෙ අප්පච්චි... දැං කෝ... දවල් හොඳට හිටියා විශ්ව... කවුදෝ ඇවිත් වැට අයිනෙ කතා කර කර හිටියලු... ඊට පස්සෙ අප්පච්චි ඒ මිනිහට බැන්නලු... ඔයාගෙ නමයි මගෙ නමයි කියනවත් ඇහුණලු... ටිකකින්... ටිකකින්... අම්මා බලද්දි වැට ගාව බිම වැටිල හිටියලු... අනේ එතකොටත් එයා අපිව දාල ගිහිංලු

විශ්ව..."

මම කඳුළු පොදි ගැහුණු ඇස්පිය උඩට ඉස්සීමි. කවුරුත් බලා උන්නේ මා දෙසය.

"ගමේ ගෑනු කතා වෙනව අප්පච්චි මැරුණෙ මං හින්දයි කියල... මට මේව උහුලන්න බෑ විශ්ව..."

ශිරෝමි මා තුරුළු කර ගත්තාය. මම හයියෙන් හැඬුවෙමි. ඊට පසු මොනවා වුණාදැයි මට හරිහැටි මතක නොවේ. දින දෙකකට පමණ පසු අප්පච්චිගේ අවසන් කටයුතු සිදු කෙරුණා නම් මට මතකය. වත්ත කෙළවරේ අරලියා ගස් සෙවණේ ඔහුගේ නිසල දේහය මිහිදන් කෙරිණි. ඒ වෙද්දී අප උන්නේ හඬාගන්නටත් බැරි තරම් තත්වයකය. සියළු වැඩ කටයුතු කළේ නෑයනුත්, ශිරෝමි විශ්ව හා ඔහුගේ මිතුරනුත් විසිනි. සත් දවසේ දානය තෙක්ම කවුරුන් හෝ නිවසේ රැඳිණි. එයින් පසු සත්තකින්ම අපි තනිවීමු. අම්මා හා මා කතා කළේ තෝරාබේරාගත් වචන කිහිපයක් පමණි. පාළු දැනුණද, හිත රිදුණද මම ඒවා ඉවසීමි. හැම හැන්දෑවකම විශ්ව ආවේය. අම්මා ඔහුට විරුද්ධ වුණේවත්, හිතවත්ව කතා කළේවත් නැත.

"අම්මා ඉන්නෙ තරහෙන්..."

දිනක් විශ්ව කීවේය.

"අම්මා ඉස්සර ඔහොම නෑ..."

"අප්පච්චිගෙ මරණෙ එයාව රිද්දල ඇති..."

"අප්පච්චි මැරුණෙ මං නිසා වග අම්මා දන්නවා... ඒ හින්ද මං එක්ක තරහයි..."

"හැමදාම ඔය ප්‍රශ්නෙ ගැන කියවල මාව පිස්සෙක් කරන්නෙපා කවිතා..."

මම ඔහුගේ උකුලේ හිස ඔබා ඉකිබිඳ හැඬීමි. විශ්ව හෙමීට මා හිස පිරිමදී. ඊළඟට මොනවා වෙදැයි ඊළඟට කුමක් කරන්නදැයි මට කෑ ගසා අසන්නට සිතේ. ඒත්, තවත් ඔහු රිද්දන්නේ කෙසේද?

"කවිතා..."

අම්මා ගෙතුළ හිඳ හඬගායි. මම හිස එසැවීමි. වෙනදා "මයෙ දෝණි" කියනා අම්මාට මා නිකම්ම නිකම් "කවිතා" වූ හැටි... පුදුමය.

"කවිතා..."

එවර නම් හඬ උස්ය. මම විශ්වට ඉන්නැයි කියා කුස්සියට ගියෙමි.

"අරයට කියපං මිනිස්සු හිනස්සන්නැතුව මෙහෙන් පිටවෙලා යන්නෙයි කියල..."

"කෑ ගහන්නෙපා අම්මා..."

මම රහසින් කීවෙමි. අම්මා මොන මොනවාදෝ මුමුණමින් කුස්සිය පැත්තෙන්

එළියට බැස්සාය. මට ඈ ගැන සේම විශ්ව ගැනද දුක සිතිණි. මා ආපසු ඉස්තෝප්පුවට ආවේ අම්මා කියැවූ දේ ඇසිණි නම්... සමාවෙන්නැයි කියා විශ්වට කියන්නටය. ඒත්... ඔහු එතැන නොවිණි. ඔහු යන්නට ගොසිනි.

ඉන්ද්‍රචාප ඇඳි අහසේ

හැංගෙන මන්දාකිණියේ

සෙනේහයේ සුවඳ රැඳී

අද වගේම හෙටත් තියේ...

ඉන්ද්‍රබිලයක් විලසේ

නිසසල වූ මගේ හිතේ

මේ විශ්වය තරම් විසල්

ආදරයක් ඔබට තියේ...

# 06

**ඊළඟ** ඉරිදා මා පුස්තකාලයට ගියේ විශ්ව එහි වෙතැයි සිතාය. ඒත්... ඔහු එහි නොවිණි. මම ඕනෑවට එපාවට සේ පොතක් දෙකක් තෝරාගෙන ආපසු එන්නට මඟට බැස්සෙමි.

"ෂ්... ෂ්..."

මා පුස්තකාලයේ ගේට්ටුවෙන් එළියට ආවා පමණි. ඒ පුරුදු හඬ මට ඇසිණි. ආපසු හැරුණේ සිතා  මතා නොවේ. පුරුද්දටමය. විශ්ව... මගේ ආදරණීය විශ්ව... මූදු වෙරළට වී මවුන්ටන් බයිසිකලයට හේත්තු වී මා එන දෙස බලා උන්නේය. මම ඔහු දෙස බලා සිනාසුණෙමි. ඒත්... ඒ ඇස්වල නම් සිනා පොදක් හෝ නොවිණි.

"විශ්ව..."

මා ඒ ඇස්වලට එබුණේ හිත මොකක්දෝ හේතුවකින් රිදෙද්දීමය. විශ්ව මා ඇස් මඟහැර බයිසිකලය තල්ලු කරගෙන පොල් රුප්පාව දෙසට ගියේය. වචනයක් හෝ නොදොඩාම මමද ඔහු පසු පසින් ඇදුණෙමි. බයිසිකලය පොල් ගසකට හේත්තු කළ විශ්ව හෙමීට මූද දෙසට ඇවිදගෙන යයි. මම පොත් කීපය බයිසිකලය උඩින් තබා විශ්ව පසු පසම යමි. මූදු හුළඟ හරි සැරය. මගේ දිග රැළි ගවොම සුළඟ හා පොර බදන්නේ මටද නවත්වා ගත නොහැකි ලෙසිනි.

"විශ්ව..."

මම කෑ ගැසුවෙමි. දෙවියනේ... තවත් මේ සා දුක් දැරිය හැකිද? විශ්ව මූදු වෙරළේ බිම හිඳගත්තේය. මම දුවගෙන ගියෙමි. ඔහු ළඟින්ම හිඳ ගත්තෙමි. ඔහු උරහිසට හිස තියාගත්තෙමි.

"මට කියන්න විශ්ව... මොකද ඔයාට මේ වෙලා තියෙන්නෙ..."

ඒත්... ඔහු කතා කළේ නැත. මම ඔහු සුරත මා අත්ලට ගෙන ඒ ඇඟිලිතුඩු හයියෙන් මිරිකාගත්තෙමි.

"විශ්ව... කියන්න දෙයියනේ... ඇයි මට මේ විදියට වද දෙන්නෙ... ඔයාම දන්නවනෙ... මං කොහොමද ජීවත්වෙන්නෙ කියල... මං මහා අසරණියෙක්... ජීවත් වෙන්න තියෙන එකම බලාපොරොත්තුව ඔයා... ඔයා හිටියෙ නැත්තං මං මැරෙන්නෙ මයෙ අප්පච්චි මැරුණු දවසෙ... කියන්න මගෙ විශ්ව... ඔහොම කතා නොකර ඉන්නෙ මගෙන් පලිගන්නද? අනේ... එහෙම කරන්නෙපා දෙයියනේ... ඔයාගෙ අහිංසකීගෙ හිත හයිය නෑ... ඒ තරං දුක් විඳින්න..."

මම කියවාගෙන ගියෙමි. විශ්ව අසාගෙන ඉන්නට ඇත. පපුව හිරවී මා මියෙතැයි මට සිතුණේ වරක් දෙවරක් නොවේ. විශ්ව... මේ තරම්ම මා රිද්දන්නේ ඇයි? මට හැඬිණි. මම හිඳි වනම හිඳ ඉකිගසා හැඬුවෙමි.

"කවිතා..."

විශ්ව එකාතකින් මා තුරුළුකොට ගෙන අනික් අතින් මගේ මුහුණ උඩට උස්සා මගේ ඇස් දෙසම බලා උන්නේය. අනේ, හිත ඇවිලී ගිය තරම පහදා කිවහැකි නොවේ. මම ඇස් පියා ගතිමි. විශ්ව හෙමීට මගේ කම්මුල් සිම්බේය. ඔහු හෙලන හැම හුස්මක්ම මගේ මුහුණේ තැවරිණි. කඳුළු වලින් සීතලව තිබුණු මගේ කම්මුල් පිච්චුණේ ඒ සුසුමක වේගයටය.

"කවි..."

"ම්..."

"අම්මට කියන්න මට අර විදිහට කතා කරන්නෙපා කියල..."

මට සියල්ල වැටහිණි. ඔහු මේ පළිගත්තේ එදා අම්මා බැන්නාටය.

"අම්මා කෑ ගහන්නෙ හිතේ වේදනාවට... ඔයා ගනන් ගන්නෙපා... තව ටික දවසකින් අම්මට ඕව අමතක වෙලා යාවි... ඔයා එන්න... ඇවිත් වෙනදා වගේ අම්මත්තෙක්ක කතා කරන්න..."

"කතා කරන්නෙ කොහොමද... මගෙත් එක්ක වචනයක්වත් කතා නොකරද්දි..."

"තේරුම් ගන්න විශ්ව... අම්ම ඉන්නෙ දරාගන්න බැරි තරං පීඩනයකින්... ඔයා එක්ක තියා මාත් එක්කවත් කතා කරන්නෑ ගෙදරදි..."

"මට ඔය ආඩම්බරකම් බලල පුරුදු නෑ..."

කලකට පසු මට සිනා නැගිණි. විශ්වනම් පුදුමාකාර චරිතයකි. මා හිස ඔසවා බැලුවේද ඒ සිනාවෙන්මය. ඒත්... විශ්ව මට රැව්වේය. මම මූණ බිමටම ඔබා ගත්තෙමි.

"ඔයා... ඔයා... නපුරුවෙලා විශ්ව..."

ආයාසයෙන් නොවේ. නොදැනීම මට කියැවිණි. විශ්ව මා සිය පපුවට තබා තද කොට ගත්තේය. ඔහු ළඟ සුවඳය. සුවඳම සුවඳය.

"විශ්ව..."

මම හෙමීට කොඳුරමි. විශ්ව හෙමීට මා හිසත් පිටත් පිරිමදී. මම හෙමීට ඒ පපුතුර සිඹිමි.

"විශ්ව..."

"ම්..."

"මට නපුරු වෙන්නෙපා විශ්ව... මං අසරණයිනෙ හුඟක්... මං ඔයාගෙනෙ හැමදාම... මට දුකයිනෙ ඔයා බැන්නම... ඒ හින්ද මට වෙනස්කම් කරන්නෙපා..."

"නෑ කෙල්ලෙ... ආයි කවදාවත් රිද්දන්නෑ..."

විශ්ව හයියෙන් මා මිරිකා ගත්තේය. මම සසල වීමි. කෑ ගසා හඬන්නට තරම දුක් ගොන්නක් හිත පතුලේ වේ. මම හිතමි. විශ්ව... අනේ මේ ආදරේ නම් ඈතකට අරන් යන්න එපා... මම මගේ හිතටම කියා ගත්තෙමි.

කොහොමටත් ඊට පසු විශ්ව මා රිද්දුවේ නැත. ඔහුද උන්නේ වෙනදාට වඩා මහ හුඟක් සතුටෙනි. හේතුව, ඔහුට රැකියාවක් ලැබීමය. ඒ පුද්ගලික ආයතනයක සහාය කළමණාකරුවෙකු ලෙසිනි. මම සතුටු වීමි. අප්පච්චි මියැදුණාට පසු මා දරන 'නට බැරි සතුටනක් අත්වින්දා නම් ඒ එදාය.

"අම්මා විශ්වට රස්සාවක් හම්බුවෙලා..."

මම අම්මා ඇඳුම් මසමින් උන් තැනට ගොස් කීවෙමි. උවමනාවට එපාවට සේ වරක් මා දෙස බැලූ අම්මා නැවතත් මැහුමෙහි නිරත විණි. අප්පච්චිගේ විශ්‍රාම වැටුපෙන් පමණක් සියල්ල කළ නොහැකි වග දන්නා අම්මා ගමේ මිනිසුන්ගේ ඇඳුම් මසා කීයක් හෝ හොයාගන්නීය. මට ඈ ගැන දුක සිතේ. ඈ මේ සා දුක් විඳින්නේ මා නිසාය.

"අම්මා... විශ්වට ප්‍රයිවෙට් ෆර්ම් එකෙක ජොබ් එකක් හම්බුවෙලා..."

"අපට වැඩක් තියේය..."

"පව් අම්මා... හැම තිස්සෙම විශ්වට බනින්නෙපා..."

"අප්පච්චි මරාගත්තු එකා..."

අම්මා තනිවම මුමුණන්නීය. මට දුක සිතේ. විශ්ව ගැනවත්, මියැදුණු අප්පච්චි ගැනවත් මා ගැනවත් නැති තරම් දුකක් අම්මා වෙනුවෙන් මගේ හිතේ ගොඩ නැගේ. ඈ තවමත් විඳවයි. අප්පච්චි මතක් කර කර හඬයි. දෙවියනේ... මේ හැමෙකක්ම මා නිසා නොවේද? මේ හැමෙකක්ම සිදුවුණේ මගේත් විශ්වගේත් අහිංසක ප්‍රේමය නිසා නොවේද?

"මේක තියාගන්න වියදමට..."

රැකියාවෙන් ලද මුල්ම වැටුපෙන් කොටසක් මා අතට දෙන අතරේ විශ්ව කීවේය. මා දෑස් කඳුළෙන් පිරිණි.

"සල්ලි එපා විශ්ව..."

"තියාගන්න... දැං කැම්පස් පටන් ගත්තම..."

"අප්පච්චිගෙ පෙන්ෂන් එක තියෙනවනෙ... අම්මත් ඇඳුම් මහනවනෙ විශ්ව..."

"අම්මට කියන්න ඇඳුම් මහන්නෙපා කියල... මං උදව් කරන්නං මට පුළුවන් විදිහට..."

මම නිහඬ වෙමි. විශ්ව කෙසේ කීවත් මා ඔහුගෙන් මුදල් ගන්නේ කෙසේද? මා මුදල් නොගත් තැන ඔහු මගේ බැංකු පොත රැගෙන ගියේ එයට මුදල් දමන වග පවසමිනි.

හෙමීට තවත් දින කීපයක් ගෙවිණි. දැන්නම් ගෙදරටම වී හිඳ මටම එපා වී ඇති ලෙසකි.

"ඔයා ටියුෂන් කරන්න පුංචි ළමයින්ට... මං උදව් කරන්නං ළමයි ටිකක් හොයාගන්න..."

එදා හවස ගෙදර ආ විශ්ව කීවේය. සත්තකින්ම මම සැනසුණෙමි.

"සතුටුයි නේද?"

විශ්ව මගේ ඇස්වලට එබුණේය. මම සිනාසී ඔහු උරහිසට හිස තියාගත්තෙමි. විශ්ව හෙමීට මා හිස පිරිමැද්දේය. මම ඇස් පියා ගත්තෙමි.

"කෝ අම්මා..."

"කුස්සියෙ..."

"මොනවද කරන්නෙ...?"

"උයනව වෙන්නැති... රෑට..."

විශ්ව මගේ මුහුණ උඩට උස්සා හෙමීට මා කම්මුල් සිඹ ගත්තේය.

"ඕ...ය... අම්ම ආවනං...."

"ඔයාමනෙ කිව්වෙ අම්මා කුස්සියෙ කියලා..."

"නරකයා... "

මම කියමි. ඔහු හිනැහෙයි. මම ඔහු සුරත මගේ අතැඟිලි තුඩුවල පටලවා ගතිමි. විශ්ව මා අතැඟිලි මිරිකා ගත්තේය. මම පිච්චී ගියෙමි. විශ්වගේ ආදරය ගැන සිහිවූවාට නොවේ. මේ නිසා විඳවන මයෙ අම්මා සිහිවූ නිසාය. මගේ හිතට මොකක්දෝ විණි. ඇස්වලට කඳුළු පිරිණි.

"කවි..."

විශ්ව මගේ ඇස් දෙසම බලාගෙනය. මම ඒ ඇස් මඟ හැර කඳුළු වසන් කළෙමි. විශ්ව සුසුමක් හෙලුවේය. මගේ හිත හොඳටෝම පෑරී තිබිණි.

"මං හෙට එන්නං..."

ඔහු හිඳ උන් තැනින් නැඟිට්ටේය. මම ඔහු අතේ එල්ලුණෙමි. මිදුල තෙක්ම මා අල්වාගෙන ආ විශ්ව මා අතැරියේ අඹ ගහට හේත්තු කොට තිබූ මවුන්ටන් බයිසිකලයට නැඟගත් පසුවය.

"මොනවද ගේන්නෝනෙ...?"

"සතුට..."

"තව...?"

"ආදරේ..."

"තව...?"

"ජීවිතේ..."

"ඉතිං ඔය ඔක්කොම දුන්නම මට මොනවද දෙන්නෙ...?"

"මගෙ ආදරේ..."

"එහෙම බෑ... කිස් එකක් ඕනෙ..."

විශ්ව තාලෙට කියවයි. මම නොමනාපයෙන් මූණ රතුකරගත්තෙමි. ඔහු ආපසු හැරෙන්නේ තවත් වරක් මගේ කම්මුලක් සිඹ අහවරය. මම බලා ඉමි. කළුවරේම ඈතට ඇදෙන ඔහු දෙස අඳුරට ඇස් හුරු කරවාගෙන මම බලා ඉමි.

ආදරේ හීන දොරකොඩ ළඟින්
හුළඟටත් ඇහෙන්නැති වේගයට
ඇවිද එමි ආදරෙන් ආදරෙන්
එනතුරා ඔබ ඉන්න මඟ බලන්...

කෝඩුවේ ගැහෙන මනමාල ඇස්
බල බලා ඉන්නවා හඬන්නට
අමාවක කළුවරෙන් මඟ අහන්
එනතුරා ඔබ ඉන්න මඟ බලන්...

සාගරේ සේ සසල දෙකම්මුල්
ඔබෙ දෙතොල් පෙතිවලින් සිඹිනකොට
ළඟට වී හිඳින්නට බෝ පෙමින්
එනතුරා ඔබ ඉන්න මඟ බලන්...

පාළුවේ ගෙවුණු එක කල්පයක්
ගෙවා නිමකර ඔබේ දෙපා යුග
සිඹ ගන්න එමි අදම බැති සිතින්
එනතුරා ඔබ ඉන්න මඟ බලන්...

# 07

**වෙලාව** හවස පහට පමණ වෙන්නට ඇත. බැසයන්නට තනන හිරු එළිය මිදුල පුරා නෙක රටා අඳී. තාම කළුවර අහලකවත් නොවේ. දහවල දිගු වැඩි ඇයිදැයි විටෙක මට සිතේ. තවත් වටෙක මට සිතෙන්නේ මා දහවලට මේ තරම් අකැමැති ඇයි කියාය. මම සිතන්නට වුණෙමි.

දහවල මට හිනැහෙන්නට ඇරයුම් කරයි. මුළු හදවතින්ම හිනැහෙන්නට නො හැකි තැන මම බොහෝ අසරණ වෙමි. මගේ හිත රිදේ. මා දුක හිරකරගෙන ඉන්නේ අසීරුවෙනි. නමුදු රැය එසේ නොවේ. එය මට හඬන්නැයි කියයි. මම හොඳටෝම හඬමි. මගේ දුක නිවේ. රැට මා හඬන වග කවුරුනුත් දකින්නේ නැත. මම සුවපත් වෙමි.

"බලාගෙන... සමනලයො රැවටෙයි මලක් කියල..."

මම වේගයෙන් හිස හරවා බැලීමි. දිගු දෑස, ඕනෑම කෙල්ලෙක් වශීකරගත හැකි සිනාව, පිරුණු කම්මුල්, මගේ ඒ එකම බැල්මට හසුවිණි.

"විශ්ව..."

"භාවනා කළාද කෙල්ලෙ..."

ඔහු බොහෝ වේලාවක් මා දෙස බලා ඉන්නට ඇත.

"ඒ පාර මොකෝ..."

විශ්ව හෙමීට මගේ කම්මුලකට ඇඟිලිතුඩු අගින් තට්ටු කළේය. මම තිගැස්සී බැලීමි. අප මෙසේ හිඳිනු කවුරුවත් දුටුවොත්...

"මොකෝ බයවෙලා වගේ..."

"බය නැද්ද කොටියෙක් ළඟ ඉන්නකොට..."

"මො...කක්ද කිව්වෙ... කියපං බලන්න තව පාරක්..."

"බෑ... එක පාරයි කියන්නෙ..."

"හිටපං උඹට..."

විශ්ව මා අල්වා ගන්නට හිතාගෙන ළං වෙද්දී මම අහකට පැන දිව්වෙමි. ඔහු මා පසුපස මඳ දුරක් විත් නතර විණිද මා නතර වුණේ ගෙතුළටම ගොස්ය.

"නාඩගං නටනවද?"

අම්මා රවා බැලුවාය. මම මිදුල දෙස බැලීමි. විශ්ව ඉස්තෝප්පුවට විත් එහි තිබූ වේවැල් පුටුවකින් හිඳ ගත්තේය.

"මගෙන් හොඳවයින් අහගන්නැතුව අරයට යන්න කියපං..."

අම්මා මසමින් උන් මැහුමෙන් ඇස් ඉවතට නොගෙනම කිව්වාය. මගේ හිත රිදිණි. හිත රිදුණු තරම පහදා කිව හැකි නොවේ. මම කඳුළු ඇස් පත්ලේම තෙරපවා ගතිමි. පපුව රිදුම් දුන්නේ විශ්ව ගැන උපන් දුකටය. මම හෙමීට ඉස්තෝප්පුවට ගියෙමි. විශ්ව ඇඟිලි තුඩු අගින් පුටු ඇන්දට තට්ටු කරමින් උන්නේය. ඒ සුදු දිගු අතැඟිලි අගිස්සෙන් මා හිස පිරිමැද්ද දා දැනුණු උණුහුම මට මතක් විණි. විශ්ව මට ආදරේ වග අම්මා පිළිනොගනී. ඈ හිතන්නේ ඔහු සල්ලිකාර සෙල්ලක්කාරයෙකු බවයි. මට විශ්ව අත්හැරිය නොහේ. අම්මාටත් විශ්වටත් මැදිව මම සීතල යුද්ධයක් කරමි. ඒ දෙදෙනාටම මම මගේ කඳුළු නොපෙන්වමි. මට අම්මාත් විශ්වත් දෙදෙනාම අවැසිය.

"කවිතා..."

විශ්ව නැගිට මා දෑසට එබිණි. මම හිනැහුණෙමි.

"ඔය තරං අසරණ විදිහට මං දිහාවෙ බලන්නෙපා... මං කැමති නෑ ඔයා මං ඉස්සරහ වුණත් ඔය හැටි අසරණ වෙනවට..."

"නෑ විශ්ව..."

"ඔයා මොනවට හරි හොඳට විඳවනව..."

විශ්ව නැගිට එළියට බැස්සේය. මම ද ඔහු පසුපසට වීමි.

"අ...නේ... ඔය යන්නද හදන්නෙ..."

"නෑ... අපි එළියට ගිහිං ටිකක් කතා කරමු..."

මම විශ්වගේ අතක එල්ලී ගතිමි. මට යම් තරමක සහනයක් දැනේ. විශ්ව අද ටිකක් වෙනස්ය. වෙනදා සේ නොව, අද ඔහු කතා කරන්නේද මෘදුවය.

"කවිතා..."

"ම්..."

විශ්ව මගේ අතැඟිලි තුඩු තදකොට මිරිකා ගත්තේය. ප්‍රේමණීය හැඟීමකින් මම දැවී ගියෙමි. තවත් යමක් නොකී නමුදු වත්ත කෙළවරේ ලොකු කළුගල් වැටිය ළඟට එනතුරුම ඔහු මා අතැරියේ නැත. වෙනදා නම් මෙලහකටත් මොනවා හෝ කියා මා රිදවා ඔහු යන්නට ගොසිනි. මම හිස හරවා හාත්පස බැලීම. යාන්තමට අඳුරු පරිසරය පුරාම වෙනනේ මහා නිහඬකමකි. අපි ටිකක් දුර ආ බැවන් නිවෙස පෙනෙන්නේ මඳක් කුඩාවටය. එහි විදුලි පහන් දැල්වුණේ දැන්ය. මට අම්මා ගැන දුක සිතිණි. මා මෙසේ මෙතැන හිඳිනු දුටුවොත් ගම්මු දොස් කියන්නේ අම්මාටය. මට විශ්ව මෙතැන දා අම්මා ළඟට දුවන්නට හිතේ. ඒත්, විශ්ව අතැර දා යා නොහැකි දුකකින් මම ඔහු දොස් බලමි. අඩ අඳුරේ වීද, මට ඔහුගේ දිලිසෙන ඇස් හොඳින් පෙනෙයි.

"කවිතා..."

"ම්... ම්..."

"අපි බඳිමු..."

මම ගැස්සුණෙමි. විශ්ව මා තදකොට වැළඳගත්තේය. මට මහා උණුහුමක් දැනිණි. ඒත්, අනේ මයෙ අම්මා ගෙදර තනිවමය. විශ්ව බලා හිඳිද්දීම මම ඔහුගෙන් මිදී ගෙදරටම දිව්වෙමි. අම්මා මඟ බලා උන්නාය. මගේ පපුව ඇවිලිණි. මම හිනාවකින් දුක හංගාගෙන කාමරයට වැදී එහි ජනේලයෙන් වත්ත කෙළවර දෙස බැලුවෙමි. විශ්ව තවමත් එතැනමය. අනේ මට රිදුණු තරම්...

මම හිත හදාගන්නට බොහෝ වෑයම් කළෙමි. මගේ මොකක්දෝ වාසනාවකට විශ්ව මගේ හිත හඳුනාගෙන උන්නේය. ඒ හින්දාම වෙන්නට ඇත...

ඒ ඉරිදාවේ අපට නොදන්වාම විශ්වගේ අම්මලා මා බලන්නට පැමිණියහ. අම්මා වෙනසක් නොපෙන්වාම ඔවුන් හා කතා කරද්දී මම කාමරයට වී සියල්ල අසා උන්නෙමි. හිතේ වන්නේ මහා දෙගිඩියාවකි. බියකි. සියල්ල හොඳින් විසඳේ නම්... විශ්ව මගේ වේ නම්... මට කල්පයක් වුවද බලා සිටිය හැක. ඒත්, ඒවා ඒ ආකාරයටම විසඳෙයිද?

"දෝණී... තේ හදන්න..."

අම්මා කාමරයට එබී කීවාය. මම කුස්සියට ගියෙමි. තේ හැදුවෙමි. ඒ අතරේද බොහෝ දේ සිතුවෙමි. මට හිතන්නට බොහෝ දේ වේ. විශ්වගේ අම්මලා... ඔවුන් මට කැමති වෙයිද?

"දූත් මෙහෙන් වාඩි වෙන්න..."

විශ්වගේ අම්මා කීවේ මා ඈ ළඟින් හිඳුවා ගන්නා ගමන්ය. මම හොරෙන් විශ්ව දෙස බැලුවෙමි. ඔහු ඇස් පුංචි කර සිනාසේ. මට ආදරේ හිතේ...

විශ්ව මට ඔහුගේ අම්මාත්, තාත්තාත්, හඳුන්වා දුන්නේය. මම ඔවුන් හා සිනාසී නැවත වරක් බිම බලා ගත්තෙමි. හිත තිගැස්සෙයි. සිතුවිලි ලිහී අවුල් වෙයි. මේ ගෙවන්නේ ජීවිතයේ මා ගත කළ අසීරුම විනාඩි කීපය නොවන්නේද?

"අම්මත් කැමතිනං... වැඩිකල් නොයවා මේ කටයුත්ත එකලාසයක් කරල

දාමු..."

විශ්වගේ තාත්තා කීවේය. මගේ හිත තිගැස්සිණි. ඊළඟට මයෙ අම්මා මො නවා කියයිද? මම අම්මාගේ මුහුණ දෙස බැලුවෙමි. ඈ උන්නේ කැබිනෙට්ටුව මත වූ අප්පච්චිගේ විසල් ඡායාරූපය දෙස බලාගෙනය. මගේ හිත රිදේ. දුක බිඳෙන්නට ඔන්න මෙන්නය. දුකින් බිමට බරවුණු මගේ මුහුණ එකිනෙක හා වේගයෙන් ගැටෙන ඇසිපිය, සැලෙන කම්මුල්... විශ්ව ඒවා දකින්නට ඇත.

"කවි..."

ඔහු මා අතින් අල්වා නැගිට්ටෙව්වේය. මම දුකින් අසරණ ඇස් ඔබ මොබ යැව්වෙමි.

"අපි එළියට යං..."

විශ්ව මිදුලට බැස්සේ මාද අතින් අල්වාගෙනමය. අපි වත්ත පහළ ගල්වැටිය ළඟටම ගියෙමු.

"මතකද මෙතන..."

විශ්ව ඇසුවේ ගල්තලාව මත හිඳගන්නා ගමන්ය. මම හිස සලා ඔහු දෙස බලා නැගෙන්නට ආ සිනාව දෙතොල් අතරේම තෙරපවා ගත්තෙමි.

"වාඩිවෙන්න මෙතනින්..."

විශ්ව කීවේය. මම ඔහු ළඟින්ම හිඳ ගත්තෙමි. විශ්ව මගේ උරහිස වටා අත යවා මා තුරුළු කරගත්තේය. "කවුරුත් දකියි විශ්ව..."

"කවුරු දකින්නද මේ කැලේ..."

මට සිනා නැඟිණි. මම විශ්වගේ ගෙළ මුල මුහුණ හංගාගෙන සිනාසුණෙමි. ඔහු හෙමීට මා හිස පිරිමදී. මම ඇස් පියාගමි. හෙලන හැම හුස්මක්ම මගේ කම්මුල්වල තැවරේ. කම්මුල් කිතිකැවේ. මම ඔහුගේ අතැඟිලි වල මගේ අතැඟිලි පටලවා ගමි. විශ්ව මගේ අතැඟිලි තුඩු මිරිකා ගනී.

"ඉස්සර... මං මොන තරං නං චාටර් වුණාද අර පිටිපස්සෙ ගුරුපාර අයිනට වෙලා... හැමදාම හවසට මං එතෙන්ට වෙලා බලන් ඉන්නවා... ඔයා පාඩම් කරන්න එන්නෙත් මෙතෙන්ටනෙ..."

"හොරා..."

"හොරකමක් නෙවි කෙල්ලෙ... ලොකු ආදරයක් තිබුණා දැක්ක දවසෙ ඉඳන්ම හිතේ ඇතිවෙච්චි... ඒකයි මං ඔය තරම්ම උනන්දු වුණේ. ඔයා දන්නෑ මං ඔයා හින්ද දුක් විඳපු තරං... මතකද දවසක් මාව මගෑරල ගියා... අම්මත්තෙක්ක යද්දි මාත් පස්සෙන්ම ආවා මතකද... මං ඔයා අතින් වැටුණු ලේන්සුව අහුලලා දෙද්දි... මතකද ඒක ඔයාගෙ නෙවෙයි කියල මට රිද්දල ගියා... ඔයා දන්නවද මං කොල්ලෙක් වෙලත් මොන තරං ඇඬුවද කියල එදා ගෙදර ගිහිං..."

"වි...ශ්ව..."

මම අතැඟිලි තුඩු අගින් ඔහු මුව වැසීමි. විශ්ව මගේ අතැඟිලි එක්කොට අල්වා එය මුවට ළං කොට සිම්බේය. මම හාත්පස බැලීම. අවට ඇත්තේ ලා අඳුරකි. මම විශ්වගේ පපුතුරේ මුහුණ හංගාගතිමි. ඔහු ළඟ පිච්චමල් සුවඳකි. මම හෙමීට ඒ පපුතුර සිඹීමි. ඔහුගේ අතැඟිලි මගේ හිසකේ අතර එහෙ මෙහෙ වේ. ඇත්තම කියනවානම් මා උන්නේ මහා සැනසීමකිනි.

"කවි..."

"ම්..."

"මොනාද හිතන්නෙ...?"

"ඔයා හිතන දේමයි..."

"මං හිතන දේම...?"

"ම්..."

"ඉතිං... මං හිතුවෙ කොහොමද මේ මර උගුලෙන් ගැලවෙන්නෙ... කියලනෙ..."

"හරිනෙ විශ්ව... මමත් මේ එහෙම හිතල ඉවර වුණා විතරයි..."

මම සිනාවීමි. විශ්ව මා හයියෙන් තුරුළුකොට ගෙන කම්මුල් සිඹ ගත්තේය. බොහෝ කලකට පසු අපි දෙදෙනා හොඳටෝම සිනාවීමු.

සීතලට ගල් ගැහුණු තනි හිතට

කඳුළු පොකුරක් හොවමි හඬන්නට
උදුරගන්නට හිතී අතහැරිය
සුසුම් අඟුරකි ඔබේ ආදරය...

ඒකම තරුවක් නොමැති අහස යට
පිපුණු සුදු බිම්මලක් වගෙයි මම
පායනා තුරා රන් පුරා හඳ
බලා ඉමි ආදරෙයි කියන්නට...

ඒදා ආදරේ කී ඇස් වලට
හැංගිලා ඔබ ගිහින් ඈතකට
ගෙවෙන හැම තත්පරේ විඳවන්න
පෙම් කඳුළු මේ හැටිම සීතලද...

බොඳ වෙච්ච ඇස් දුකින් පුරවාන
මඟ බලා ඉන්නවා මං තාම
අඳත් වැහි කෝඩයට ඉස්සරින්
ඔබ එන්න ආදරෙන් අරගෙනම...

# 08

**මගේ** යෙහෙළිය ශිරෝමි, හිටි හැටියේම මා සොයා ආවාය. සතුටින්... බොහෝ සතුටින්... අපි තොරතුරු කතා බහ කළෙමු. අම්මා අපිට වැලිතලප පීරිසියක් හා තේ දෙකක් ගෙනැත් දී ගියාය.

"කොහොමද විශ්ව..."

තේ බොන ගමන් ශිරෝමි ඇසුවාය. මම සිනාසී බිම බලාගත්තෙමි.

"මො...කක් හරි හොරයක් තියෙනව..."

"විශ්වලයි අම්මා ආවා... ගිය ඉරිදා..."

"ම්... කොහොමද?"

"හොඳයි වගේ..."

"අම්මා මොනවද දැන් කියන්නෙ...?"

"තාමත් මට අම්මව තේරුම් ගන්න බෑ ශිරෝමි..."

ශිරෝමි නිහඬ වුණාය. වෙනදාට වැඩිපුර කියවන්නේ මාය. ශිරෝමි කරන්නේ මා කියන්නකට කම්මුල් රතුවෙනතුරු සිනාසීම පමණි. මේ ටික දවසකට අනේ මා වෙනස් වී ඇති තරම...

"හවස් වෙලා කෙල්ලෙ... වහින්නත් වගේ... මං ගිහිං එන්නං..."

ශිරෝමි ගියාය. ඈ ගොස් පැය බාගයක් යන්නට ලැබුණේ නැත. මහ හයියෙන් වහින්නට පටන් ගත්තේය. මම ඉස්තෝප්පුවේ කෙටි තාප්පය උඩින් වාඩි වී පාර දෙස බලා උන්නෙමි. සීතලය... හොඳටෝම සීතලය. විශ්වගේ ආදරය තරමම සීතලය. පාළුය. කම්මැලිය. වෙනදානම් මේ වෙලාවට විශ්ව එයි. අද තාමත් නැත්තේ

වැස්ස නිසා විය යුතුය. ටිකකින්...

ආදරේ හිතෙන ඒ ඇස් මා දෑස මායිමෙ මැවුණි. විශ්ව ඉහලගෙන ආ කුඩය හකුලා ඉස්තෝප්පුවට ගොඩවන තැන පඩිය උඩින් තැබුවේය. මම හිඳ උන් කෙටි තාප්පය උඩින් බැස්සෙමි.

"මං හිතුව ඔයා එන එකක් නෑ කියල..."

"ඒකද කොල්ලා වගේ තාප්පෙ උඩින් ඉඳගෙන හිටියෙ..."

"න්... නෑ..."

"මම බිම බලා ගත්තෙමි. විශ්ව අර අදින්නේ මට බනින්නටය.

"කෙල්ලෙක් වගේ හැසිරෙන්න කව්... ඔයා පුංචි ළමයෙක් නෙවේනෙ..."

විශ්ව හෙමීට මගේ කම්මුලක් පිරිමැද්දේය. මම ඇස් තදකොට පියා ගතිමි. ඒ පියාගත් ඇස් පිය අතරින් උණුම උණු කඳුළු ගුලි දෙකක් එළියට පැන්නේය. මම යටිතොල සපා ගතිමි.

"කව්..."

මම හිස එසැවීමි. විශ්ව මගේ කඳුළු දකින්නට ඇත. ඔහු තිගැස්සෙනු මම දුටිමි. විශ්ව මා සිය පපුතුරට තබා තද කොට ගත්තේය. මම ආයෙමත් ඇස් පියා ගතිමි.

"චූටියො..."

"ම්..."

"තරහ වෙන්නෙපා කෙල්ලෙ... මං ඔයාට වරදක් කිව්ව නෙවේනෙ..."

"මං තරහ නෑ විශ්ව..."

මම මිමිණුවෙමි. විශ්ව හෙමීට මා හිස පිරිමැද්දේය. මම ඔහු අතින් අල්වාගෙන ගෙට ගියෙමි. ඔහු කුස්සියටම මා හා ආවේය. මම උණුම උණු තේ කෝප්පයක් හදා එය ඔහුට දුන්නෙමි.

"මේ වගේ සීතල වෙලාවට තේ විතරක් තිබ්ල මදි..."

විශ්ව එකාතකින් මා තුරුළු කොට ගෙන හෙමීට මගේ කම්මුලක් සිඹ ගන්නා ගමන් කීවේය. මම කිති කැවී ගියෙමි. එළියේ හොඳටෝම වහියි. මම වැස්ස දෙස බලමි.

"කෝ අම්මා..."

"කාමරේ... නිදි ඇති... ප්‍රෙෂර් වැඩි වෙලාද කොහෙද... ඔලුව කැරකෙනව කිව්ව... මං බේත් පෙති දුන්නා... දැං නිදි..."

"යං බලන්න..."

මම විශ්ව කැටුව අම්මාගේ කාමරයට ගියෙමි. ගෙල තෙක්ම පොරෝනයෙන් වසාගෙන අම්මා හොඳටෝම නිදිය. අහේතුකවම මා හිත රිදිණි. අම්මා තනිවී ඇත. එය කළේ මාය. අප්පච්චී ලෙඩ වුණේ මා නිසාය. ඔහු මියැදුණේ මා ගැන හිතා හිත රිද්දාගෙනය. ජීවත්වෙන කාලයේ අප්පච්චී අම්මාට මොන තරම් ළෙංගතුව උන්නාද?

"එළියට යං කවි..."

විශ්ව මා අතින් අල්වාගෙන කාමරෙන් එළියට ගියේය. ආයාසයෙන් නොවේ. නිරායාසයෙන්ම මා දෑස පුරා කඳුළු ඉහිරිණි. විශ්ව එය දුටුවේ නැත. මම ඔහුට හො රෙන් කඳුළු පිසදා ගත්තෙමි.

තේ කෝප්පය සාලයේ ස්ටූලය මත තබා විශ්ව එතැන තිබූ පුටුවකින් හිඳ ගත්තේය.

"මෙතෙන්ට එන්න..."

ඔහු කීවේ එතැන වූ අනෙක් පුටුව පෙන්වන ගමන්ය. මම එතැන හිඳ ගන්නේ නැතිව විශ්ව උන් තැන බිම දණ ඔබා ඉඳ ගත්තෙමි.

"ඇයි රත්තරං මේ...?"

මෘදුව, වඩාත් මෘදුව ඔහු ඇසුවේය. මගේ දෑස ඇවිලිණි. මම ඔහුගේ දෙදණහි සේ හිස තබා ඉකිගසන්නට වීමි. ඔහු බොහෝ දේ තේරුම් ගන්නට ඇත. නිවාඩු දවසක කොහේ හෝ යමුයි කියා ඔහු යෝජනා කලේ ද ඒ නිසා වෙන්නට ඇත.

මම එකඟ වුණෙමි. ජීවිතයට මොකක් හෝ වෙනසක් අවැසිය. ඒ අනුව... විශ්වට නිවාඩු ඇති දවසක අපි කන්දේ විහාරයට ගියෙමු. යනතුරුම විශ්ව කළේ මා හිනස්සවන්නට එක එක දේ කී එකය. මම හිනැහුණෙමි. ඒත්, කතා කළේ අඩුවෙනි.

"කවිතා... මට එක දෙයක් කියන්නෝනෙ..."

විශ්ව... මා බෝ මළුවේ පහන් දල්වද්දී කීවේය. මම ඔහු දෙස නොබලාම නිවෙන්නට අර ඇද්ද පහන් වැටියක් අතැඟිලි තුඩු අගින් ඉස්සුවෙමි.

"ප්‍රශ්නයක් ඇහුවොත් ඇත්තම කියනවද?"

මම හිස සලා හා කියා කීවෙමි.

"කියන්න... මේ බුදු හාමුදුරුවො ඉස්සරහදිම කියන්න... ඔයා ඉන්නෙ සතුටින් කියලා..."

හිත තිගැස්සිණි. අතැඟිලි වෙව්ලුවේ පුපුරා යන්නට තනන දුක බිඳගනු නෙ ාහැකි නිසාය. මම විශ්වගේ මුහුණ බැලුවෙමි. ඒ ඇස්වල ලොකු දුකකි. මට වැටහේ. ඔහු ඉන්නේ දුකෙනි.

"විශ්ව..."

"බුදු හාමුදුරුවො දිහා බලාගෙන කියන්න කවිතා..."

"මං ඔයාට ආදරෙයි විශ්ව..."

"මං ඇහුවෙ ඒක ගැන නෙවේ..."

මම අසරණ වීමි. විශ්වගේ දඟ ඇස් මා පරාද කළේය. ඔහු ලස්සන වචන අහුරකින් දමා ගැසුවේය. මට රිදිණි. ඊළඟට කියන්නේ කුමක්දැයි සිතාගත නොහැකිව මම ළතැවීමි. මම වචන සොයන්නට වීමි. විශ්ව මා වැරදයට වටහා ගන්නට ඇත. ඊට පසු... ඔහු කතා කළේම නැත. බුදුන් වැඳ ආපසු එද්දී මම ඔහුගේ අත් ගොබයක එල්ලුණෙමි. ඔහු මගේ අත ගසා දැම්මේය. හිත රිදුණු තරම පහදා කිව නොහේ. නොහඬා උන්නානම් ඒ දුක වැඩිකමටය.

"විශ්ව... කතා කරන්න විශ්ව... මට ඔයත්තෙක්ක කියන්න හුඟක් දේවල් තියෙනවා..."

පාතදුරට චිත් බසයෙන් බසිද්දී මම කීවෙම. වශ්ව ගනන් නොගෙනම උන්නේය. එපමණක් නොවෙ... ඔහු මා ගෙදරට ඇරලවන්නට ආවේද නැත.

"මට තනියෙම යන්න බෑ..."

මම බොරුවට කීවෙමි. විශ්ව වෙනතක් බලාගෙන සිනාසුණේය.

"මේ බලන්නකො විශ්ව..."

මම ඔහුගේ මුහුණ මගේ පැත්තට හරවා ගත්තෙමි. ඔහු ඇස් නපුරුම නපුරු පාට කරගත්තේය. මට දැනුණේ පුදුම තරම අසරණකමකි. මම ආපසු හැරුණෙමි. විශ්ව ගැන තරහකින්නම් නොවේ. ඒත්... මොකක්දෝ ලොකු වේදනාවක් තුරුළු කරගෙන මම ගෙයි කඩුල්ල පැන්නෙමි. අම්මා ඉස්තෝප්පුවේ පඩියක් උඩට වී පාර බලාගෙන උන්නාය.

"අම්මා..."

මම  ඈ ළඟින්ම ගොස් හිඳගත්තෙමි.

"අපි කන්දෙ විහාරෙ ගියා..."

මා කීවේ ඈ නොදැන හිඳි දෙයක් නොවේ. මට අවැසි වූයේ කෙසේ හෝ ඈ කතාවට අල්ලා ගන්නටය.

"අනේ කතා කරන්නකො අම්මා...."

මම කීවෙමි. අම්මා උන් තැනින් නැගිට මිදුලට ගියාය. අනේ... එසේ නොකොට ඈ මගේ කම්මුලට හියෙන් පහරක් ගැසුවා නම්... මම හිත සංසුන් කරගන්නට මහා වෙහෙසක් දැරීමි. ළඟදී සිට අම්මා වෙනස්ව හිඳී. අප්පච්චි මියැදුණු අළුත සේ ඈ කල්පනා කරයි. තනියෙන් කියවයි. මට මේවා තනිව විඳගත නොහේ. කියන්නට ළඟ උන්නේ විශ්ව පමණි. ඒත්... දැන්...

මම නොහිතා ඉන්නට මහා වෙහෙසක් දැරුවෙමි. එන හැටියකට මූණ දෙන්නට හිතා ගෙන හිත හදාගන්නා එක මගේ එකම අරමුණ විණි. දවසක් නොවේ, තෙදිනක්ම විශ්ව ආවේ නැත. මට බියක් සිතිණි. දුකක් දැනිණි. ආදරය කරන අයට මේ සා නපුරු විය හැකිද? ගෙදරටම වී හිඳිද්දී නොවේ, විශ්ව ගැන හිතද්දී මට පිස්සු හැදෙයි.

දවසක්... මම නල්ලූරුවේ දුරකතන කුටියකින් විශ්වගේ කාර්යාලයට ඇමතුමක් ගත්තෙමි. පිළිතුරු දුන්නේ ගැහැණු හඬකි. ඈ කීවේ විශ්ව වේලාසනින් ගිය බවයි. මම තවත් වරක් කැලඹුණෙමි.

අම්මා නොහිටියානම්... පාරේ දිවෙන බසයකට පැන මියෙන්නට තරම් මගේ සිතිවිලි හයියය. මට ආපසු ගෙදර යන්නට නොසිතිණි. විශ්ව මේ පලිගන්නේ එදා ඇසූ දේවලට හරි උත්තර නොදුන් නිසාය. මීට පෙර දිනෙක... ඔහු අපේ නිවෙසට ආ විටෙකද... මා හැඬූ විට ඊට හේතු අසා ඔහු මට කරදර කළා නොවේද? පසුව කියන්නෙමැයි කියා මා ඔහු මඟහැරියා නොවේද?

මම ශිරෝමිගේ ගෙදර ගියෙමි. මා දුටු ඇගේ ඇස් සතුටින් විසල් විණි.

"කොහොමද කවි..."

ඈ ඇසුවේ මගේ අත් දෙකම අල්ලා ගන්නා ගමන්ය. සිනාසෙනවා හැර කරන්නට අන්‍යමක් මට නොවිණි.

"මොනාද හංගනව මගෙන්..."

ශිරෝමි කීවාය. මම ඇස් බිමටම පාත් කරගත්තෙමි.

"යං කාමරේට..."

ශිරෝමි ඉස්සර වුණාය. මම ඈ පසුපසින් වැටුණෙමි. හිතේ දුක හෝ සතුට කියන්නට මට ඇති එකම හිතවතිය ඈය.

සිදුවූ බොහෝ දේ මම ශිරෝමි හා කීවෙමි. වචනයෙන් වචනය ගළපා පෙළ ගසද්දී නොදැනීම මගේ දුක බිඳිණි. දෑස පිරුණේ උණුහුම්ම උණුහුම් කඳුළු වලිනි. මම හැඬුවෙමි. හොඳටෝම හැඬුවෙමි. ශිරෝමි නිහඬව සිටියා විනා මොකුත්ම කීවේ නැත. එකාතකට එසේ වීම හොඳය. මට නිදහසේ හැඬිය හැකිය. මොනවා නැතත් නිදහසේ හඬන්නටවත් ඉඩක් තිබීම මොන තරම් දෙයක්ද?

"ඔය ඇඬුවා ඇති කවි..."

බොහෝ වේලාවකට පසු ශිරෝමි කීවාය. මම පාත්වී ගවුම් සායෙන් මූණ පිසදා ගත්තෙමි.

"විශ්ව දැනගන්නෝනෙ ශිරෝමි... මං දුක් විඳිනව... මං එයාට කොච්චර ආදරේද? ඇයි එයාට නොතේරෙන්නෙ මයෙ අම්මටයි එයාටයි මැදිවෙලා මං හුඟක් දුක් විඳින වග..."

මම කියවාගෙන ගියෙමි. ශිරෝමි නිහඬව බලා උන්නාය. ඇස් විසල් කරගෙන බලා උන්නාය. මම සිනාසුණෙමි.

"උඹ ඉස්සර මොනතරං සතුටින් හිටිය කෙල්ලක්ද?"

ශිරෝමි මහ හයියෙන් සුසුමක් හෙලුවාය. ඈ කියන්නේ ඇත්තය. මා ඉස්සර මොන තරං නම් සතුටින් සිටියාද? අම්මාත්, අප්පච්චිත් මාත්... අප තිදෙන අතර මොන ආකාරයකින්වත් රහසක් නොතිබූ තරම්ය. මුලින්ම අප අතර තිබූ ඒ බැඳීම බින්දේ මාය. විශ්වට ආදරය කොට මම මයෙ අම්මා අප්පච්චි රිද්දුවෙමි. අප්පච්චි...

මයෙ රත්තරං අප්පච්චි... හැමෙකක්ම දරාගෙන උන්නේය. ඔහු ඉන්නට ඇත්තේ මා ගැන උපන් බියකිනි.

ඔහු අකාලයේ මියැදුණේද මා ගැන හිතා රෝගාතුර වූ නිසාය. දැන් අම්මා... අනේ ඈ ද මා ගැන හිතමින් ළතැවෙනවා නොවේද?

මම ඇස්වල කඳුළු පිසදමාගෙන ආපසු එන්නට නැගිට්ටෙමි. ශිරෝමි මගේ අතක එල්ලුණාය.

"යන්නද ඔය..."

මම හිස සැලුවෙමි.

"වහින්නත් වගේ කවි..."

"ඊට ඉස්සරින් මට ගියැකි..."

මම මිදුලට බැස්සෙමි. ශිරෝමිද කඩුල්ල ළඟටම මා හා ආවාය.

"පරිස්සමින් යන්න කවි... මං හෙට විශ්වත්තෙක්ක ඔය ප්‍රශ්නෙ ගැන කතා කරන්නං..."

"අනේ ඕන්නෑ ශිරෝමි... එයා දැන ගන්නෙපැයි මං මොන වගේ දුකක් උහුලනවද කියල... මට මේ තරං රිද්දන්න නං මොකටද එයා මට ආදරේ කළේ..."

"මෝඩි... එකපාරටම එහෙම තීරණේ කරන්නෙ කොහොමද... අපි අහල බලමු... විශ්වටත් මොකක් හරි ප්‍රශ්නයක් ඇති... නැත්තං ඉස්සර එයා ඔය වගේ දේවල් කළේ නැහැනෙ..."

මමකිසිත් නොකියාම උන්නෙමි. කතා කළොත් වෙන්නේ එක්කෝ මගේ හිත රිදෙන එකය. නැතිනම් මා නිසා ශිරෝමිගේ හිත රිදෙන එකය. එය එසේ විය යුතු නොවෙ. ශිරෝමි මගේ එකම යෙහෙළියයි.

"මං යන්නං ශිරෝමි..."

"හොඳයි... පරිස්සමට..."

මම ඇගෙන් සමුගත්තෙමි. හිත පාළුවකින් පිරිණි. දැන් මෙ හුදෙකලා මොහොතේ විශ්ව මා ළඟ උන්නානම්... සත්තකින්ම මට මෙවන් පාළුවක් නොදැනෙන්නට ඉඩ තිබිණි. අපේ ආදරේ ගැන කිය කියා ඕනෑ දේටත් එපා දේටත් සිනාසෙන්නට විශ්වගේ උරහිසේ හිස හොවා ඉකිගසා හඬා මගේ දුක කියන්නට මට ඔහු අවැසියමය. මා ළඟට එන්න... මගේ හිත හදන්නැයි මා කියන්නේ කාටද? විශ්ව මට ගෙනැත් දෙන්නැයි මා කියන්නේ කාටද?

"විශාකා තොමෝ... තෙමෙනව නේ..."

ළඟින් ගිය කොල්ලෙකුගේ හඬින් මම තිගැස්සීමි. හීන් හිරිපොදයක් ඇද හැලෙමින් තිබිණි. අහස පුපුරා අකුණක් ගැසුවේය. මම පය ඉක්මන් කළෙමි. මා අත කුඩයක්ද නොවිණි. පේනතෙක් මානයක ගෙයක් දොරක්ද නෙවේ.

ටිකකින්... පොද වැස්ස මහ වැස්සක් විණි. මම පාර අයිනේ තිබුණු විසල් තුරු සෙවණක් යටට වීමි. ඒත්... වැස්සේ නම් අඩුවක් නොවිණි. මට දුක සිතිණි. විශ්වට, අම්මාට, අප්පච්චිට මහමෙරක් තරම් ආදරේ කළ මා අද තනියෙන්මය. මා ළඟ කවුරුවත් නැත. හිසට වැටී නළල දගේ බේරෙන වැහි බිංදු පුංචි ලේන්සුවෙන් පිසදාගෙන මම පාරේ ඈතම ඈත කෙළවර දෙස බැලුවෙමි. කවුදෝ කුඩයකුත් ඉහලාගෙන බයිසිකලයක් පැදගෙන මා ඉන්නා දෙසට එයි.

මට බිය සිතිණි. මේ වැස්සේ මේ අඩ අඳුරේ මේ තනියේ... අනේ මට මොනවා වෙයිද? මම විසල් මාර ගහට මුවා වීමි. කවුරු හෝ බයිසිකලයේ ආ තැනැත්තා එය මා ඉන්නා හරියේ වෙනත් ගසකට හේත්තු කර මා ළඟටම ආවේය. මම බම බලා ගතිමි. කවුරු හෝ ළඟට ආ තැනැත්තා මගේ අතැඟිලි වලින් අල්වා ගත්තේය. මට අම්මා, අප්පච්චි, විශ්ව සිහිවිණි. මෙ පාළු පරිසරයේ උදව්වක් ඉල්ලා කෑ ගැසීමද වැඩක් ඇති දෙයක් නොවෙ. ඒත්, කම් නැතැයි සිතා මා කෑ ගසන්නට හැදුවා පමණි. ඒ සවිමත් අතකින් මගේ උරහිසක් හයියෙන් මිරිකිණි.

අඳුරු අහස පුපුරුවා හයියෙන් ගෙරෙව්වේද එවේලේය. මම තිගැස්සී කෑ ගසන්නට හැදුවෙමි.

"කවි..."

මට පුරුදුය. ඒ හඬ මට හොඳටෝම පුරුදුය.

"බය වෙන්නෙපා... ළඟ ඉන්නෙ මං..."

විශ්ව... මගේ විශ්ව... මම ඔහු දෙසට හැරුණෙමි. ගෙවී ගිය දිනවල තිබුණු අමනාපකම් කොහේ ගියා දැයි නොදනිමි. මම ඔහු පපුතුරේ මුහුණ හංගා ගතිමි. බොහෝ වේලා අප එසේ ඉන්නට ඇත. හයියෙන් වැස්සේය. තෙමී තෙමීම මම ඔහු තුරුලට වී උන්නෙමි.

"ඔයා මට නපුරුකම් කළා විශ්ව..."

මට හයියෙන් හැඬිණි. විශ්ව මා සිය පපුතුරට තබා තදකොටගෙනම උන්නේය. හෙමීට මා හිස පිරිමැද්දේය. රිදෙන්නට මගේ කම්මුල් සිඹගත්තේය.

"මං ඔයාව බලන්න ගෙදර ගියා..."

ඔහු කීවේය.

"කොහෙද ඔයා ගියෙ...?"

"ශිරෝමිලයි ගෙදර..."

"හදිසියෙම..."

"ඔයා ගැන ආරංචියක්වත් තිබ්බෙ නෑ... මං හිටියෙ පිස්සු හැදිල වගේ..."

මම කියන්නට ආ දේ අතරමග නවත්වා කෙලින්ම විශ්වගේ දෑසට එබුණෙමි. අඩ අඳුරේ වුවද ඒ ඇස් දිලිසෙනු මට පෙනෙයි.

"යං... මං ඔයාව ඇරලවල එන්න..."

විශ්ව පසෙක තිබූ කුඩය මා අතට දී බයිසිකලය තල්ලු කරගෙන ගියේය. මම කුඩයත් ඉහලාගෙන ඔහුගේ එක් අතක එල්ලුණෙමි.

"දැං කුඩේ දිගඇරගත්තට වැඩක් නෑ... හොඳටම තෙමිල..."

විශ්ව කීවේ මවාගත් අමනාපයකිනි.

"අම්මා මටත්තෙක්ක බනියි ඔයාව තෙමුවයි කියල..."

මමකිසිත්ම නොකීවෙමි. විශ්ව ළඟදී මට වැඩිය කතා කරන්නට නොසිතේ. ඒ ඇයිදැයි නොදනිමි. මා දන්නා එකම දේ මා ඔහුට මහ හුගක් ආදරේ කරනා වග පමණකි.

ගෙදර යද්දී මට ආයෙත් පුරුදු පාළුව දැනිණි. අම්මා බුම්මාගෙනම උන්නාය. විශ්ව ඉස්තෝප්පුවේ නවතිද්දී මම කාමරයට ගොස් හිසේ තෙත මාත්තු කොංටගෙන වෙනත් ඇඳුමක් ඇඳගත්තෙමි. තුවායක් ගෙන ගොස් ඉස්තේප්පුවේ උන් විශ්වගේ හිස පිසදැම්මෙමි.

"ඔයා තෙමිල හොඳටම..."

"සීතලයි කවි..."

මම හනිකට කාමරයට ගොස් ටී ෂර්ට් එකක් ගෙනැවිත් ඔහුට ඇඳගන්නට දුන්නෙමි. විශ්ව හැඳ උන් තෙත කමිසය ගලවා මා දුන් ටී ෂර්ට් එක හැඳ ගත්තේය. මමහනිකට කුස්සියට ගොස් ඔහුට තේ හෙදුවෙමි. උණුම උණු තේ කෝප්පය ඔහු හෙමීට තොල ගාද්දී මම ළඟට වී හිස පිරිමැද්දෙමි.

"හැමදාම මෙහෙම ඉන්නෝනා..."

ඔහු කියවයි. මම ඔහු හිඳ උන් පුටු ඇන්ද මත වාඩි වීමි.

"කවිතා..."

"ම්..."

"දැං ඉතිං බකමූණ් වගේ හුම් හුම් ගගා ඉඳල බෑ..."

"එහෙනං...?"

"එක්කො ඔයා යුනිවර්සිටි යන්නෝනෙ... නැත්තං අපි කසාද බඳින්නෝනෙ... කියන්න... මේ දෙකෙන් කොයි එකටද ඔයා කැමති..."

"මට තේරෙන්නෑ..."

"ඔහොම කතා කරන්නෙපා දරුවො... හිතන්නකො චුට්ටක්... ඔයාගෙ අම්මා ලෙඩවෙලා... අම්මට තියෙන එකම සැනසීම ඔයා... අම්මා ඔයා එක්ක තරහෙන් වගේ ඉන්නෙ ඔයා ඒ සැනසීම නැති කරන හින්දා..."

"මං ඕනෙකමට කරනව නෙවේ..."

"මං දන්නව මැණික..."

ඔහු හිනැහී මගේ උරහිසට හේත්තු විණි. මම අඳුරු හාත්පසට නෙතු හැරවීමි. දැන් මා තීරණයක් ගත යුතුව තිබේ. විශ්ව විද්‍යාලයට යන්නට කොහෙත්ම මගේ කැමැත්තක් තිබුණේ නැත. මා විභාගය හොඳින් කළේ අප්පච්චි සතුටු කරන්නටය. අප්පච්චිගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්නටය.

"කවි..."

විශ්ව මගේ උරහිසට වාරු විණි. මම ඔහුගේ හිසකේ අතර අතැඟිලි තුඩු යැවීමි. ඔහු ඇස් පියා ගත්තේය.

"විශ්ව..."

"ම්..."

"මට ඔයාගාවට එන්නෝනා... මට යුනිවර්සිටි යන්න බෑ..."

මම කියවාගෙන ගියෙමි. විශ්ව මා සිය උකුලට ඇදගත්තේය. කම්මුල් රිදෙනතුරු සිඹගෙන සිඹගෙන ගියේය. මම ඇස් පියා ගත්තෙමි.

සඳ ආදරේ නුඹටයි කියා
සඳ සාවි මගෙ නුඹමයි කියා
සඳ එළිය යට හිත හංගලා
සඳ මගේ පෙම උදුරන් ගියා

සඳ සීතලේ තුරුළුව ඉඳන්
සඳ රාත්‍රියම උණුහුම් කරන්
සඳ මියැදෙනා දහවල බියෙන්
සඳ නුඹ හුඟක් ඈතට ගිහින්

සඳ ආදරේ කිව්දා ඉඳන්
සඳ දිහා බැලුවෙමි පෙම සොයන්
අමාවක කළුවට ඉඩ තියන්
සඳ නුඹ කොහෙද හැංගී ගිහින්

සඳ මගෙම වග කියනට ඉතිං
සඳ නුඹ සොයමි අහසම බලන්
පෙම් මතක පොදි මා ළඟ තියන්
සඳ නුඹ ගිහිං ඈතක ගිහිං...

# 09

**දවසක්...** ජීවිතය වෙනස් වන දෙයක් සිදුවිණි. එය කළේ මා නමට ආ නිර්නාමික ලිපියකි. එහි වූයේ විශ්ව ගැනය. ඔහුට වෙනත් පෙම්වතියක හිඳින බවත්, ඔහු මා ඇසුරු කරන්නේ විනෝදයට බවත්, ඊට අමතරව තවත් විවාහක ගැහැනු කිහිප දෙනෙකුද ඔහු ඇසුරු කරන බවත්ය.

සත්තකින්ම මම කලබල වීමි. මට හොඳටෝම හැඬිණි. මම කාමරයට වී කොට්ටයේ මූණ හංගාගෙන ඉකිගැසුවෙමි. අවසන, මා හිස ඔසවද්දී සීතලම සීතල කඳුළු වලින් මුළු කොට්ටයම තෙමී තිබිණි.

"කවිතා..."

විශ්ව කාමරයට විත් කතා කළේය. මම තිගැස්සුණෙමි. කඳුළු පිරි කම්මුල් මම ඔහුගෙන් වසන් කළෙමි.

"කවි..."

ඔහු ඇඟේ කෙළවරකින් හිඳගත්තේ මගේ මුහුණ ඔහු දෙසට හරවා ගන්නා ගමන්ය. මම බිම බලාගෙන ඇඳ රෙද්දේ ඉරි අඳින්නට වීමි.

"මොකෝ මේ... ඇස්වල කඳුළු හංගගෙන..."

"අප්පච්චි මතක් වුණා..."

මම බොරුවට කීවෙමි. විශ්ව මගේ හිස සිඹ... ඊට පසු මගේ මුහුණ සිය පපුවට තබා තද කොට ගත්තේය. මගේ පපුව පිච්චිණි. අප්පච්චි සිහි වූවාට නොවේ. එකම එක මොහොතකට හෝ මගේ විශ්වගේ හිත රිදෙව්වාටය. මේ තරම් ආදරයකින් මා තුරුළු කරන් ඉන්නා ඔහු මා හැර වෙනත් කෙල්ලක හා යයිද?

"කවි... කියන්න මගෙ රත්තරනෙ... මොකද මේ ඉකි ගගහ අඬන්නෙ..."

විශ්ව හෙමීට මුමුණයි. මම හයියෙන් හීල්ලුවෙමි. ඔහු මගේ හිසකේ අතර

ඇඟිලි තුඩු යවා හෙමීට, හෙමීට මගේ හිස පිරිමදියි.

"දැං ඔලුව උස්සන්නකෝ... හොඳ කෙල්ල වගේ ගිහිං මට බොන්න මොනවහරි හදාගෙන එන්නකෝ..."

මම නැගිට්ටෙමි. විශ්වගෙන් ඈත් වී කුස්සියට ගොස් ඔහුට බොන්නට තේ හැදුවෙමි. මා තේ හදාගෙන එද්දී ඔහු උන්නේ සාලයට වී ටී වී බලමිනි. මම හදාගෙන ගිය තේ කෝප්ප දෙකෙන් එකක් කාමරයේ ඇඳුම් මසමින් උන් අම්මාට දී අනෙක් එක සාලයට ගෙන ගියෙමි.

"මොනව නැතත් ඔයාගෙ තේ එකනං හරි රසයි..."

ඔහු කීවේ බාගයක් බිව් තේ කෝප්පය ආපසු මා අතට දෙන අතරේය. මම එහි ඉතිරි අඩ බිව්වෙමි. විශ්ව හැමදාම එසේය. ඔහු ගෙදර ආ හැම විටෙකම මා ඔහු ළඟ සිටිය යුතුමය.

"විශ්ව..."

"ම්..."

"මං ඔයාට හුඟක් ආදරේනෙ..."

"ඉතිං..."

"ඔයා මට ආදරේ නැද්ද?"

"නෑ..."

"නරියා..."

"නරිච්චි..."

විශ්ව ඊළඟට කරන්නේ බොරුවට මා අවුස්සන එකය. ඒත්, ඔහු මට ආදරේ නැතැයි කී නිසා ඇත්තටම හිත රිදිණි. මම හිතන්නට වුණෙමි. ඔහු මට හිතන්නට දෙයක් ඉතිරි කළේය. ඔහුගේ ඒ වචන කීපයත්, මට ලැබුණු නිර්නාමික ලිපියත් අතර මොකක් හෝ සම්බන්ධයක් තිබේද?

හිත පිච්චෙයි. මම හයියෙන් සුසුමක් හෙළුවෙමි.

"කවී..."

විශ්ව මගේ පාළු ඇස්වලට එබෙයි. මම ඒ ඇස් වලවත් මගේ ප්‍රශ්නයට උත්තරයක් සෙව්වෙමි. ඒත්, ඒ දිලිසෙන ඇස් කියන්නේම ආදරයයි. මෙතෙක් හිතේ තිබූ නොසංසුන් හැඟීම් හංගාගෙන ඊළඟට මට දැනුණේ ආදරයකි. ඒ රත්තරං ඇස් සිඹගෙන ආදරෙයි කියන්නට මට සිතිණි.

"මගෙ පිස්සි..."

ඔහු ඇඟිලිතුඩු වලින් මගේ හිසකේ අවුල් කළේය. මගේ සිතුවිලි පුපුරා යන්නට

ඔන්න මෙන්නය. හඬන්නට මහා උවමනාවක් ම'හිතේ විණි. ඒත්, කම්මුල් වෙව්ළුවා පමණි. ඇස්පිය වේගයෙන් එකිනෙක හා ගැටුණා පමණි.

"මං ආදරෙයි කවිතා..."

ඔහු කීවේ හෙමිහිටය. මම මගේ වෙව්ලන කම්මුල් ඔහගේ උරහිසක රැඳවීමි. ඔහු ආයෙමත් ඒ දඟ ඇඟිලිතුඩු වලින් මගේ හිසකේ අවුල් කළේය. මට ඔහු පහතට හෙලන හුස්මක උණුහුම දැනෙන තරමටම ඔහු මගේ මුහුණට ළංවී උන්නේය. මම සැනසුණෙමි.

ඒත්... ඒ සැනසුම හිතේ තිබුණේ දවස් කීයද? ඊළඟ බදාදා ශිරෝමි මා සොයා එනතුරුම මා හිටියේ ඒ ලස්සන සිහිනයේය. මුලින්ම මා සිතුවේ ඈ මා බලන්නට එන්න ඇත්තේ නිකමටයැයි කියාය.

ඒත්... මඳක් විපරම් කරද්දී ඇගේ නොසංසුන් ඇස් මට බොහෝ දේ කිව්වේය.

"බඩුවක් කියන්න... කලබල වෙන්නෑ කියපං..."

ඈ මගේ අතින් අල්වාගෙන වත්ත පහළට යන ගමන් කීවාය. මම කිසිත් නොකියාම හිස සැලුවෙමි.

"විශ්ව ගැන එක එක විදියෙ ආරංචි එනවා..."

මම තිගැස්සුණෙමි. මට එකවරම සිහිවුණේ අර නිර්නාමික ලිපියයි. ශිරෝමි දිගටම කියවන්නීය.

"විශ්වට ඔෆිස් එකේ කෙල්ලෙක් ඉන්නවලු... ඒකිත්තෙක්ක හැම තැනම රවුම් ගහනවලු..."

මගේ හිත සීතල විණි. දෙකම්මුල් වෙව්ලුවේ දුකටද තරහටදැයි කියා නොවැට හේ. අම්මා තාත්තාටත් ගින්දර දී මා ආදරේ කළේ මෙහෙම කෙනෙකුටද? මම... හිස පාත්ම කොටගෙන අරලියා ගහ පාමුළ වූ ගල් තලාව මත්තේ හිඳගත්තෙමි. ශිරෝමි තවත් කියවයි.

"විශ්ව නල්ලූරුව පැත්තෙ බැඳපු ගෑනු කෙනෙක් එක්කත් යාලුයිලු. හැම සිකුරාදාවකම රෑට එයා එහෙ යනවලු... දැකපු අය කියන්නෙ..."

"ශිරෝමි..."

මම හයියෙන් කෑ ගැසීමි. දෙවියනේ... මට තවත් මේවා ඇසිය හැකිද? මා ඔහුට මගේ ජීවිතයටත් වඩා ආදරය කළේ මේවා මේ විදිහට අසන්නද?

"සොරි කවිතා... මං ආවෙ උඹව රිද්දලා උඹව ගිනිතියලා යන්න නෙවෙයි. මේවා ආරංචි වුණාම මට හරියට තරහ ආවා... විශ්ව මගෙ යාළුවෙක් වග ඇත්තයි... ඒත්... මට උඹව ඊට වඩා වටිනවා... මේවට කලබල වෙලා බෑ... කල්පනාවෙන් පරිස ්සමින් වැඩ කරපං..."

මම නිසොල්මනේ අසා උන්නෙමි. ශිරෝමි යටැසින් මා දෙස බැලුවාය.

"මට පොරොන්දු වෙයං... විශ්ව ආවම ප්‍රශ්න ඇති කරගන්නෑ කියල..."

මම සිනාසීමි. ශිරෝමි සෑහීමකට පත්වෙන්නට ඇත. තවත් මොහොතක් මා හා කතා කරමින් උන් ඈ යන්නට ගියේ පුරුදු පාළුව විතරක්ම මා ළඟ තබාය. මම ගොම්මන් වැටෙන තුරුම ගල් තලාව මටත වී උන්නෙමි.

ඉස්සර නම් ඕනෑම වෙලාවක මා මෙතැනය. පාඩම් කරන්නට, නවකතා පොතක් කියවන්නට, පමණක් නොවේ ළමා කාලයේ නම් හවසට මා මඳක් නිදා ගත්තේද මේ ගල්තලාවේය.

"ෂ්... ෂ්..."

මම තිගැස්සී හාත්පස බැලීමි. කවුරුත් පෙනෙන්නට නැත.

"ෂ්... ෂ්..."

එවර නම් මම ඔහු හැඳින්නෙමි. ඒ විශ්වය.

"මං හැමතැනම හෙව්වා... මොනවද කරන්නෙ මෙතන..."

විශ්ව ඇසුවේ මා ළඟින්ම හිඳගන්නා ගමන්ය.

"විශ්ව..."

මම සියල්ල අසන්නට හිතාගෙන ඔහු දෙස බැලුවෙමි. ඒත්, ඒ දඟ ඇස් මට කිසිත් කියන්නට දෙන්නේ නැත. මට ඔහු ගැන තරහ හිතේ. ශිරෝම කී දේවල්, අර නිර්නාමික ලිපියේ තිබූ දේවල් ඇත්ත නම්... විශ්ව මේ කරන්නේ රඟපෑමක් නොවේද?

"රෑ වුණා කෙල්ලෙ... ගෙට යං..."

"බෑ විශ්ව..."

මම ඔහුගේ ගෙල බදාගතිමි. මෙතෙක් හිතේ තෙරපී තිබූ පීඩනය ඇස් උතුරා ගලද්දී මම මහ හයියෙන් හඬා මගේ දුක කිව්වෙමි.

"කියන්න විශ්ව... මට කියන්න... මොනවද මේ මිනිස්සු කියන කතා... ඔයා ඔයාගෙ ඔෆිස් එකේ ගෑනු ළමයෙක් එක්ක යාලුයිලු... ඔයා නල්ලූරුව පැත්තෙ ගෑනු කෙනෙක්ගෙ ගෙදරටත් යනවලු හැම සිකුරාදම... කියන්න සුදූ... ඒකද ඔයා සිකුරාදට පාඩම් කරන්න තියෙනවයිකියල මාව බලන්න නැවිත් ඉන්නෙ..."

"කවුද ඔය බොරු කතා කියන්නෙ?"

"මට ලියුමක් ආවා..."

"බොරු කතා... තරහට කවුරුහරි ලියල එවන්නැති..."

"මං හොයල බැලුවා... ඒවා ඔක්කොම ඇත්ත... ඔයා තමයි බොරු කාරයා... මෙච්චර කල් මාව රැවැට්ටුවා... මගෙ අප්පච්චි මැරුණෙ ඔයා නිසා... මගෙ අම්මා මං එක්ක තරහවුණේ ඔයා නිසා... දැං ඉතිං මාවත් මරල දාන්න... මෙහෙම විඳව විඳවා ජීවත් වෙනවට වැඩිය ඒක හොඳයි..."

මම වේගයෙන් කියවාගෙන කියවාගෙන ගියෙමි. විශ්ව හයියෙන් මගේ කම්මුලට ගැහුවේය. මම දෑතින්ම මූණ බදාගෙන ඔහු උකුලේ හිස හංගාගෙන හැඬුවෙමි. ගැසූ කම්මුල් පහරටම නොවේ, ඒත්...

මගේ හිත හොඳටෝම රිදී තිබිණි. විශ්ව සිය උකුලේ තිබූ මගේ හිස ඔසවා මා සිය පපුතුරට තුරුළු කරගත්තේය. මට හයියෙන් ඉකිගැසිණි.

"ඔහොම අඬන්නෙපා කවිතා..."

ඔහු කීවේය. මට වෙනසක් දැනිණි. වෙනදා මහා ආදරයකින් කවි කියා කියනා ඔහු අද කවිතා කියා කීවේ ඇයි?

"මට කියන්න කවුද ඔයාට ඔය බොරුව කිව්වෙ?"

විශ්ව අසයි. මම මොනවත්ම නොකියමි. ඔහු හෙමීට... හෙමීට මගේ හිස පිරිමදියි. කියන්නට බොහෝ දේ මගේ හිත් මායිමෙ පොදි ගැහෙයි. විශ්වගෙන් අස න්නට... අසා හිත සැනසෙන ආකාරයේ පිළිතුරක් ලබාගන්නට ගැටළු මහ හුඟක් මගේ හිතේ වේ. ඒත්... කතා කරන්නට නම් මට සිතෙන්නේම නැත.

"කවි..."

"මං පිස්සියෙක් වෙයි විශ්ව..."

"මං ඔයාව දාල යන්නෑ..."

"මං කොහොමද ඔයාව පිළිගන්නෙ...?"

විශ්ව සුසුමක් හෙලුවේය. ඔහුගේ හිත රිදෙන්නට ඇත.

"මං ඔයාට මහ හුඟක් ආදරේ කළා විශ්ව... ඔයා දන්නැති තරම්ම... ඔයා හිතන්නෙත් නැති තරම්ම... මං ඔයාට ආදරේ කළා... අදටත් මං එහෙමමයි... ඒ වගේම මං ඔයාව මහ හුඟක් විශ්වාස කළා... ඒත්... දැං .... දැං... මට ඔයාගැන බලාපොරොත්තු තියාගන්න අමාරු වග මට තේරෙනවා.... මට කියන්න විශ්ව... ආදෙර් මගෙ ඔලුවට දාලා... ඇයි ඔයා මාව අවුල් කළේ...?"

විශ්ව හයියෙන් මා බදා ගත්තේය. මම ඒ සවිමත් දෑත් අතරේ හිරවී ගියෙමි.

"මං හින්ද අඬන්නෙපා කෙල්ලෙ..."

ඔහු කීවේය. මම තිගැස්සුණෙමි.

"එහෙනං... එහෙනං... මං කවුරු හින්දද අඬන්නෝනෙ... කියන්න විශ්ව... මට ඔයා හින්ද හිනාවෙන්න බෑ වගේම මට ඔයා හින්ද අඬන්නවත් බැරිද... ඔයාගෙ අසරණීට ඒ අයිතියවත් නැද්ද මගෙ විශ්ව..."

"කවිතා..."

"එන්නෙපා මීට පස්සෙ මාව බලන්න... යන්න... ඔයාට කී දෙනෙක් ඉන්නවද

මං නැතුවට..."

මම වේගයෙන් කියවාගෙන ගොස් විශ්වගෙන් මිදී ගෙට දිව්වෙමි. මගේ කාමරයට ගොස් ඇඳේ වැතිරී හයියෙන් ඉකිගසා හැඬුවෙමි. ටිකකින්... විශ්ව කාමරයට එනු මට දැනිණි. ඔහු පැමණ ඇඳ උඩින් හිඳගනුද මට දැනිණි.

ඔහු මගේ හිස මතින් අත තිබ්බේය. මගේ දුක වැඩි වෙන්නට ඇත. මම තවත් හයියෙන් හැඬුවෙමි.

"නැඟිටින්නකො... නැඟිටල මං කියන දේ අහන්නකො..."

විශ්ව හෙමීට මුමුණයි. මම හිස නොඑසවීමි. නැඟිට්ටා කියා අළුතින් තව මොනවා දැන ගන්නද? ඔහු තව මොන දේ කීවත් කුමකටද... දැන් මගේ හිත රිදී අහවරය.

"කව්..."

තවත් අඩ පැයක් පමණ ගෙවෙන්නට ඇත. විශ්ව තාමත් මා ළඟමය.

"දැංවත් නැඟිටින්නකො..."

මම නැඟිට්ටෙමි. විශ්ව මගේ මුහුණ සිය දෝතට මැදිකර ගත්තේය. මම ඇස් දුකින් පුරවාගෙන ඔහු දෙස බැලුවෙමි.

"ආපු වෙලාවෙ ඉඳන් අපි රණ්ඩු වුණා විතරයි. ඔයා ඇඬුවා... මගෙ හිතත් හුඟක් රිදුණා... ඩිංගක් හිතන්න කව්... කවුරුවත් කේලමක් කියාපු පළියට... මේ තරං ඔයාට ආදරේ කරන මාව රිද්දපු එක හරිද?"

මම කිසිත්ම නොකියා ඔහු ගෙළ මුල මුහුණ සැඟවීමි. හඬා හෙම්බත්ව දැන් දැන් මට හිස ඔසවා ගැනීමටත් බැරි ලෙසකි. මම වෙනදා මෙන් නොවේ... දුකින්... මහා සංයමයකින්... හිතේ දුක පෙළ ගසන්නට වුණෙමි.

"විශ්ව... මගෙ ආදෙර් ගැන ඔය තරං පටු විදිහට හිතන්නෙපා... ඔයා දන්නෑ... ඔයා දන්නෑ... මං ආදරේ කරපු තරං... ඔයා ගැන පිට මිනිස්සු ඒ වගේ කියනකොට... කොහොමද මං දරාගෙන ඉන්නෙ... ඉවසුව විශ්ව... මං මහ හුඟක් ඉවසුවා... ඔයා දන්නෑ ඔයා නිසා ඔයාට හොරෙන් මං විඳවපු තරං..."

විශ්ව දිගම දිග සුසුමක් හෙලා මගේ කම්මුලක් සිඹ ගත්තේය. මම ඇස් පියා ගතිමි.

"මට දුක් දුන්නට කමක් නෑ විශ්ව... ඔයයි මායි ගැන බලාගෙන ඉන්න මයෙ අසරණ අම්මට මේවා දැනගන්නත තියන්නෙපා... මං දුක් විඳින වග දැනගත්තොත්.... මයෙ අම්මා මැරෙයි විශ්ව..."

මට ආයෙමත් ඉකිගැසිණි. විශ්ව තදකොට මා වැළඳගෙන හෙමීට... හෙමීට... මගේ හිසත් පිටත් පිරිමැද්දේය. හැමදාම, හැමදාම... හිතේ සතුටත් සමඟින්ම මෙහෙම ඉන්නට ඇත්නම්... කියා මට සිතිණි.

තරු එළි දිලෙන දිලි දිලි නිවෙන
අඩ සඳ නැඟී මල්වර රැයක
පපුතුර දවන සුසුමක පහස
විඳ විඳ තැවිණි අවපස අහස...

මල් පෙති තෙමා පිණි කැටි ඉහෙන
ඇස ඇස ගැටුණු පෙරදා හවස
වා සුළි මැදින් අක් වැසි වැටී
දෙකොපුල් පුරා කඳුළැලි රැඳිණ...

බැඳි ආදරේ අමතක කරන්
ඔබ ඔබෙ ලොවට යන්නට හදන
බෝ දුක් සුසුම් මුවගින් නැගෙන
මට ළඟ වැඩියි මේ පෙම් කඳුළ...

දහසක් පැතුම් ගොනුකොට ළයේ
දුන් හාදුවෙන් හිත උණුහුමට
ඒ පෙම නිමයි ඔබ දුරක යයි
මම වෙමි පොළොව ඔබ වේ අහස...

# 10

**ඊට පසු...** දවස් ගෙවුණේ සෙමිනි. දවස් වලට ඔහේ ගෙවෙන්නට හැරියා විනා උනන්දුවෙන්, මා වෙනුවෙන්, කියා මා කළ දෙයක් නැති තරම්ය. පුරුදු සේ හැමදාම විශ්ව මා බලන්නට ආවේය. ඔහු මට කියවන්නට පත්තර ගෙනාවේය. පොත් ගෙනාවේය. වෙනදා සේ විහිළු කළේය. සත්තකින්ම... මම සතුටින් උන්නෙමි.

"අපේ ඔෆිස් එකේ ඉන්නව සොනාලි කියල ගර්ල් කෙනෙක්... එයාට ආසයිලු ඔයාව දකින්න..."

දවසක් විශ්ව කීවේය.

"ඉතිං දවසක එයාව මෙහෙ එක්කරන් එන්න..."

"මං සෙනසුරාදාවක එක්කරන් එන්නං... එයා හරි හොඳ ළමයෙක්.. ඔයාට හොඳ යාළුවෙක් හම්බුණා වගේ වේවි..."

"අනාවැකි කියන්න ඉස්සෙල්ලා ඔයා එයාව එක්කරන් ඇවිත් ඉන්නකෝ..."

"එහෙමයි දේවිය..."

විශ්ව කියන්නේ හිස පාත්කොටගෙනය. මම බොරු තරහක් මවාගෙන සෙ මෙන් ඔහුගේ උරහිසකට ගැසුවෙමි. විශ්ව මහ හයියෙන් හිනැහුණේය. මම සතුටින් උන්නෙමි. සත්තකින්ම, බොහෝ කලකට පසු විශ්ව නිසා මා සිනාසුණා නම් ඒ අදය. විශ්ව ගෙවුණු යටගියාව හාරා අවුස්සා මා රිද්දුවේ නැත. ඔහු කළේ හැම තත්පරයේම මා සතුටින් තැබූ එකය. මම ඉස්සරම ඉස්සර සේ දඟ කෙල්ලක වුණෙමි. වෙනදාට වඩා අම්මාට ළං වුණෙමි. අම්මා කළ හැම කටයුත්තකදීම උවමනාවටත් වඩා ඈට උදව් කළෙමි. විවේක වෙලාවට විශ්ව ගෙනා පොත් කියෙව්වෙමි.

දවසක්... එක සෙනසුරාදාවක... මට විශ්වගේ කාර්යාලයේ යෙහෙළිය සොනාලි මුණ ගැසිණි. මට ඈ හමුවුණා නොවේ... විශ්ව... ඈ අප නිවෙසට කැඳවාගෙන විත් මට මුණගැස්සුවායි කීවොත් එය ඇත්තකි.

"සොනාලිට වයස කීයද?"

විශ්ව සාලයේ නවතිද්දී මා හා කුස්සියටම ආ සොනාලියෙන් මම ඇසුවෙමි.

"මට විසි එකයි... ඔයාට..."

"මටත් විසි එකනේ..."

මම සිනාසුණෙමි. සොනාලි ජනේලයේන එපිට බලාගෙන මොනවාදෝ කල්පනා කරයි. මම ඇගේ ලස්සන ඇස්, සිහින් දෙතොල් පට, පිරුණු කම්මුල් දෙස උවමනාවෙන් බලා උන්නෙමි.

"සොනාලි හරි ලස්සනයි..."

අවසන මම කීවෙමි. ඈ දෑස විදහා හිනැහුණාය.

"සොනාලිගෙ ගම කොහෙද?"

"මං කෑගල්ලෙ..."

"විශ්වලගෙ ගෙවල් කිට්ටුව... නේ...?"

"ඔව්... විශ්ව අයියා කඩුගන්නාවෙනෙ... පහුගිය වීක් එන්ඩ් එකේ ගෙදර යද්දි මං ගියෙත් එයා එක්ක... මාව ගෙදරටම ඇරලවල තමයි විශ්ව අයියා ගියේ..."

මගේ හිත තිගැස්සුණු තරම පහදා කිව හැකි නොවේ. සොනාලි දිගටම කියවන්නීය.

"ඔෆිස් එකේ අය හිනාවෙනව අපි දෙන්නා ගෑනියි මිනිහයි වගේ එකටම ඉන්නව කියල... එහෙම කියනකොට විශ්ව අයියා කෑ ගහනව සුරංගනාවියක් වගේ කෙල්ලෙක් මං එනකල් බලාගෙන ඉන්නව... මට වෙන ගෑනු ඕන්නෑ කියල..."

සොනාලි සිනාසෙයි. මම යාන්තමට දෙතොල් සොලවා සිනාසුණා විනා වැඩියමක් කියන්නට නොගියෙමි. ඒත් සොනාලි කී කතාව හින්දා හිත ටිකක් ආඩම්බර වුණු වග නම් සැබැවි.

"හැබැයි විශ්ව අයියා ඔයා ගැන කියාපුවා හරි..."

"මොනවද?"

"ඔයා හරි ලස්සනයි... තව... අහිංසකයි... වැඩිය කතා කරන්නෑ..."

"පිස්සි... මං වැඩිය කතා කරන්නෑ... කොහොමද එහෙම හිතුණෙ...?"

"ඇයි ඉතිං... දැං මං ඔයත්තෙක්ක මොන මොන දේවල් කියෙව්වද... ඒත්... ඔයා නෑනෙ වැඩිය මොනවත් කියන්නෙ..."

"තරහකට එහෙම නෙවේ සොනාලි... මං තේ හද හදනෙ හිටියෙ... තව ටිකක් ඉන්නකො... මං ඔයාට කතා කරල පෙන්නනන්න..."

සොනාලි ආයෙමත් හිනැහුණාය.

"මොකද ගෑනු ළමයි දෙන්නා කැකිරි පලන්නෙ..."

විශ්ව කුස්සියේ දොරකොඩින් එබිණි. සොනාලි ඔහු ළඟට ගොස් කනට කර මොනවාදෝ කියා හිනැහුණාය. මම තිගැස්සී ගියෙමි. මොන පච්කාරකමක්දැයි නෙ

ාදනිම. විශ්ව වෙන කෙල්ලක හා ඕනෑවට වඩා දොඩවනවාට සිනාසෙනවාට මගේ කැමැත්තක් තිබුණේම නැත. සමහර වට ආදරේ වැඩි නිසාය. විටෙක මා විශ්වව සැක කරන්නේද මේ හේතුව නිසාමය.

"කවි... ඔයා මාව අවිශ්වාස කරනවද?"

සමහර විටෙක විශ්ව අසයි. නැහැයි කියා කීවත්... ඇත්තටම එය එසේ නොවේද? කෙසේ හෝ වේවා...

සොනාලි පැමිණ ගිය දා පටන් මගේ හිත තිබුණේ අවුලෙනි. ඈ දඟකාරියක් නිසා නොවේ. ඈ ඕනෑවටත් වඩා සිනාසෙන යුවතියක් නිසා නොවේ. මොකක්දෝ පහදා කිව නොහැකි අපැහැදීමක් මා හිතේ මෝදු විණි.

"සොනාලි ඔයාව මතක් කරන්න කිව්ව..."

සමහර දිනවල හැන්දෑවේ ගෙදරට එන විශ්ව කියයි. මම තිගැස්සෙමි. මගේ හිත රිදේ. කීරි ගැසේ. ඒත්... සොනාලි ඇසුරු කරන්නට එපා කියා මා විශ්වට කිය න්නේ කෙසේද?

"ඔයා හරියට වෙනස් වෙලා කවි..."

සමහරදාට විශ්ව කියයි. ඔහු එසේ කියන්නේ මා කතා නොකර හිඳිනු දුටුවිටය. මම මොනවත්ම නොකියා සිනාසෙමි.

"යං ගමනක්..."

එවිට ඔහු කියයි. මම තිගැස්සී ඔහු දෙස බලමි. යන්නේ කොහේදැයි අසන්නටවත් මට නිනව් නොවේ. මම හනික ගෙට ගොස් දණහිස තෙක් දිග රැළි සායත් විශ්ව වැඩියෙන්ම ආසා කරනා පුංචි ටී ෂර්ට් එකත් ඇඳ ගත්තෙමි.

"ම්... මාර ලස්සනයිනෙ..."

විශ්ව කීවේ මගේ හිසේ සිට පාදාන්තය තෙක්ම බලන අතරේය. මම නොරි දෙන්නට ඔහු අත්ගොබයක් අල්වා කෙනිත්තුවෙමි.

"කොහෙද යන්නෙ...?"

"කොහෙ වුණාම මොකද... ගිහිං අම්මට කියල එනවා..."

විශ්ව බොරුවට මට සැරවුණේය. නෝක්කාඩු බැල්මක් හෙලූ මම ආපසු ගෙට ගොස් විශ්ව හා යනවග අම්මාට කීවෙමි. යන්නේ කොහේදැයි අසනවා තබා හිස ඔසවා වත් මා දෙස බැලුවේ ඈ නොවේ. මගේ හිත ටිකක් නොවේ... හොඳටෝම රිදිණි. ආපසු විශ්ව උන් තැනට ආ මම කතාවක් නැතිවම ඔහු අතේ එල්ලුණෙමි.

"මොකෝ... අම්ම කිව්වද යන්නෙපා කියල..."

"නෑ... මොකුත් කිව්වෙ නෑ..."

විශ්ව මිදුලට බැස බයිසිකලයට නැඟ මාද එහි හිඳුවා ගත්තේය. ඔහු හා මුලින්ම ගිය ගමන සිහිවී නොදැනීම මට සිනා නැඟිණි.

විශ්ව මා රැගෙන ගියේ මූදු වෙරළටය. ඉස්සරම ඉස්සර සේ පුස්තකාලය පිටුපස පොල් වත්තට ගිය අප බිමින් හිඳගත්තේ බයිසිකලය ළඟ තිබුණු ගසකට හේත්තු කර ඒ අහවරවය.

"කවී..."

මම ඇස් හරවා විශ්ව දෙස බැලීමි. ඔහු ආදරෙන් බලා හිඳී.

"මං ආදරෙයි රත්තරං..."

ඔහු ආයෙමත් කීවේය. මම හනිකට ඔහු ගෙළ මුල මුහුණ හංගා ගත්තෙමි. ඉකි ගැසුණේ හැඬුණේ දුකටද සතුටටද කියා නොදන්නෙමි. විශ්ව උන්නේ මොකුත්ම නොකියා මා හිස පිරිමදිමිනි.

"මං ගැන අවිශ්වාසද? සැකද?"

ඔහු ඇහුවේය. මම ඔහු අතැඟිලි මා අතැඟිලි වල පටලවා ගතිමි.

"කියන්න කවි... මාව සැකද?"

මම ඔහු අත්ල මා මුවට තබා හෙමීට සිඹ ගත්තෙමි.

"මොනවද වුණේ කියන්න... මං අද ඔයාව මෙහෙ එක්කරන් ආවෙත් නිදහසේ ටිකක් කතා කරල... ඔය හිතේ තියෙන දේවල් එළියට ගන්න හිතාගෙන..."

"මට බයයි විශ්ව..."

"බය තියෙන්නෙ මං දාලා යයි කියලද... දාලා ගිහිං වෙන ගෑනියෙක් ගනියි කියලද? එහෙම කරන්නෑ කෙල්ලෙ..."

"දෙයියන්ගෙ නාමෙට දුකක් නං දෙන්නෙපා මගෙ විශ්ව... ඔයා දන්නවද... මං ගෙදර ඉන්නෙ පිස්සියෙක් වගේ... මයෙ අම්මා මං එක්ක දවසකට කතා කරන්නෙ වචන දෙක තුනයි... ඒත්... මොකක් හරි උවමනාවක් තිබ්බොත් විතරයි... මට තවත් එහෙම තනිවෙලා ජීවත්වෙන්න බෑ රත්තරං... ඉස්සර අපි එහෙම නෑ... අම්මයි මායි අප්පච්චියි... අපි ජීවත් වුණේ මොන තරං නං සන්තෝසෙන්ද? අනේ, ඇයි විශ්ව අපිට මෙහෙම වුණේ... ගහක් ගලක් වගේ හිටපු මයෙ අප්පච්චි... ඔයාලටත් ගුරුහරුකම් දීගෙන ඉඳපු මයෙ රත්තරං අප්පච්චි... හොරු අරං ගියා වගේනේ... තාමත් මයෙ අම්මා මතක් වෙන හැම වෙලාවකම ඉකි ගගහ අඬනව... අඬල ඉවරවෙලා අන්තිමට කියනව... මං හිත්දලු මේ හැමේකක්ම වුනේ... අ...නේ... මං මහා පව්කාරියෙක් විශ්ව..."

මා කියවාගෙන ගියේ හඬ හඬාමය. විශ්ව මා හිස සිය පපුතුරට තබා තදකොට ගෙන හයියෙන් මා මිරිකා ගත්තේය. ඊට පසු... විසල් සුසුමක් හෙලුවේය. සත්තකින්ම මම දැවුණෙමි. පිච්චුණෙමි.

දැන්... ඉස්සර සේ නොවේ. මට හොඳට දුක් දැරිය හැකිය. හොඳටෝම විඳවිය හැකිය. කඳුළු හිත් පත්ලේම හංගා කාටත් පෙනෙන්නට හොඳට සිනාසිය හැකිය. මා වෙනස් වුණේ කවදා පටන්දැයි හරි හැටි මතකයේ නොවේ. ඒත්...

එය කළේ විශ්ව වග නම් මට වැටහේ. ඔහු දැන් ඉස්සර සේ බොළඳ නොවේ. ආදරේ හිතෙන දේ නොකියයි. අපේ විවාහය, බලාපොරොත්තු ගැන මොන තරම්

දේ කීවත්... සමුගෙන යන්නට පෙර මං හුඟක් ආදරෙයි රත්තරනෙ... කියා කියන්නේ නැත. මම බලා ඉමි. අද නැතත්, හෙට හෝ ඔහු එසේ කියනු ඇතැයි සිතා මම බලා ඉමි.

"ගිහිං එන්නං..."

කියා ඔහු කඩුල්ල පනියි. මම තවත් වරක් ඒ ඇස් දෙස බලමි. ඔහු සිනාසේ.

"බුදු සරණයි රත්තරනෙ..."

මම ඔහු අත්ල මිරිකාගෙන කියමි. ඔහු මොනවත්ම නොකියා ආපසු හැරෙයි. මම කඳුළු හිර කරගෙන සුසුමක් හෙලමි. වෙන මා මොනවා කරන්නද? සුදු වැලි පාර දිගේ මා ගෙට එසන්නේද හිත දුකින් බර කොටගෙනය. ඉස්තෝප්පුවේ පඩිපෙලේ උඩම පඩයට වී මම කඩුල්ල දෙස බලා ඉමි. ඉස්සර... මා පාසල් ඇරී දුවගෙන එන්නේ ඔය කඩුල්ලට උඩින් පැනගෙනය. එදවසද, කොල්ලා මෙන් හැසිරෙන්නේයැයි කියා අම්මා කොතෙක් බැන්නද අප්පච්චි නම් ගත්තේම මගේ පැත්තය. අම්මා පොල් අතු රටාවට අතුගාන මිදුල පුරා ඇට්ටේරියා කෝටුවකින් ඉරි අඳින්නේද මාය. එසඳ, ඈ මට ගහන්නට එලවන්නේද ඒ කෝටුවම උදුරාගෙනය.

"මයෙ දෝණිට ගහනව එහෙම නෙවේ..."

අප්පච්චි හිනැහී කියයි. අම්මා ගෙට යන්නේ බොරුවට අප දෙදෙනාටම බැන බැනය.

අනේ, එදා මොන තරම් නම් ලස්සනද? දැන් අප්පච්චි නැති වග සැබෑව. තමා ගැන සුන්දරම සුන්දර මතකයක් පමණක් අප ළඟ ඉතිරිකොට තබා ඔහු අප දමා ගිය වගත් සැබෑවි. ඒත්... දැන් අම්මා මා ගැන නොසලකා හරින්නේ ඇයි? මට එසේ අසන්නට සිතිණි.

"අම්මා..."

මම ඇගේ කාමරයට එබුණෙමි. අම්මා උන්නේ ඇඳුමක් මසමිනි.

"අම්මා..."

මම ඈ ළඟටම ගියෙම. එවර නම් ඈ යාන්තමට හිස හරවා මා දෙස බැලුවාය.

"ඇයි මාත්තෙක්ක තරහ වෙලා වගේ ඉන්නේ..."

මම කෙලින්ම ඇසුවෙම. ඈ මොකුත්ම නොකියා හිනැහුණාය.

"කියන්නකො අම්මා... තරහද මාත්තෙක්ක..."

"ඔව්..."

"ඇයි ඒ...?"

තත්පර කීපයක්ම අම්මා කළේ මා දෙස බා සිටින එකය. ඊට පසු ඈ හෙමීට මෙහෙම මිමිණුවාය.

"අප්පච්චිව මරාගත්තෙ උඹ... හැමතිස්සෙම මට ඒක මතක් වෙනවා..."

"නෑ අම්මා..."

"ඊළඟට මැරෙන්න ඉන්නෙ මං... උඹට පුළුවන් ඒ ටිකත් කරන්න... වැඩි දවසක් යන්න ඉස්සරින් මාවත් මරල දාපං... එතකොට සේරම ඉවරයි..."

"අම්මා..."

මම කෑ ගැසුවෙමි. අම්මා බාගෙට මැසූ ඇඳුම අතට ගෙන නැවතත් එය මස න්නට පටන් ගත්තාය. මම කාමරයට ගොස් දොර වසාගෙන ඇති තරම් ඇඬුවෙමි. හිතට දැනෙන පීඩාව කියා නිමකරන්නට හැකි කමක් නොවේ. මා මේවා කාට නම් කියන්නද? විශ්ව වත් ළඟ උන්නා නම්...

හැන්දෑව ගෙවෙන තෙක්ම මා කළේ හඬන එකය. ඊට පසු මට එහෙම්මම නින්ද යන්නට ඇත. සිහිනෙන් මම අප්පච්චි දුටුවෙමි. ඉස්කෝලේ යන කාලේ ඔහු ඇන්ද වේට්ටියත් දිග කමිසයත් වගේ එකකි ඔහු ඇඳ සිටියේ.

"මයෙ දෝණි..."

මා ඔහු ළඟට ගියකල ඔහු පුරුදු දයාවෙන්ම මා හිස අතගෑවේය. එපමණකි...

මම තිගැස්සී අවදි වුණෙමි. කළුවරය... මුළු ගේම කළුවරය. අසීරුවෙන් නැඟ ිට ගොස් විදුලි පහන දැල්වූ මම වෙලාව බැලුවෙමි. රෑ එකොළහත් පසුවෙමින් තිබේ.

කාමරයේ දොර හැරගෙන සාලයට ආ මම එහිද විදුලි පහන් දැල්වූයෙමි.

"අම්මා..."

මම මුළු ගේ පුරාම ඈ සෙව්වෙමි. තව බලන්නට ඇත්තේ කුස්සියේ පමණකි. මා කුස්සියට ගොස් එහි විදුලි පහන දැල්වූයේ හිතේ ගිනි ඇවිලෙද්දීමය.

"අම්මා..."

මට කෑ ගැසිණි. මම හයියෙන්... මහ හයියෙන් කෑ ගැසුවෙමි. ඒත්... කුස්සියේ බාල්කයක එල්ලී අම්මා නිසොල්මනේම උන්නාය. මම ඈ බදාගෙන කෑ ගැසුවෙමි. ඇති තරම් හැඬුවෙමි.

මට සිතුණේ ඒ සිහිනයක්... බියකරු සිහිනයක් පමණක් බවය. මම විටින් විට කෑ ගැසුවෙමි. මගේ කෑ ගැසීමට දුවගෙන ආ ගම් වැසියෝ සියලු දේ සංවිධානය කරද්දී මා කළේ මා කළේ හඬ හඬා ඔහේ බලා හිඳීමය. විශ්ව, ශිරෝමි පමණක් නොවේ... මගේ යහළු යෙහෙළියෝ බොහෝ දෙනා ආරංචිය ලද සැණින් පැමිණියහ. මම ශිරෝමි බදාගෙන හැඬුවෙමි. බොහෝ වේලා හැඬුවෙමි.

"දැං ඉතිං අඬල වැඩක් නෑනෙ දූ... නාඬා ඉන්න... මං ඉන්නවනෙ ඔයාට..."

විශ්වගේ අම්මා මා හිස අතගා කියන්නීය. ඒත්... ඈ කියන්නා සේ මට මගේ අම්මා අමතක කළ හැකිද? ඈ මා දමා ගියේ ඇයි? කවුරුත් මැරෙන වග සැබෑවි. ඒත්, ඈ ඕනෑකමින්ම ජීවිතය නැති කරගත්තේ ඇයි? ඈ මියැදුණු පසු මා තනිවෙන වග මොහොතකටවත් ඈ නොහිතුවේ ඇයි?

"විශ්ව... වි...ශ්ව..."

මම මා ළඟින් ගිය විශ්ව දෙසට අත දිගුකර කෑ ගැසීමි. ඔහු ආවේ දුවගෙනමය.

"ඇයි රත්තරනෙ..."

විශ්ව හෙමීට මගේ කම්මුල් පිස දැම්මේය. මට නැවතත් හැඬිණි. දැන් නම් හඬන්නට කඳුළුද නැති තරම්ය.

"විශ්ව..."

"ඇයි...?"

"අම්මා මාව දාල ගියා..."

විශ්ව මොනවත්ම කීවේ නැත. මම හයියෙන්ම ඔහු සුරත මිරිකා ගත්තෙමි.

"විශ්ව..."

"ම්..."

"මං තනි වුණා..."

"නෑ..."

"නැත්තෙ මොකද... මං තනිවුණා..."

"නෑ කවී... ඔයාට මං ඉන්නව... අපේ අම්මල ඉන්නව... ශිරෝමි ඉන්නව..."

"කවුරු හිටියත් මයෙ අම්මා වගේ නෑ..."

මම කෑ ගසා කිව්වෙමි. කීප දෙනෙක්ම එක්වරම මා දෙස බැලූහ. මම සාලයේ හරි මැද තබා තිබුණු අම්මාගේ නිසල දේහය දෙස බැලුවෙමි. ඈ මේ කිසිත් නොදන්නා සේ නිදයි. මා විඳින දුක නොවැටහෙන්නා සේ ඈ සුවසේ නිදයි.

ඊට පසු... දින තුනකින් පසු... අම්මාගේ අවසන් කටයුතු සිදුකෙරිණි. අප්පච්චි වැළලූ තැනම... ඒ ළඟම තැනෙක අම්මාගේ මිනී වළද කපා තිබිණි. අතට ගත් පස් මිටක් වළට හෙලා මම ඔහේ බලා උන්නෙමි. පස් දමා මිනීවල වැසූ පසුද මා කළේ ඒ ළඟ බිම වාඩිවී ඒ දෙස බලා ඉන්නා එකය.

අප්පොච්චිව විතරක් නෙවේ... අම්මවත් මරා ගත්තා..."

"මඟුල් විසේ ඔලුවට ගැහුවම ඔහොම තමයි..."

"ඉස්කෝලෙ මහත්තයා හැදුවෙ නං මලක් වගේ..."

ගමේ ගෑනු කී එවන් කතා සමහර විට මගේ කනටද වැටිණි. ඔවුන් හිතන්නේ අම්මා මැරුණේ මා විශ්වට ආදරය කරන නිසා බවය. මට නම් මේ කිසිවක් හරි හැටි නොවැටහේ. අම්මා මගෙන් වෙන්වුණේ අප්පච්චි ළඟට යන්නට විය යුතුය. එය වරදක් නොවේ. ඔවුන් මේ භවයේදී මෙන්ම ඊළඟ භවයකදවීත් එක් විය යුතුමය. ඒත්... අම්මාට තිබුණේ ඒ වග මට කියා යන්නටය...

"කවි..."

මම හිස හරවා බැලුවෙමි. විශ්ව... ඔහු පාත්වී මා දෙඋරහිසින් අල්වා නැඟ

ට්ටෙව්වේය. මට මතක මා නැඟිට ඔහුට වාරුවෙනවා පමණකි.

"කව්..."

මා නැවත ඇස් ඇරියේද ඒ සදාදරණීය කටහඬටය. ඔහු මා හිස අතගාමින් උන්නේය.

"ව...තුර..."

මම කෙඳිරීමි. විශ්ව වතුර වීදුරුවක් ගෙන මගේ මුවට ළං කළේය. මම එය බීගෙන බීගෙන ගියෙමි.

"ඔහොම්මම ටිකක් නිදා ගන්න..."

විශ්වගේ අම්මා කීවාය. මම නැවතත් ඇඳේ හාන්සි වීමි. ඊළඟට මා ජීවිතයට මුහුණ දිය යුත්තේ තනිවමය. මට හීල්ලිණි. දෛවය හැම දෙයක්ම තීරණය කොට තිබුණේ මට අවාසියටය.

මම තනිවුණෙමි. මුලින්ම අප්පච්චි මා හැර ගියේය. ඊට පසු ගියේ අම්මාය. මගේය කියා කියන්නට තව ඉතිරිව ඉන්නේ විශ්ව පමණකි.

"මේ ඉන්න නෑදෑයො ගියාට පස්සෙ ඔයා තනිවෙයි..."

ඔහු කීවේ අම්මාගෙ හත්දවසේ දානය දෙන්නට දිබ්බැද්දේ පන්සලට ගොස් එන අතරේය. මට හිල්ලිණි.

"නිට්ටඹුවෙ නැන්දා කිව්ව ටික දවසක් ඉන්නං කියල..."

විශ්ව කියවයි. මට ඊට එකඟ වෙන්නට හෝ එරෙහි වෙන්නට හැකියාවක් නො වේ. සියල්ල තීරණය කළේ ඔහුය. මට දැන් ඇති එකම පිහිටද ඔහුය. කොහොමටත් මා ඔහු කියනනක් කළ යුතුමය.

"මොකද ඔයා කියන්නෙ...?"

"ඔයාට කැමති දෙයක් කරන්න විශ්ව..."

"එහෙම නෙවේ..."

"ඒක එහෙම තමයි... මං කැමතියි හැමදේම ඔයා තීරණය කරනවට..."

මම ඔහු අත්ගොබයක එල්ලුණෙමි. විශ්ව ගමන් වේගය මඳක් අඩු කළේය.

"නැන්දත්තෙක්ක අර අඟත් නවතියිද දන්නෙ නෑ..."

ඔහු කීවේ අපට මඳක් ඉදිරියෙන් ගමන් ගන්නා නැන්දාත් ඇගේ දුව මනීෂාත් පෙන්වමිනි. හයියෙන් සිනා යන්නට ආවද, මම සිනාව මුව තුළම තෙරපා ගත්තෙමි.

"මං නං කැමතියි එයත් මෙහෙ ඉන්නවනං..."

විශ්ව කියන්නට ඇත්තේ මා අවුස්සන්නට විය යුතුය. ඒත්, එයින් මහිත රිදිණි. ටිකක් නොවෙ...ෙ හාඳටම රිදුණි. මගේ ඇස් වලට කඳුළු පිරෙන්නට ඇත. මම මූණ බිමටම පාත්කොට ගතිමි. විශ්ව පාත් මගේ මුහුණට එබිණි.

"මොකෝ මේ...?"

"මම කිසිත් නොදෙඩිමි.

"අනේ මං අර කියපු කතාවටද... සොරි කෙල්ලෙ... මං හිතල කිව්ව නෙ වේනෙ..."

"ඔයා හිතල කිව්වත්... නොහිතා කිව්වත්... ඒ වගේ කතා කියද්දි නිකම්ම මට රිදෙනව විශ්ව... ඔයාට තාම ඒ ටික තේරුම් ගන්න බැරිද? අඩු ගානෙ... මං තනිවෙලා ඉන්න කෙනෙක්... මට අම්මා නෑ... අප්පච්චි නෑ... මට ඉන්නෙ ඔයා විතරයි කියනෙකවත් තේරෙන්නැද්ද?"

"එකපාරක් කිව්වනෙ... සොරි..."

එවර නම් ඒ හඬ මඳක් වේගවත්ය. ඊට පසු... ගෙදරට එනතෙක්ම විශ්ව මොනවත්ම කතා කළේ නැත. මමද කරබාගෙනම උන්නෙමි. හිත රිදුණු වග සැබැවි. කීප වරක්ම ඇස් වලට කඳුළු පිරුණු වගද සැබැවි. ඒත්.... හැමදාමත් මා කළේ විඳවන එකය. කොයි දේටත් සීමාවල් තිබේ. මගේ ඉවසීමටද එය එසේම විය යුතුය.

"අක්කා... විශ්ව අයියා අහනව එයා අදත් නවතින්නද ගෙදර යන්නද කියලා..."

රෑ බෝවූ වෙලාවේ කුස්සියට වී තේ හදමින් උන් මා ළඟට ආ මනීෂා ඇහුවාය. මගේ තරහ ඇවිස්සිණි. විශ්ව යන්න හැදුවාට නොවේ. ඔහු ඒ පණිවිඩය මනීෂා අත මගෙන් අසා එව්වාටය මට තරහ හිතුණේ...

"එයාට යන්න කියන්න..."

මම කීවෙමි.

"අනේ පව්නෙ අක්කා... එයාට ඉන්න කියන්නකො..."

"මනීෂා... එයා ඔයාගෙනං ඉන්න කියන්න..."

මනීෂා බිම බලාගෙනම කුස්සියෙන් එලියට ගියාය. තේ හදා සාලයට ගෙන ගිය මම සාලයේ උන් සියල්ලන්ටම තේ දී ආපසු ගෙට ගියෙමි.

"කවී..."

විශ්ව පිටුපසින් විත් මගේ උරහිසකින් අල්වා ගත්තේය. මම එක එල්ලේම ඒ ඇස් දෙස බැලුවෙමි.

"මොකෝ අර ළමයට බැන්නෙ...?"

"ඇයි දුකද?"

"මං අහන්නෙ ඒක නෙවේ... ඇයි ඔයා අර අහිංසක ළමයට බැන්නෙ...?"

"බැන්නෙද... බැන්නෙ මට තෝල්කකම් කරන්න ආවට... විශ්ව... තේරුම් ගන්න... මං කැමති නෑ ඔය වගේ වැඩවලට... මීට ඉස්සර අපිට තෝල්කයො ඕන වුණාද කතා කරන්න... ඒත්... අපි සතුටින් හිටියෙ නැද්ද?"

මම කියවාගෙන කියවාගෙන ගොස් කෙලින්ම ඒ ඇස්වලට එබුණෙමි. විශ්ව වෙනතක් බලාගත්තේය. මට දුක සිතිණි. හොඳටෝම දුක සිතිණි.

ඈත මිටියාවතින් හිරු මියෙන හෝරාවෙ
පඬුපාට අහස හරි ලස්සනයි
අතින් අත අල්ලගෙන එදා මේ ඉසව්වේ
අපි උන්නු දා වගේ පෙම්බරයි...

මගේ නළලත රැන්දූ ඒකම ඒක හාදුවෙන්
සසළ වුණු කඳුළු තව උණුහුමයි

# 11

**හැමදාකම...** හැම හැන්දෑවකම විශ්ව මා බලන්නට ආවේය. හිතේ ගින්දර කෙතරම් තිබුණත් මා බලා උන්නේ ඔහු එනතුරු ඒ දුක් සියල්ල ඔහුට කියන්නටය.

"මයෙ කවි..."

ඔහු ගෙට ගොඩවෙන්නේ එසේ කියාගෙනය. මම සැනසෙමි. සත්තකින්ම මගේ මුළු ලෝකයම ගොඩනැගුණේ ඒ ඇස් පාමුලේ නොවේද?

"කොහොමද?"

හැමදා පුරුදු සේ ඔහු අසයි. මම හිනැහී හිස සලමි.

"ගෙදර ඉන්න කම්මැලිද?"

"ඔව්..."

"මොකක්ද මං කරන්නෝනා..."

"විශ්ව..."

"කියන්න... මොකක්ද මං කරන්නෝනා..."

"විශ්ව..."

"ම්..."

මම විශ්වගේ අත්දෙකම අල්වාගෙන ඒ ඇස්වලට එබුණෙමි. ඔහු බලා හිඳී. අනන්ත දයාවක් ඇස්වල තවරාගෙන ඔහු බලා හිඳී. මම හිතේ හිරකරගෙන උන් හැඟීම් වචන වලට හරවා හෙමීට පෙළ ගැසුවෙමි.

"අපි බඳිමු..."

විශ්වගේ ඇස් විසල් වුණේ පුදුමයෙන්ද, සතුටින්දැයි මට නොවැටහිණි. ඒත්... තත්පර කීපයක් යනතුරු ඔහු කතා කළේ නම් නැත. මම බලා උන්නෙමි. ඒ ඇස්

දෙසම බලා උන්නෙමි. ටිකකින්...

ඔහු හිනැහිණි. ඊට පසු... ඔහු හයියෙන් මා බදා ගත්තේය.

"කවී..."

"ම්..."

"හුඟක් ඉක්මන්ට බඳිමු..."

"හා..."

මම බොහෝ කලකට පසු සතුටු සිතින් විශ්ව හා කතා කළෙමි. වෙනදා සෝ නොව මා රෑ කෑම හදද්දී ද ඔහු මා ළඟටම වී උන්නේය. මට කියා බත් කවා ගත්තේය.

"කවී..."

"ම්..."

"නැන්දල කොහොමද?"

ඔහු අහන්නේ නිට්ටඹුවේ නැන්දා හා මනීෂා ගැනය. ඔවුන් හොඳයිකියා අවංකවම මා කියන්නේ කෙසේද? දවල් තිස්සේම ඒ දෙදෙනා කියන්නේ මට ඇනුම් පද කියන එකය. මට පමණක් නොවේ, ඔවුන් විශ්වටද එක එක දේ කියයි. මම ඒවා නෑසුණා සේ ඉමි. ඒත්... මගේ දුක බිඳෙන්නේ ඔවුන් මගේ අම්මාත් අප්පච්චීත් මියැදුණේ මා නිසා යි කියද්දීය.

"කියන්න කවී... ඔයාට වෙනස්කම් කරනවද ඒ ගොල්ලො..."

මට ඒ ඇස් දෙස බලා බොරු කියන්නට හැකි කමක් නොවේ. මම වෙනතක් බලා හිස සැලුවෙමි.

"මට බොරු කරන්නෙපා කවි... පව් සිද්ද වෙයි..."

"නෑ දෙයියනේ... බොරු කළා නෙවි... මං කොහොමද මං වෙනුවෙන් මේ තරං දුක් උහුලන ඔයාට තවත් කරදර කරන්නෙ...?"

"කවී... මේ බලන්න..."

විශ්ව මගේ මුහුණ උඩට උස්සා හෙමීට නළල සිඹ ගත්තේය. මට හැඬිණි. දුකට නොවේ. ඒ ආදරය දරා ගන්නට නොහැකි තැනය.

"කවි අඬන්නෙපා... ඔයා ඉන්නෙ ඔයාගෙ ගෙදර... කාටවත් බයේ ඔයා මෙහෙ ඉන්නෝනෙ නෑ... මට කියන්න... ඔයාට වෙනස්කම් කරනවද ඒ ගොල්ලො... මං ඒ ගොල්ලන්ට මෙහෙ නතරවෙන්න කිව්වෙ ඔයා මෙහෙම අඬනව දකින්න නෙවේ... අනික... ඔයා දැන් ඔය විදිහට අඬන්න ඕනෙ කෙනෙක් නෙවේ... ඔයා මගේ... කාටවත් බෑ ඔයාට රිද්දන්න... කියන්න කවී... ඔයා ඇයි මේ සතුටු වෙන්න ඕනෙ වෙලාවෙත් අඬන්නෙ..."

"විශ්ව... දැං මොකුත් අහන්නෙපා... ඉස්සෙල්ලම ඔයා මාව බැඳල මේ ගෙදර

පදිංචියට එන්න... ඊට පස්සෙ... අපි ඒ ගොල්ලන්ට යන්න කියමු... එතකොට මේ හැම දෙයක්ම විසඳෙයි... ඔයා... මං... විතරක් නෙවෙයි... මැරිච්ච මයෙ අම්මයි අප්පච්චියිත් සතුටු වේවි..."

මම කියවාගෙන කියවාගෙන ගියෙම. විශ්ව හයියෙන් සුසුමක් හෙලුවේය. මම තිගැස්සී ඇස්පිය ඉස්සුවෙමි. ඔහු පාත්වී මගේ කම්මුල් රිදෙනතුරුම සිඹ ගත්තේය. මම තවත් වරක් හිනැහුණෙමි.

කොහොමටත් මා වැඩිපුර කතා කළේ, හිනාවුණේ විශ්ව ළඟ ඉන්නා විට විතරය. අම්මා ළඟ, අප්පච්චී ළඟ තරම්ම සෙනෙහසක් මා අත්වින්දා නම් ඒ ඔහුගෙන් වීම එයට හේතුවෙන්නට ඇත. අම්මා මියැදී තුන්මසක් ගෙවිණිද මගේ ජීවිතය වෙනස් වුණේ නැත.

මා හැර අන් සියල්ලෝම පුරුදු ජීවන රටාවට හැඩ ගැසී තිබිණි. මම... මම බොහෝ නිහඬ එකියක වීමි. ගෙදර මට අපායක්ම විණි.

හැම බදාදා හා සිකුරාදාම මම පුස්තකාලයට ගියෙමි. පැය දෙක තුනක්ම එක දිගටම පොත් කියෙව්වෙමි. බොහෝ විට මා ගෙදර එන්නේ රෑ බෝ වූ පසුය. මා එනතුරු නල්ලූරුව හන්දියට වී හිඳින විශ්ව එතැන් හිඳ මා බයිසිකලයේ නංවාගෙන ගෙදර ගෙන යයි.

"මොනවද මේ තරං වෙලා ගියේ..."

ඔහු අසයි. මම මොනවත් නොකියා හිනැහෙමි.

"කියනවකො... කිව් කිව් ගාන්නැතුව..."

"ලයිබ්‍රරි එක වහනකල්ම පොත් කියෙව්වා... අද අන්තිමට කියෙවවේ ඇට මැස්සා... ඒක කියවද්දි නං මට ඔයාව මතක් වුණා..."

"ඒ මොකද...?"

"ඔයත් ඇටමැස්සෙක් වගේනෙ... කෙට්ටුනෙ..."

"නරිච්චි..."

ඔහු පාත්වී මගේ උරහිසක් හැපුවේය. මම කෑ ගැසුවෙමි. විශ්ව හිනැහේ.

"මං ගෙට එන්නෝනෙද?"

ඔහු අසන්නේ කඩුල්ල අරින්නට හිතාගෙන මා බයිසිකලයෙන් බසිද්දීය. මට දුක හිතේ. ඔහු හදන්නේ මට වෙනස්කම් කරන්නද? මම කිසිත්ම නොකියා කඩුල්ල අරිමි. සුදුවැලි පාර දිගේ මා ගේ දෙසට යන්නේද විශ්ව තුට්ටුවකට මායිම් නොකරය.

"කවී... මේ..."

ඔහු බයිසිකලය තල්ලුකරගෙන මා පසුපස එයි..."

"කවී..."

ඔහු මගේ අත්ගොබයකින් අල්වා ගනී. මම නැවතී ඔහු දෙස බලමි.

"තරහද... මං විහිළුවට කිව්වෙ..."

"තරහ නෑ විශ්ව... ජාති ජාතිවත් තරහ නෑ..."

"හරි එහෙනං... දුවල දුවල කුස්සියට ගිහිං... මට බොන්න තේ එකක් හදන්න..."

මම ඔහු ළඟින් ඈත්වී ගෙට දුවමි. සාලයට වී ලොකු කතාවක ඉන්නා නැන්දාත් මනීෂාත් මගේ හඬට සිය කතාව නවතයි. නිසැකයෙන්ම ඔවුන් කතා කරන්නට ඇත්තේ මා ගැනය. ඕනෙ දෙයක්... මට මොකෝ... මේක මගේ ගෙදර... මම සිතමි.

"කවිතා... ඉක්මණට යන්නෝනා..."

විශ්ව සාලයේ හිඳම කෑ ගසයි. මම හනිකට තේ හදාගෙන යමි. ඔහු සාලයේ නැත. මනීෂාත් නැත. නැන්දා පුටුවක වාඩිවී රූපවාහිනිය නරඹයි. මම ඇස් එහෙ මෙහෙ යවා විශ්වත් මනීෂාත් කොහිදැයි සෙව්වෙමි.

එවේලේම... ඉස්තෝප්පුව දෙසින් මහා සිනා හඬක් ඇසිණි. මම වහා එදෙසට ගියෙමි. විශ්වත්. මනීෂාත් දෙදෙනාම ඉස්තෝප්පුවේ කොට තාප්පය උඩ වාඩිවී මොන මොනවාදෝ කියව කියවා හිනැහෙයි. තරහ ඇවිස්සිණිද, මම කිසිත් නොදොඩා ගෙන ගිය තේ කෝප්පය විශ්වට දී ඔවුන් දෙදෙනා මැදින් හිඳගත්තෙමි. මනීෂා නැගිට්ටාය. ගෙට ගියාය.

"ඔයා නං මාර ළමයෙක් තමයි..."

විශ්ව හෙමීට කීවේය.

"ඇයි?"

"අර ළමයගෙයි මගෙයි මැද්දට ඇවිත් වාඩි වුණේ... එයා මොනවා හරි හිතන්නැති..."

"හිතපුදෙන්... මං බය නෑ... ඒ ගොල්ලො ඉන්නෙ මගෙ ගෙදර... මං කියන විදිහටයි ඉන්නෝනා..."

"කවිතා... ඔයා හරියට නපුරු වෙලා..."

"තාම හරියට නපුරු වුණේ නෑ විශ්ව... හැබැයි... මේ හැම දෙයක්ම ඉවසගෙන ඉඳල... මට මේව ඉවසන්නම බැරි දවසක් එයි... එදාට... එදාට මොනවා වෙයිද කියලා කියන්න බෑ... සමහර විට මං අතින් මිනියක් දෙකක් මැරෙන්නත් ඉඩ තියෙනවා..."

"කවී..."

විශ්ව මගේ උරහිසකින් අල්වා මා ඔහු දෙසට හරවා ගත්තේය. ඊට පසු... කෙලින්ම මගේ ඇස් වලට එබුණේය. මම සීතලව ගියෙමි. ඒ ඇස් බලන්නට බැරි තරම් අහිංසකය.

"ඔහොම බලන්න එපා විශ්ව... අප්පච්චි වගේ... අම්මා වගේ... මටත් මැරෙන්න හිතෙයි..."

"පිස්සු කෙල්ල... වෙලාවකට පොඩි ළමයෙක් වගේ... හුරතල් වෙවී මාවත් පිස්සු වට්ටනවා... තවත් වෙලාවකට නපුරුම නපුරුයි... මට හිතාගන්න බෑ පැටියො... ඔයාගෙ මේ වෙනස..."

"මං නපුරු නෑ රත්තරං... ඔයාට තියෙන ආදරේ තමයි මේ හැම දෙයක්ම කරන්නෙ..."

හීන් සීරුවේ මිමිණූ මම විශ්වගේ උණුහුම් පපුතුරට හිසතියා ගත්තෙමි.

කෝඩු හිරිපොද වැටෙන
වස්සාන නිශාවක
රිදී රේඛා අකුණු
සරට හිත සසැලේය...

වැහි බිංදු එකතුකොට
සීතලට සිඹ ගත්තු
දෙතොල් පට සැලි සැලී
හිතේ දුක පවසාය...

ආදරේ දෝරෙ ගැලූ
ජීවිතේ වසන්තය
නියං සායට හසුව
ඉකිගසා වැළපේය...

ළං වෙන්න පිං පිරූ
සොඳුරූ ඒ සෙනේහය
අතැර වෙනතක ගියොත්
ඉතිං මං මියැදේය...

# 12

**මගේ** උපන් දිනය දා එළැඹිණි. මට ඒ වග සිහිවුණේ උදේ නැඟිටිද්දී අහම්බෙනි. සතුටක් වෙනුවට හිතට කාන්දු වුණේ දරාගන්නටත් බැරි තරම් දුකකි. ගිය අවුරුද්දේ මගේ උපන් දිනය දා අම්මා මගේ ළඟ උන්නාය. ඊට පෙර අවුරුද්දේ අම්මාත් අප්පච්චීත් දෙදෙනාම මා ළඟම විණි. හැම අවුරුද්දකම මගේ උපන් දිනය දා අම්මා කිරිබත් ඉව්වාය. අපි එක්ව පන්සල් ගියෙමු. ඒත්, අද... මම නැඟිට තේ හැදුවෙමි. මනීෂාත්, නැන්දාත් තවම නින්දේය. මට දැනෙන්නේ තරහකි. ඔවුන්ගේ හැම වැඩක්ම කළ යුත්තේ මාය. හැමදාම උදේට තේ හදන්නේ උයන්නේ, ගේ දොර අතුග ාන්නේ මාය. ඒවා විශ්ව දන්නේ නැත. දන්නවා නම්... මෙලහකටත් ඔහු නිට්ටඹුවේ නැන්දාත්, මනීෂාත් එලවාගෙනය.

"අක්කා... ලියුම් කාරයද කොහෙද?"

දහවලේ මා මල් පාත්තියක තණකොළ ගලවමින් හිඳිද්දී මනීෂා කෑ ගැසුවාය. මම නැඟිට්ටෙමි. ඈ කීවෙ ඇත්තකි. ලියුම් බෙදන්නා කඩුල්ල ළඟට වී ගේ දෙස බලා හිඳී. මා එදෙසට ගියේ දූවිලි තැවරුණු දෑත් පවා සෝදන්නේ නැතිවය.

"කවිතා ධනංජනී මිස්ට..."

ලියුම් බෙදන්නා ලියුම මා දෙසට දිගු කළේ මඳ සිනාවක් ඇතිවමය. මම වහා එය දිගහැර බැලුවෙමි. ඒ සුබ පැතුම් පතකි. එවා ඇත්තේ විශ්වය. අනේ, ඔහුට මගේ උපන් දිනය මතක තිබුණු හැටි... මම හෙමීට ඔහු ලියා තිබූ අකුරු පේළි දිගේ ඇස් යැව්වෙමි.

"මගේම කවි...
මේ ඔයා තනියෙම්ම ගෙවන
අන්තිම උපන් දිනය...
ලබන උපන් දිනය දා

ඔයා මං ගාව...

මගේ ගෙදර...

හොඳට මතක තියාගන්න

හෙට නැත්තං අනිද්දා

අපි බඳිනවා...

ඔයා මගේම වෙනවා...

මං ඔයාගෙම විශ්ව.

එක හුස්මටම ඒ කවිය කියවාගෙන ගිය මම එය නැවත කවරය තුළට දමා ගත්තෙමි.

"මොකක්ද අක්කා...?"

ඒ දෙස බලා හිඳි මනීෂා ඇහුවාය.

"බර්ත් ඩේ කාඩ් එකක්... අද මගේ බර්ත් ඩේ..."

"ෂා... එහෙනං පාටි එකක් ඕනෙ..."

"පිස්සු... මේ වෙලාවෙ පාටි දැම්මොත් මිනිස්සු අපිට ගල් ගහයි... අම්මා මැරිල මාස කීයද?"

"ඒකත් ඇත්ත... ඉතිං... කවුද ඔය කාඩ් එක එවල තියෙන්නෙ...?"

"විශ්ව..."

මම එසේ කියා කාමරයට වැදුණෙමි. කොහොමටත් මට මනීෂා එතරම් රිසි නොවේ. ඈද ඇගේ අම්මා සේම ඕපාදූප හොයන්නියකි.

මට ඕනෑ වුණේ හැන්දෑවට ගෙදර එන විශ්ව මා අතින් හොඳ කෑම වේලක් හදා දෙන්නටය. ඔහු හුඟාක් ආසා කරන කැරමල් පුඩිමක් මා අතින්ම හදා දෙන්නටය.

"අක්කා..."

මා නගරයට යන්නට ලෑස්ති වෙද්දී මනීෂා කාමරයට එබුණාය. මම හැරී එක්වරක් ඈ දෙස බලා නැවතත් ඇඳුම් අඳින්නට වුණෙමි.

"අක්කා..."

"ම්..."

"කොහෙද යන්නෙ...?"

"පානදුරේ..."

"හදිසියෙම..."

"විශ්ව හවසට එනව කිව්ව...එයාට කන්න ආස දෙයක් හදල දෙන්නෝනා..."

"ම්... පාටි නෑ කිව්වට ඔය තියෙන්නෙ..."

මනීෂා හයියෙන් හිනැහුණාය. මම මොකුත්ම නොකියා බෑගයක් ගෙන එළියට බැස්සෙමි.

මා පානදුරේ ගොස් විශ්ව කැමති හුඟක් දේ ගත්තෙමි. දැන් මට ඉන්නේ ඔහු විතරමය. එනිසාම නොවේ... මා ඔහුට මහ හුඟක් ආදරේ නිසාම මට ඔහු වෙනුවෙන් ඕනෑම දෙයක් කළ හැකිය. ඒත්... පොඩි අඩුවක් තිබේ. මට එය මතක් වුණේ දැන්ය. මම හනිකට මුදල් පසුම්බිය හැර එහි වූ පේ ෆෝන් කාඩ් එක ගෙන දුරකථන කුටියකට වැදුණෙමි.

බඩු බෑගය උරහිසක එල්ලාගෙන අසීරුවෙන් රිසීවරය ගත් මම විශ්වගේ සේවා ස්ථානයේ දුරකථන අංකය ගත්තෙමි.

"හෙ...ලෝ..."

අනෙක් පසින් ඇසුණේ ගැහැණු කටහඬකි.

"විශ්ව ඉන්නවද?"

මම ඇසුවෙමි.

"ඉන්නව... චුට්ටක් ඉන්න... කවුද මේ කතා කරන්නෙ...?"

"මං... කවිතා..."

"ආ... චුට්ටක් ඉන්න..."

තවත් තත්පර කීපයක් ගෙවිණි. විශ්වගේ හඬ ඇසුණේ ඊටත් පසුවය.

"විශ්ව..."

"කවි... මගෙ කෙල්ල... මී... මෙනි හැපි රිටර්න්ස් ඔෆ් ද ඩේ..."

"තැන්ක්ස්... විශ්ව... තැන්ක්ස් අ ලොට්... ඔයා එවාපු කාඩ් එකත් හම්බුණා..."

ඊළඟට ගෙවුණේ තවත් නිහඬ තත්පර කීපයකි. පේ ෆෝන් කාඩ්පත ඉවර වෙන්නට ඇත්තේ තව බොහෝ සුළු මුදලකි.

"රත්තරනෙ..."

"ම්..."

"ෆෝන් කාඩ් එක ඉවර වෙන්න යන්නෙ..."

"ඉවර වෙනකල් කතා කරමු..."

"මොනව ගැනද අප්පේ..."

"අපි දෙන්නගෙ ආදරේ ගැන..."

"ඒකනං කියල ඉවර කරන්න පුළුවන් කතාවක් නෙවෙයි සුදු..."

මම කීවෙමි. විශ්ව සැහැල්ලුවෙන් හිනැහෙනු මට ඇසිණි.

"අනේ හැමදාම... හැමදාටම... මේ සෙනෙහස... මේ ආදරේ... මා සනසයි නම්..." කියා මට සිතිණි.

"කවි..."

"ම්..."

"එහෙනං දැං පරිස්සමට ගෙදර යන්න... මං රෑ කෑමට එනවා... මතකනෙ... මං ආසම දේ..."

"කැරමල් පුඩිං..."

"හරියට හරි..."

"මං රසට හදල තියන්නං... ඔයා එන්න..."

"එනවා... එනවා... එනවාමයි..."

"එහෙනං මං තියන්නං සුදූ... බුදු සරණයි..."

"ඔයාටත්..."

විශ්ව හෙමිහිට කීවේය. මගේ හිත පිරිණි. ඔහු ළඟ දැවටී ඔහු පපුතුරට හිස තියාගෙන ඇස් පියාගෙන මට මුමුණන්නට බොහෝ දේ තියේ. ඔහු හිස පිරිමදිද්දී හෙමීට මගේ නළල සිප ගනිද්දී ඒ ඇස් පාමුළ වැටී හඬ හඬා කියන්නට දුක් ගොන්නක්ම මගේ හිතේ පෙළ ගැහෙමින් තිබේ.

මම හනිකට ගෙදර ගියෙමි. විශ්ව කැමති බොහෝ දේ උයා පිහා හමාර කළෙමි. ඊට පසු... වත්ත පහළ ලිඳ ළඟට ගොස් නා ගත්තෙමි. කාලයකට පසු... අරලියා ගහට නැග්ගෙමි. ඉස්සරම ඉස්සර... හැමදාම මා හැන්දෑව ගෙවන්නේ මේ ගහේ හෝ මෙතැන ඇති කළු ගල් තලාවේය. නිතරම අරලියා මල් කඩාගෙන මම පන්සල් යමි. අප්පච්චිද මා එක්ක පන්සල් යයි. ඒ දවස් වල මා මෙ ගසට නගිද්දී හොරෙන් බලා හිඳි විශ්ව... ෂ්... ෂ්... කියා කෑ ගසයි. මට මතක් වේ...

කළුතර බෝධිය ළඟදී මුලින්ම දුටු ඒ ඇස්... අම්මාටත්, අප්පච්චිටත් හොරෙන් මා දෙස බලා මා හිත බිය කළ ඒ ලස්සන ඇස්... දවස් ගණනාවක් පස්සෙන් විත්... නොකියා කියූ ඒ ආදරේ... මට ඒ හැමෙකක්ම සිහිවේ. හිත පිරෙන්නේ සතුටිනි. දුකක් දැනුණානම්... ඒ අම්මාත් අප්පච්චීත් මතක් වීමෙනි.

"ෂ්... ෂ්..."

මගේ කල්පනා දැහැන බිඳිණි. මම වටපිට බැලුවෙමි.

"ෂ්... ෂ්..."

නැවතත් ඒ හඬය. නිසැකයෙන්ම ඔය නම් මගේ විශ්වය. මම අරලියා ගසින් බිමට පැන ඔහු සොයන්නට වුණෙමි.

පිටුපසින් පැමිණි කවුදෝ මගේ දෑස වැසුවේ ඒ වෙලාවේය. බියක් දැනුණේ නැත. හිත තිගැස්සුණේ නැත.

"විශ්ව..."

මම හෙමීට මිමිණුවෙමි. මා දෑස වසා තිබූ අත් ඉවතට ගත් විශ්ව මහ හයියෙ යන් හිනැහිණි.

"පිස්සා..."

"පිස්සි..."

"මෝඩයා..."

"මෝඩි..."

මම හිනැහෙමි. ඔහු අනන්ත දයාවක් ඇස්වල රන්දාගෙන මා දෙස බලා හිඳී.

"ඉව්වද මට රෑට කන්න..."

මම හිස සෙලෙව්වෙමි. විශ්ව මා අතින් අල්වාගත්තේය. මම ඔහු උරහිසකට හිස තියාගත්තෙමි. මට මෘදු සුවඳක් දැනේ.

"සුවඳයි..."

මම කියමි. ඔහු මා උරහිස වටා අතක් යවා මා තුරුළු කරගනී. මම හමන මඳ සුළඟටත් හිනැහෙමි. හිත එතරම්ම සැහැල්ලුය.

"ගෙට යං..."

අප ගෙට එද්දී ඉස්තෝප්පුවේ උන් නිට්ටඹුවේ නැන්දා වෙනතක් බලා ගත්තාය. මනීෂා නම් පෙනෙන්නට නොවිණි. මා කාමරයට ඇදගෙන ගිය විශ්ව සාක්කුවෙන් කුඩා බෑගයක් අතට ගත්තේය. ඊට පසු... එය විවෘත කළේය. එතුළ වූයේ රත්තරන් මාලයකි. පුංචිම පුංචි යතුරක හැඩැති පෙන්ඩන්ට් එකක්ද ඒ සමඟ විණි.

"ලස්සනයි..."

මට කියැවිණි. විශ්වගේ ඇස් සතුටින් දිලිසිණි. ඔහු එය මගේ ගෙළෙහි පළඳා බොහෝ වේලාවක් යනතුරු හැඩ බැලුවේය. මෘදුව මගේ නළල සිප ගත්තේය. මට ඉකිගැසී හැඩිණි.

"කවී..."

විශ්ව මා තුරුළු කොට ගත්තේය.

"අඬන්නෙපා මයෙ මැණික... තව හුඟාක් කල් ඉන්නෑනෙ ඔයා මෙහෙම..."

"දුකට නෙවේ විශ්ව... සතුටට ඇඬුණේ..."

"පිස්සි..."

ඔහු මගේ හිසකේ අවුල් කළේය. දෙකම්මුල් රතුවෙනතුරු සිඹ ගත්තේය. මම හුඟක්... මහ හුඟක් හිනැහුණෙමි.

"කවි..."

මම සිනාව නවත්වාගෙන ඔහු දෙසට හැරුණෙමි.

"බඩගිනියි මට..."

"අනේ සොරි විශ්ව... ඔයාත්තෙක්ක හිනාවෙවී ඉඳිද්දි මට හැමදෙයක්ම අමතක වුණා..."

මා කීවේ විශ්වවත් අතින් අල්වාගෙන උන් තැනින් නැඟිටින ගමන්ය. කෑම කාමරයට ගිය මම ඔහුට බත් බෙදා දුන්නෙමි. ඔහු හුඟක්ම ආසාවෙන් මා උයා දුන් කෑම කෑවේය. මට හිනා යන කතා කිව්වේය. මම මොනවත්ම නොකියා ඒ දඟ ඇස් දෙස බලා ඉමි. ඒවා දිලිසෙයි.

"මං අද රෑ මෙහෙ ඉන්නවා..."

විශ්ව කීවේය. මම ඔහුට ඉස්තෝප්පු කාමරය ලෑස්ති කළෙමි. රෑ වෙනතුරු... බොහෝ රෑ වෙනතුරු... අපි අපේ අනාගතය ගැන කතා කරමින් උන්නෙමු.

"දැන් නිදාගන්න... හෙට උදේ වැඩට යන්නත් එපායැ..."

මම ඔහුට කීවෙමි. විශ්ව හිස සලා හා කීවේ එතරම් කැමැත්තකින් නොවේ. ඒත්, වෙන මොනවා කරන්නද? තවම මට රැයක් පුරා ඔහු ළඟටම ඉන්න අවසර නොවේ.

"ගුඩ් නයිට්..."

ඔහු කීවේය. මම පාත්වී ඔහු දෙපා වැන්දෙමි. විශ්ව එක්වරක් මා හිස සිඹ ඊට පසු... ඇඳට නැඟී නිදාගත්තේය. මම පොරෝනය ගෙන එයින් ඔහුගේ දෙපා සිට දෙඋර තෙක් වසා මෘදුව ඔහු හිස පිරිමැද්දෙමි. විශ්ව ඇස් පියාගත්තේය. මම නැඟිට මගේ කාමරයට ආවෙමි.

ඇඳට වැටුණද නින්ද නම් මා අසලකවත් නොවිණි. එළියේ හෙමීට වැහි බිඳු ඇද වැටෙන හඬ ඇසේ. නිට්ටඹුවේ නැන්දා හයියෙන් කහින හඬද ඒ අතරින් ඇසේ. මම ඇස් තදකොට පියා ගත්තෙමි.

තත්පර ගණනාවක් නොවේ. විනාඩි ගණනාවක් නොවේ.. පැයකටත් වැඩි කාලයක් ගෙවෙන්නට ඇත. වැස්ස නැවතී තිබිණි. හාත්පස නිහඬය. ඒත්... ඉස්තෝප්පු කාමරය දෙසින් එක්වරම ඇසුණේ මොක්කාද් බිම වැටෙන හඬකි. මට බියක් දැනිණි. විශ්ව ඉන්නේ ඉස්තෝප්පු කාමරයේය. ඔහුට කරදරයක්වත්ද? මම හනිකට නැඟිට්ටෙමි. කළුවරේම කෑම කාමරයට ගොස් මේසය උඩ තිබුණු පිහිය අතට ගත්තෙමි. මා ඉස්තෝප්පුවට ගියේද කළුවරේමය. විශ්වගේ කාමරයේ දොර ඇර දමා තිබිණි. මගේ බිය වැඩි විණි.

මම හෙමීට ඉස්තෝප්පු කාමරයේ දොරකඩින් එබුණෙමි. විශ්වාස කරන්න... ජීවිතේ කිසිදාක... කිසිම ආදරවන්තියක නොදැකිය යුතු දසුනක් මම දැක්කෙමි. එළියේ වූ විදුලි පහනකින් පෙරී ආ එළියෙන් මම හොඳටෝම දැක්කෙමි. මගේ... විශ්ව... ඔහු මනීෂා තුරුළු කොටගෙන නිදා උන්නේය. මට... මොනවා වුණාදැයි නොදනිමි. ඔවුන් ළඟට කෙසේ ගියා දැයි මම නොදනිමි. මට මතක මා අත තිබූ පිහියෙන් ඔවුන්ට ඇන්න වග පමණකි.

"කවි....තා..."

විශ්ව කෑ ගැසුවේය. මගේ හිතට ගිනි ඇවිලිණි. මම විශ්ව බදාගත්තෙමි. මනීෂා පැන දිව්වාය. කාමරයේ විදුලි පහන දැල්වූයේ නිට්ටඹුවේ නැන්දාය.

"ක...වි..."

විශ්ව මොනවාදෝ කියන්නට හදයි. ඔහුගේ පපුවේ විතරක් නොවේ, බෙල්ලේද කැපුණු තුවාලය.

"ම...ට ස...මාවෙන්න... කවි..."

ඔහුගේ හිස පැත්තකට කඩා වැටිණි. මම හයියෙන්... මහ හයියෙන් කෑ ගැසුවෙමි. ඔහු ඇස් ඇරියේ නැත. මම ඔහු එතැන දමා නැගිට්ටෙමි. කළුවරේම මිදුලට බැස්සෙමි. වත්ත පහළට ගියෙමි. ලොකු අරලියා ගහ ළඟට වී හොඳටෝම ඇඬුවෙමි. ඊට පසු... මහ හයියෙන් සිනාසුණෙමි. අම්මා... අප්පච්චි... විශ්ව... ඔවුන් මට අඬගසයි. මම යමි. ඔවුන් ළඟටම යමි.

**නිමි.**

අඳුරු පඬුපාට නුබ ගැබේ
හිරුත් මළගම් ගිහින්
එකම එක තරුවකට මං ලකුණු කියනවා
හිතන්නට හිතක් නැති පතන්නට පැතුම් නැති
අඳුරු මගෙ ලෝකයත් ඒ වගේ
පරවෙච්ච මල් වඩම් ගොක් රැන් මිනී මල්
මගෙ තනිය මකනවා...
මා ළඟම මේ දැනුත් නිසල වී නිහඬ වී
මිහි ගැබට තුරුළු වී නුඹ සුවෙන් නිදනවා...
අතීතය මතක් වී හිත රිදුම් දෙවද්දී
මා දෑස වසනවා
කඳුළු පොකුරක සිහිල කම්මුලට දැනෙනවා
ආයෙමත් හෙට උදේ හිරු එබෙන වෙලාවට
අනන්තෙට ඉගිල ගිය නුඹ එනැයි සිතෙනවා
ඉතිං ඒ එනතුරා හැමදාම මේ වගේ
නුඹ වැලලු මිනීවල ළඟට වී රෑ දවල් ගෙවෙනවා
පැතුම් පොදි ගැහෙනවා
මගෙ හිතට සුසුම් බර දැනෙනවා...